Instructor	ජෝන්,අර මහත්තයාට කියන්න දොර වහන්න කියලා.	John, tell that gentleman to close the door.
John (to another student)	ජිම්, දොර වහන්න.	Please close the door Jim.
Instructor (to John)	ජිම් කරන එකට සිංහලෙන් කියන්නේ මොකද්ද?	What do you say in Sinhala for what Jim is doing?
John	දොර වහනවා.	He is closing the door.



PILGRIMS AT ADAM'S PEAK

CYCLE 8

WHAT IS YOUR NAME?

M-1

මගේ නම බාබරා ස්මිත්.	My name is Barbara Smith.
මගේ නම එම්. ජී. සෙනෙවිරත්න.	My name is M.G. Seneviratne.
මගේ නම යූ. ජී. ද සිල්වා.	My name is U.G. DeSilva
මගේ නම ලොකු බන්ඩා.	My name is Loku Banda.

M-2

මහත්තයාගේ නම මොකද්ද?	What is your name, sir?
නෝනා මහත්තයාගේ නම මොකද්ද?	What is your name, madam?

C-1

The instructor should ask the questions in M-2 of every student in the class. Then, each student should have the opportunity to ask the names of others in the classroom.

A. මහත්තයාගේ නම මොකද්ද?

B. මගේ නම (එම්. ජී. සෙනෙවිරත්න)

NOTE ON STRUCTURE: genitive case forms.

In the sentences in M-1 and M-2 there are a number of genitive case forms showing possession. They are:

direct case form		genitive case form
මම	I	මගේ
නෝනා මහත්තයා	madam	නෝනා මහත්තයාගේ
මහත්තයා	sir	මහත්තයාගේ

The genitive case is discussed in Sinhala Structures, section 1.33.

TERMS OF ADDRESS

As a term of address the English word *you* is virtually all purpose. It is appropriate in all contexts, whatever the relationship between the speaker and the addressee. Except in very formal contexts, i.e., butler to employer: *Would madam prefer to have tea outside today?*, other terms of address do not substitute for *you* in American English. *Would you please tell me..* could precede a question to anyone -- a taxi driver, a shopkeeper or an important government official.

There is no single word in Sinhala which is an appropriate translation of the English *you* in all contexts. There are indeed a number of second person pronouns, but no one of them can be used in addressing everyone. They include:

තෝ	A very familiar term for *you* used largely in informal interaction within the family. Definitely not appropriate for all familial contexts. Considered extremely insulting in many situations.
උඹ	A term of address which may be heard between intimates (brothers, sisters, for example) or which may be used by a superior when addressing an inferior. Considered rude in many contexts.
තමුසේ	Said to be a term of address between equals.
ඔයා	Perhaps the most neutral choice for a second person pronoun.

Actually, more often than not, Sinhala speakers avoid choosing a second person pronoun. For example, they may omit the subject of the sentence entirely:

යනවා ද?	Going?
	instead of
ඔයා යනවා ද?	Are you going?

Or they may choose a third person subject:

මහත්තයා යනවා ද?	Are (you) going, sir?
	instead of
ඔයා යනවා ද?	Are you going?

General guidelines for choosing a term of address

1. Appropriate terms of address for equals and superiors.

In establishing relationships with persons of equal or superior status, avoid pronominal terms entirely. When it is necessary to address someone, use නෝනා මහත්තයා, 'madam', or මහත්තයා, 'sir'. The following people are equals or superiors:

a. Counterparts and other professionals in the Sri Lanka government. For example, government agents, research officers, health inspectors and heads of government offices.

b. Individuals who have established themselves in positions of authority or rank in their own communities. For example, postmasters, schoolmasters, ayurvedic physicians and grama sewakas.

c. Administrators or managers in banks, large shops such as Cargills, hotels and airline offices.

d. Teachers and administrators in the universities.

e. Lawyers, doctors and other professionals in the private sector.

f. Adult kinsmen of the above.

People who are referred to as මහත්තයා or නෝනා මහත්තයා are often particularized by a prefix. For example:

වෙදමහත්තයා	the ayurvedic physician
ස්මිත් මහත්තයා	Mr. Smith
තැපැල් මහත්තයා	the postmaster
ඉස්කෝලේ මහත්තයා	the schoolmaster

Students will notice as they listen to Sinhala spoken around them that the terms *sir*, *madam*, and *missy* have been borrowed from English. The term *sir* is used more widely than the other two. It is a substitute for මහත්තයා.

2. Addressing individuals who are lower in status.

The most diplomatic way of addressing someone who is lower in status is to use the proper name. For example:

බණ්ඩා කොහේ ද යන්නේ? Where are you going, Banda?

Household servants, waiters, drivers, porters and others engaged in providing personal services are often addressed in this manner.

Proprietors of boutiques may be addressed in this manner or by the term මුදලාලි, 'merchant'.

STREET HAWKERS, KANDY

(Ask the instructor how he or she would address these people.)

3. Addressing members of the sangha.

Buddhist monks are generally addressed as ස්වාමීන් වහන්සේ.



A BUDDHIST MONK AND DEVOTEES

CYCLE 9

WHAT IS HIS/HER NAME?

M-1

අර මහත්තයාගේ නම රොබට් ජෝන්ස්.	The name of that gentleman over there is Robert Jones.
අර නෝනා මහත්තයාගේ නම මේරි ස්මිත්.	The name of that lady over there is Mary Smith.
මේ මහත්තයාගේ නම වෝල්ටර් හේරත්.	The name of this gentleman is Walter Herath.
අර නෝනා මහත්තයාගේ නම ඔලිවියා සිල්වා.	The name of that lady is Olivia Silva.

M-2

අර මහත්තයාගේ නම මොකද්ද?	What is the name of that gentleman over there?
අර නෝනා මහත්තයාගේ නම මොකද්ද?	What is the name of that lady over there?
මේ නෝනා මහත්තයාගේ නම මොකද්ද?	What is the name of this lady?
මේ මහත්තයාගේ නම මොකද්ද?	What is the name of this gentleman?

C-1

Students A and B should discuss the names of the others in the class. Each student in the class should have an opportunity to carry on such a discussion.

A. අර මහත්තයාගේ නම මොකද්ද?

B. අර මහත්තයාගේ නම (ජෝන් ජෝන්ස්).

C-2

Look at the pictures of the people below. Student A should ask an appropriate question from M-2 of another member of the class. Student B should supply the correct answer. Each student should have an opportunity to carry on such a discussion.

A. (pointing to picture): අර මහත්තයාගේ නම මොකද්ද?

B. අර මහත්තයාගේ නම (ජේ. ආර්. ජයවර්ධන).



CYCLE 10

WHAT ARE THE NAMES OF THESE PEOPLE?

M-1

මේ ස්මිත් මහත්තයා.	This is Mr. Smith.
මේ ජෝන්ස් මහත්තයා.	This is Mr. Jones.
මේ ස්මිත් මහත්තයයි එයාගේ නෝනයි.	This is Mr. Smith and his wife.

M-2

මේ මහත්තුරු කවුද?	Who are these gentlemen?
ඒගොල්ලන්ගේ නම් මොනවා ද?	What are their names?
මේ නෝනා මහත්තුරුන්ගේ නම් මොනවා ද?	What are the names of these ladies?
මේගොල්ලන්ගේ නම් මොනවා ද?	What are the names of these people?

C-1

Students should ask and answer questions of the type in M-2 with other students in the class.

A. මේගොල්ලන්ගේ නම් මොනවා ද?

B. මේ (ස්මිත් මහත්තයයි එයාගේ නෝනයි)

NOTES ON STRUCTURE: the 'and' particle; genitive forms.

1. In the sentence මේ ස්මිත් මහත්තයායි එයාගේ නෝනයි the 'and' particle has been added to මහත්තයා and නෝනා. Further discussion of the 'and' particle appears in Sinhala Structures, section 5.3.

2. The following genitive plural forms of animate nouns appear above: ඒගොල්ලන්ගේ, නෝනා මහත්තුරුන්ගේ and මේගොල්ලන්ගේ.
A discussion of the formation of these forms appears in Sinhala Structures, section 1.3322.

C-3

Students should bring pictures of other people to class. These may be pictures of well-known people or of relatives and friends of class members. Students should ask each other who the people in the pictures are. A sample picture appears above.

CYCLE 11

IS HIS NAME DE SILVA?

M-1

ඔව්. ගුරුවරයාගේ නම කේ. ජී. ද සිල්වා.	Yes. The name of the teacher (male) is K.G. DeSilva.
ඔව්. මහත්තයාගේ නම ගුණරත්න.	Yes. The gentleman's name is Gunaratne.
ඔව්. ගුරුවරියගේ නම ශ්‍රියානි හේරත්.	Yes. The name of the teacher (female) is Sriyani Herath.

M-2

නෑ. නෝනා මහත්තයාගේ නම ඔලිවියා සිල්වා නෙමෙයි.	No. The lady's name is not Olivia Silva.
නෑ. මහත්තයාගේ නම සේරම් නෙමෙයි.	No. The gentleman's name is not Saram.
නෑ. නෝනා මහත්තයාගේ නම කුමාරි දිසානායක නෙමෙයි.	No. The lady's name is not Kumari Dissanayake.

M-3

මහත්තයාගේ නම දිසානායක ද?	Is the gentleman's name Dissanayake?
මගේ නම ගුණවර්ධන ද?	Is my name Gunawardena?
එයාගේ නම කුමාරි දිසානායක ද?	Is her name Kumari Dissanayake?

C-1

Students should use the information they have gathered about other class members to ask and answer questions of the type in M-3.

A. මහත්තයාගේ නම (දිසානායක ද?)

B. ඔව්. මහත්තයාගේ නම (දිසානායක).

or නෑ. මහත්තයාගේ නම (දිසානායක) නෙමෙයි.

NOTE ON STRUCTURE: නෙමෙයි , 'is not'.

In Sinhala equational sentences (i.e., My name is Silva, This is a door, It is mine, The dress is green, etc.) lack main verbs. Such sentences are negated by adding නෙමෙයි , 'is not, are not', after the predicate as in M-2 above.

CYCLE 12

WHOSE GOODS ARE THESE?

M-1	මේ ලියකියවිලි නෝනා මහත්තයාගේ.	These documents are the lady's.
	මේ බඩු මගේ.	These goods are mine.
	මේ ලටපට මගේ.	This junk is mine.
	මේ සල්ලි මගේ.	This money is mine.
	අර පොත් ජෝන්ස් මහත්තයාගේ.	Those books are Mr. Jones'.
M-2		
	මේ ලටපට කාගේ ද?	Whose junk is this?
	මේ කාසි කාගේ ද?	Whose coins are these?
	මේ කන්නාඩි කාගේ ද?	Whose glasses are these?

C-1

Each student should point to various items around the room to find out who the owner is. If students do not know the Sinhala words for various objects around the room, they should use the Sinhala they know to find out.

A. මේ (ලටපට) කාගේ ද?

B. මේ (ලටපට මගේ)

CYCLE 13

ARE THESE THINGS YOURS?

M-1

ඔව්. මේවා මගේ.	Yes. These things are mine.
ඔව්. මේ කන්නාඩි මගේ.	Yes. These glasses are mine.
ඔව්. මේවා නෝනා මහත්තයාගේ.	Yes. These things are the lady's.
ඔව්. මේ යතුරු මහත්තයාගේ.	Yes. These keys are the gentleman's.

M-2

නෑ. මේ යතුරු මගේ නෙමෙයි.	No. These keys are not mine.
නෑ. මේවා නෝනා මහත්තයාගේ නෙමෙයි.	No. These things are not the lady's.
නෑ. මේ බිල්පත් මහත්තයාගේ නෙමෙයි.	No. These receipts are not the gentleman's.

M-3

මේ බිල්පත් නෝනා මහත්තයාගේ ද?	Are these receipts the lady's?
මේවා මහත්තයාගේ ද?	Are these things yours, sir?
මේවා මගේ ද?	Are these things mine?

C-1

Using the formula given in M-3, student A should try to determine the ownership of various items in the classroom. Other students should answer the questions of student A using the formulas given in M-1 and M-2. Each student should have an opportunity to ask the questions.

A. (මේ බිල්පත් මහත්තයාගේ ද?)

B. (ඔව්. මේ බිල්පත් මගේ)

CYCLE 14

WHAT COLOR IS IT?

M-1

මේ පොත කලු පාටයි. (කලුයි)	This book is black.
මහත්තයාගේ ෂර්ට් එක සුදු පාටයි.(සුදුයි)	The gentleman's shirt is white.
බිත්තිය කොල පාටයි.	The wall is green.
පැන්සලය කහ පාටයි.	The pencil is yellow.
මේක රතු පාටයි. (රතුයි)	This thing is red.

M-2

මේ ෂර්ට් එක මොන පාට ද?	What color is this shirt?
මේ පැන්සලය මොන පාට ද?	What color is this pencil?
මේ පොත මොන පාට ද?	What color is this book?
නෝනා මහත්තයාගේ සාරිය මොන පාට ද?	What color is the lady's sari?

C-1

Talking about various objects around the room .....

A. (මේ පොත්) මොන පාට ද?

B. (රතු පාටයි)

NOTE ON STRUCTURE: the emphasizing particle යි.

In equational sentences (the type x is y) adjectives which end in a vowel which fill the "y" slot are followed by an emphasizing particle යි . Some nouns in this slot which end in a vowel are also followed by යි . පාට , 'color', above is an example. This particle has no direct translation. It appears in sentence final position. It does not appear before the question marker ද .

TALKING ABOUT MONEY

For the next several lessons, the class will need 10 pennies, and a few nickels, dimes, quarters and 50 cent pieces. There are 100 cents in the Sri Lanka rupee coined in the following denominations: 1, 2, 5, 10, 25 and 50.

CYCLE 15

DO YOU HAVE MONEY ON YOU?

M-1

ඔව්. මා ළඟ ලයිසන් එකක් තියෙනවා.	Yes. I have a license on me.
ඔව්. මා ළඟ සල්ලි ටිකක් තියෙනවා.	Yes. I have a little money on me.
මා ළඟ සල්ලි හුඟක් තියෙනවා.	I have a lot of money on me.
මා ළඟ පෑනක් තියෙනවා.	I have a pen on me.
මා ළඟ පොතක් තියෙනවා.	I have a book with me.

M-2

මා ළඟ පොතක් නෑ.	I don't have a book with me.
මා ළඟ ලයිසන් එකක් නෑ.	I don't have a license on me.
මා ළඟ සල්ලි නෑ.	I don't have money on me.

M-3

මහත්තයා ළඟ සල්ලි තියෙනවා ද?	Do you have money on you, sir?
නෝනා මහත්තයා ළඟ පෑනක් තියෙනවා ද?	Do you have a pen with you, madam?
මහත්තයා ළඟ සිංහල පොතක් තියෙනවා ද?	Do you have a Sinhala book with you, sir?
කා ළඟද සල්ලි තියෙන්නේ?	Who is it who has money on him?

C-1

Students should use the formulas given above to discuss the belongings of others in the classroom.

A. කා ළඟද සල්ලි තියෙන්නේ?

B. (මහත්තයා) ළඟ.

C-2

A. (මහත්තයා) ළඟ සිංහල පොතක් තියෙනවා ද?

B. (මා ළඟ සිංහල පොතක් තියෙනවා)

NOTES ON STRUCTURE

1. Postpositions

The word ළඟ is a postposition meaning 'on' or 'near'. Postpositions in Sinhala are functionally similar to English prepositions, except that while English prepositions occur before the word they govern, Sinhala postpositions occur following the word. Postpositions occur in construction with nouns, verbs and other parts of speech. When in construction with nouns, they govern specific cases. Most postpositions, like ළඟ , govern the direct case. Two irregular pronominal forms occur with ළඟ : මා, 'me' and කා 'who'. Examples:

ගොවියා ළඟ	On, near the farmer
මහත්තයා ළඟ	On, near the gentleman
මා ළඟ	Near me
කොළඹ ළඟ	Near Colombo.

2. The verb තියෙනවා, 'be'.

This verb occurs with inanimate subjects and means 'be'. For example:

පොත් තියෙනවා.	There are books.
පොතක් තියෙනවා.	There is a book.
මා ළඟ සල්ලි තියෙනවා.	There is money on/near me. (i.e., I have money on me.)

The negative of තියෙනවා is නෑ. For example:

පොත් නෑ.	There are no books.
මා ළඟ සල්ලි නෑ.	I have no money on me.

The verb තියෙනවා does not occur with animate subjects. See Sinhala Structures, section 1.51.

CYCLE 16

HOW MANY CENTS ARE ON THE TABLE?

M-1

මේසය උඩ සත දෙකක් තියෙනවා.	There's 2 cents on the table.
මේසය උඩ සත දහයක් තියෙනවා.	There's 10 cents on the table.
මෙතන සත පනහක් තියෙනවා.	There's 50 cents in this spot here.
මා ලඟ සත තුනත් තියෙනවා.	There's 3 cents with me.

M-2

මේසය උඩ සත කීයක් තියෙනවා ද?	How many cents on the table?
පොත උඩ සත කීයක් තියෙනවා ද?	How many cents on the book?
මෙතන සත කීයක් තියෙනවා ද?	How many cents in this spot here.

C-1

Using the formulas given above, students should talk about the money being used for classroom purposes.

A. (මේසය උඩ) සත කීයක් තියෙනවා ද?

B. (මේසය උඩ) සත පනහක් තියෙනවා.

NOTE ON STRUCTURE: postpositions

The word උඩ is a postposition meaning 'on' or 'on top of'. It occurs after nouns in the direct case.

CYCLE 17

GIVE ME A 50¢ PIECE

M-1

මෙන්න සත දෙකේ කාසියක්.	Here is a 2¢ piece.
මෙන්න සත පහේ කාසියක්.	Here is a 5¢ piece.
මෙන්න සත පනහේ කාසියක්.	Here is a 50¢ piece.
මෙන්න සත විසි පහේ කාසියක්.	Here is a 25¢ piece.
මෙන්න සත දහයේ කාසියක්.	Here is a 10¢ piece.
මෙන්න කාසියක්.	Here is a coin.

M-2

මට සත පනහේ කාසියක් දෙන්න.	Give me a 50¢ piece.
මට සත විසි පහේ කාසියක් දෙන්න.	Give me a 25¢ piece.
මට සත පහේ කාසි දෙකක් දෙන්න.	Give me two 5¢ pieces.
මට සත පහේ කාසි තුනක් දෙන්න.	Give me three 5¢ pieces.

C-1

Using the formulas given above, students should exchange the money being used for classroom purposes.

A. මට (සත දෙකේ)කාසියක් දෙන්න.

B. මෙන්න (සත දෙකේ) කාසියක්.

NOTES ON STRUCTURE: genitive forms; මෙන්න, 'here'.

1. Numerals such as පහේ above are in the genitive case.
2. මෙන්න is a word which means 'here' in the sense of the French 'voici'. It is used when handing something to someone.

SNAKE CHARMERS

CYCLE 18

HOW MANY 5 CENT PIECES DO YOU HAVE ON YOU?

M-1

මා ළඟ සත විසි පහේ කාසියක් තියෙනවා.	I have a 25¢ piece on me.
මා ළඟ සත පහේ කාසි දෙකක් තියෙනවා.	I have two five cent pieces on me.
සතේ කාසි හතරක් තියෙනවා.	There are four pennies.
සත දෙකේ කාසියක් තියෙනවා.	There is a 2¢ coin.
සත පනහේ කාසි තුනක් තියෙනවා.	There are three 50¢ pieces.

N-2

මහත්තයා ළඟ සතේ කාසියක් තියෙනවා ද?	Do you have a penny on you, sir?
මහත්තයා ළඟ සතේ කාසි කීයක් තියෙනවා ද?	How many pennies do you have on you, sir?
මහත්තයා ළඟ සත දහයේ කාසි කීයක් තියෙනවා ද?	How many 10¢ pieces do you have on you, sir?
මහත්තයා ළඟ සත විසි පහේ කාසි කීයක් තියෙනවා ද?	How many 25¢ pieces do you have on you, sir?

C-1

මහත්තයා ළඟ (සත විසි පහේ කාසි) කීයක් තියෙනවා ද?

(තුනක්) තියෙනවා.

DIALOGUE IV: IN THE CONSULAR SECTION

MR. CARSON DIAL	
මෙන්න මහත්තයාගේ පාස්පෝට් එකයි ලියකියවිලියි.	Here is your passport and your documents.
MR. JOHN PERERA	
මේ ලියකියවිලිවලින් සමහරක් මගේ නෙමෙයි.	Some of these documents are not mine.
MR. DIAL	
මහත්තයාගේ ලියකියවිලි මොනවා ද?	Which are your documents, sir?
MR. PERERA	
මේ ලියකියවිලි මගේ. නමුත් මේ පාර්සලේ අයිති බ්‍රවුන් කියලා මහත්තයෙකුට.	These documents are mine. But this parcel belongs to a gentleman called Brown.
MR. DIAL	
මේ ලොකු එක මහත්තයාගේ ද? බ්‍රවුන් මහත්තයාගේ ද?	Is this big one yours or Mr. Brown's?
MR. PERERA	
ලොකු එක මගේ.	The big one is mine.
MR. DIAL	
මම අනිත් පාර්සලේ බ්‍රවුන් මහත්තයාට දෙන්නම්.	I'll give the other parcel to Mr. Brown.
MR. PERERA	
හොඳයි. ඒක එයාට දෙන්න. මම ගිහින් එන්නම්.	Good. Give it to him. I'll go and come.

NOTES ON STRUCTURE: inflected noun forms.

The dialogue above should serve as a review for previously introduced structures. Some new structures are reviewed in the drills on the following pages. They include definite and indefinite dative case forms of animate nouns: මහත්තයාට , 'to the gentleman', and මහත්තයෙකුට , 'to a gentleman', (see Sinhala Structures, 1.322) and the instrumental plural of inanimates: ලියකියවිලිවලින් , 'from documents', (see Sinhala Structures, 1.3423).

SUMMARY

PRACTICING PATTERNS FROM DIALOGUE IV

A. Substitution Drill

Model:	T	මේ බඩුවලින් සමහරක් මගේ.	Some of these goods are mine.
	S	මේ බඩුවලින් සමහරක් මගේ.	Some of these goods are mine.
	T	ලියකියවිලි	Documents
	S	මේ ලියකියවිලිවලින් සමහරක් මගේ.	Some of these documents are mine.

1 මේ බඩුවලින් සමහරක් මගේ. (ලියකියවිලි) documents

2 මේ ලියකියවිලිවලින් සමහරක් මගේ. (ඇඳුම්) clothes

3 මේ ඇඳුම්වලින් සමහරක් මගේ. (ෂර්ට්) shirts

4 මේ ෂර්ට්වලින් සමහරක් මගේ. (පාර්සල්) parcels

5 මේ පාර්සල්වලින් සමහරක් මගේ. (පැකට්) packets

6 මේ පැකට්වලින් සමහරක් මගේ.

B. Substitution Drill

Model:	T	සමහර ලියකියවිලි මගේ නෙමෙයි.	Some documents are not mine.
	S	සමහර ලියකියවිලි මගේ නෙමෙයි.	Some documents are not mine.
	T	පොත්	Books.
	S	සමහර පොත් මගේ නෙමෙයි.	Some books are not mine.

1 සමහර ලියකියවිලි මගේ නෙමෙයි. (පොත්) books

2 සමහර පොත් මගේ නෙමෙයි. (පැන්සල්) pencils

3 සමහර පැන්සල් මගේ නෙමෙයි. (පෝස්කාට්) postcards

4 සමහර පෝස්කාට් මගේ නෙමෙයි. (යතුරු) keys

5 සමහර යතුරු අපේ නෙමෙයි. (ලියුම්) letters

6 සමහර ලියුම් අපේ නෙමෙයි.

C. Substitution Drill

Model: I මේ පොත්වලින් සමහරක් මගේ. Some of these books are mine.

S මේ පොත්වලින් සමහරක් මගේ, Some of these books are mine.

I දෙකක්. Two

S මේ පොත්වලින් දෙකක් මගේ. Two of these books are mine.

1 මේ පොත්වලින් සමහරක් මගේ . (දෙකක්) [two]

2 මේ පොත්වලින් දෙකක් මගේ. (ඔක්කොම) [all]

3 මේ පොත්වලින් ඔක්කොම මගේ. (තුනක්) [three]

4 මේ පොත් වලින් තුනක් මගේ. (පහක්) [five]

5 මේ පොත්වලින් පහක් මගේ. (කීපයක්) [some]

6 මේ පොත්වලින් කීපයක් මගේ.

D. Substitution Drill

Model: I මේ ලොකු එක මගේ. This big one is mine.

S මේ ලොකු එක මගේ. This big one is mine.

I හොඳ. Good.

S මේ හොඳ එක මගේ. This good one is mine.

1 මේ ලොකු එක මගේ. (හොඳ) [good]

2 මේ හොඳ එක මගේ. (රතු පාට) [red]

3 මේ රතු පාට එක මගේ. (කලු පාට) [black]

4 මේ කලු පාට එක මගේ. (කහ පාට) [yellow, saffron color]

5 මේ කහ පාට එක මගේ. (පොඩි) [little]

6 මේ පොඩි එක මගේ.

E. Response Drill

Model: I මේ පොත් කාගේ ද? — Whose books are these?

S මේ පොත් අයිති මට. — These books belong to me.

1 මේ පොත් කාගේ ද?	මේ පොත් අයිති මට.
Whose books are these?	These books belong to me.
2 මේ පොත් කාගේ ද?	මේ පොත් අයිති තැපැල් මහත්තයාට.
Whose books are these?	These books belong to the postmaster.
3 මේ පොත් කාගේ ද?	මේ පොත් අයිති ගුණරත්න මහත්තයාට.
Whose books are these?	These books belong to Mr. Gunaratne.
4 මේ පොත් කාගේ ද?	මේ පොත් අයිති බ්‍රවුන් මහත්තයාට.
Whose books are these?	These books belong to Mr. Brown.
5 මේ පොත් කාගේ ද?	මේ පොත් අයිති අර නෝනා මහත්තයාට.
Whose books are these?	These books belong to the lady.
6 මේ පොත් කාගේ ද?	මේ පොත් අයිති එයාට.
Whose books are these?	These books belong to him.

F. Transformation Drill

Model I මේ පොත් අයිති බ්‍රවුන් මහත්තයාට. — These books belong to Mr. Brown.

S මේ පොත් අයිති බ්‍රවුන් කියලා මහත්තයෙකුට. — These books belong to a gentleman called Brown.

1 මේ පොත් අයිති බ්‍රවුන් මහත්තයාට.	මේ පොත් අයිති බ්‍රවුන් කියලා මහත්තයෙකුට.
These books belong to Mr. Brown.	...to a gentleman called Brown.
2 මේ පොත් අයිති ගුණරත්න මහත්තයාට.	මේ පොත් අයිති ගුණරත්න කියලා මහත්තයෙකුට.
.....to Mr. Gunaratne	...to a gentleman called Gunaratne.
3 මේ පොත් අයිති සෙනෙවිරත්න මහත්තයාට	මේ පොත් අයිති සෙනෙවිරත්න කියලා මහත්තයෙකුට.
.....to Mr. Seneviratne.	...to a gentleman called Seneviratne.
4 මේ පොත් අයිති ද සිල්වා මහත්තයාට.	මේ පොත් අයිති ද සිල්වා කියලා මහත්තයෙකුට.
.....to Mr. de Silva.	...to a gentleman called de Silva.
5 මේ පොත් අයිති ස්මිත් මහත්තයාට.	මේ පොත් අයිති ස්මිත් කියලා මහත්තයෙකුට.
.....to Mr. Smith.	...to a gentleman called Smith.
6 මේ පොත් අයිති හේරත් මහත්තයාට.	මේ පොත් අයිති හේරත් කියලා මහත්තයෙකුට.

G. Transformation Drill

Model:		
I	මේ පාස්පෝට් එක මහත්තයාගේ.	This passport is yours, sir.
	මේ පාස්පෝට් එක බ්‍රවුන් මහත්තයාගේ.	This passport is Mr. Brown's.
S	මේ පාස්පෝට් එක මහත්තයාගේ ද බ්‍රවුන් මහත්තයාගේ ද?	Is this passport yours or Mr. Brown's.

1	මේ පාස්පෝට් එක මහත්තයාගේ මේ පාස්පෝට් එක බ්‍රවුන් මහත්තයාගේ.	මේ පාස්පෝට් එක මහත්තයාගේ ද බ්‍රවුන් මහත්තයාගේ ද? (yours or Mr. Brown's?)
2	මේ පාස්පෝට් එක නෝනා මහත්තයාගේ. මේ පාස්පෝට් එක මහත්තයාගේ.	මේ පාස්පෝට් එක නෝනා මහත්තයාගේ ද මහත්තයාගේ ද? (the lady's or the gentleman's?)
3	මේ පාස්පෝට් එක මගේ. මේ පාස්පොට් එක එයාගේ	මේ පාස්පෝට් එක මගේ ද එයාගේ ද? (mine or his?)
4	මේ පාස්පෝට් එක ඉස්කෝලේ මහත්තයාගේ. මේ පාස්පෝට් එක හේරත් මහත්තයාගේ.	මේ පාස්පෝට් එක ඉස්කෝලේ මහත්තයාගේ ද හේරත් මහත්තයාගේ ද? (the schoolmaster's or Mr. Herath's?)
5	මේ පාස්පෝට් එක සිල්වා මහත්තයාගේ. මේ පාස්පෝට් එක ඔයාගේ.	මේ පාස්පෝට් එක සිල්වා මහත්තයාගේ ද ඔයාගේ ද? (Mr. de Silva's or yours?)
6	මේ පාස්පෝට් එක ස්මිත් මහත්තයාගේ. මේ පාස්පෝට් එක නෝනාගේ.	මේ පාස්පෝට් එක ස්මිත් මහත්තයාගේ ද නෝනාගේ ද? (Mr. Smith's or the lady's?)

H. Response Drill

Model:		
I	මම ගිහින් එන්නම්.	I'll go and come.
S	හොඳයි. ගිහින් එන්න.	Good. Go and come.

1	මම ගිහින් එන්නම්.	[go and come]	හොඳයි. ගිහින් එන්න.
2	මම එයාට කියන්නම්.	[tell him]	හොඳයි. එයාට කියන්න.
3	මම එයාට පෑන දෙන්නම්.	[give him the pen]	හොඳයි. එයාට පෑන දෙන්න.

H. Response Drill (continued)

4	මම දොර වහන්නම්.	[close the door]	හොඳයි. දොර වහන්න.
5	මම ජනේලය අරින්නම්.	[open the window]	හොඳයි. ජනේලය අරින්න.
6	මම මහත්තයාට කතාකරන්නම්.	[speak to the gentleman]	හොඳයි. මහත්තයාට කතාකරන්න.

I Transformation Drill

Model:

I	මෙන්න මහත්තයාගේ ලියකියවිලි. මෙන්න මහත්තයාගේ පාස්පෝට්-එක.	Here are your documents. Here is your passport.
S	මෙන්න මහත්තයාගේ ලියකියවිලියි පාස්පෝට් එකයි.	Here are your documents and your passport.

1	මෙන්න මහත්තයාගේ ලියකියවිලි. මෙන්න මහත්තයාගේ පාස්පෝට්-එක.	[your documents, your passport]	මෙන්න මහත්තයාගේ ලියකියවිලියි පාස්පෝට් එකයි.
2	මෙන්න පැනක්. මෙන්න පැන්සලයක්.	[a pen, a pencil]	මෙන්න පැනකුයි පැන්සලයකුයි.
3	මෙන්න එලවලු. මෙන්න පාන් ගෙඩියක්.	[vegetables, a loaf of bread]	මෙන්න එලවලුයි පාන් ගෙඩියකුයි.
4	මෙන්න පොත්. මෙන්න බිල්පත්.	[books, receipts]	මෙන්න පොතුයි බිල්පතුයි.
5	මෙන්න කඩදාසි. මෙන්න පැන්සල්	[paper, pencils]	මෙන්න කඩදාසියි පැන්සලුයි.
6	මෙන්න සපත්තු. මෙන්න මේස්.	[shoes, socks]	මෙන්න සපත්තුයි මේසුයි.
7	මෙන්න සත පහේ කාසියක්. මෙන්න සත දහයේ කාසියක්.	[a five-cent piece, a ten-cent piece]	මෙන්න සත පහේ කාසියකුයි සත දහයේ කාසියකුයි.
8	මෙන්න සත දෙකේ කාසියක්. මෙන්න සත පහේ කාසියක්	[a two-cent piece, a five-cent piece]	මෙන්න සත දෙකේ කාසියකුයි සත පහේ කාසියකුයි.

WOMEN SELLING FISH IN THE MARKET

CYCLE 19

WHAT IS YOUR OCCUPATION?

M-1

මම අමෙරිකන් තානාපති කාර්යාලයේ වැඩ කරනවා.	I work in the American Embassy.
මම අමෙරිකන් තානාපති කාර්යාලයේ දෙවෙනි ලේකම්.	I am Second Secretary of the American Embassy.
මම අමෙරිකන් තානාපති කාර්යාලයේ තුන්වෙනි ලේකම්.	I am Third Secretary of the American Embassy.
මම අමෙරිකන් තානාපති කාර්යාලයේ සංස්කෘතික කටයුතු භාර නිලධාරියා.	I am the cultural affairs officer of the American Embassy.
මම අමෙරිකන් තානාපති කාර්යාලයේ ආර්ථික කටයුතු භාර නිලධාරියෙක්.	I am an economic officer in the American Embassy.

M-2

මහත්තයාගේ රස්සාව මොකද්ද?	What is your occupation, sir?
නෝනා මහත්තයාගේ රස්සාව මොකද්ද?	What is your occupation, madam?
මෙයාගේ රස්සාව මොකද්ද?	What is the occupation of this person?

C-1

Using the formula given in M-2, students should find out what the occupations of others in the class are. Needed vocabulary should be elicited from the instructor.

C-2

The instructor should point to one of the pictures below and ask the appropriate question from M-2. If possible, the students should supply the answer. If students cannot supply the answer, then they should repeat the question to the instructor who will supply the answer. Next, the students themselves should ask and answer the questions pertaining to the pictures.



මෙයා කැටයම් කරනවා

කුඹල් කාරියක්

බොරු කකුල් කාරයෙක්



මෙයා තේ කොළ නෙලනවා

CYCLE 20

IS IT FOR THE SRI LANKA GOVERNMENT THAT (YOU) WORK?

M-1

ඔව්. මම වැඩ කරන්නේ ලංකා ආණ්ඩුවේ.	Yes. It is for the Sri Lanka government that I work.
ඔව්. මම වැඩ කරන්නේ **කොළඹ**.	Yes. It is in Colombo that I work.
ඔව්. මම වැඩ කරන්නේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ.	Yes. It is in the Health Department that I work.

M-2

නෑ. මම වැඩ කරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නෙමෙයි.	No. It is not for the Agriculture Department that I work.
නෑ. මම වැඩ කරන්නේ අමෙරිකන් ආණ්ඩුවේ නෙමෙයි.	No. It is not for the American Government that I work.

M-3

නෝනා මහත්තයා වැඩ කරන්නේ ලංකා ආණ්ඩුවේ ද?	Is it in the Sri Lanka government that you work, madam?
මහත්තයා වැඩ කරන්නේ යාපනේ ද?	Is it in Jaffna that you work, sir?
මහත්තයා වැඩ කරන්නේ කොහේ ද?	Where do you work, sir?

C-1

Students should continue discussing the occupations of others in the classroom using the formulas given above. It would be useful for the students if other Sinhala speakers could come to class for the C-phase of this cycle.

C-1 (continued)

A. (මහත්තයා වැඩ කරන්නේ කොහේ ද?)

B. (මම වැඩ කරන්නේ යාපනේ.)

NOTE ON STRUCTURE: negating present tense forms.

කරන්නේ is an emphatic present tense form of the verb. For the use and formation of emphatic present tense forms, see Sinhala Structures, section 2.21. Sentences with emphatic verbs are negated by adding නෙමෙයි after the emphasized word. The students and the instructor should discuss and review negation of present tense forms (both simple and emphatic) at this time. Refer to Sinhala Structures, sections 2.24 and 2.25.

WHERE DO THESE PEOPLE WORK?

ADDITIONAL VOCABULARY

THE NAMES OF SRI LANKA GOVERNMENT MINISTRIES AND DEPARTMENTS

Below are the Sinhala terms for various subdivisions of the Sri Lanka government administrative system. Students should learn the Sinhala for those ministries and departments which are of interest to them.

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය.	Ministry of Local Government, Housing and Construction.
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.	Ministry of Public Administration and Home Affairs.
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.	Ministry of Plantation Industries.
සමාජ සේවා අමාත්‍යාංශය.	Ministry of Social Services.
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.	Ministry of Cultural Affairs.
ප්‍රවාහන අමාත්‍යාංශය.	Ministry of Transport.
කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය.	Ministry of Agricultural Development and Research.
ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය.	Ministry of Rural Development.
කම්කරු අමාත්‍යාංශය.	Ministry of Labour.
සෞඛ්‍ය කටයුතු අමාත්‍යාංශය.	Ministry of Health.
තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය.	Ministry of Posts and Telecommunications.
පේෂ කර්මාන්ත අමාත්‍යාංශය.	Ministry of Textile Industries.
විදේශ කටයුතු අමාත්‍යාංශය.	Ministry of Foreign Affairs.
අධිකරණ අමාත්‍යාංශය.	Ministry of Justice.
ආහාර හා සමූපකාර අමාත්‍යාංශය.	Ministry of Food and Cooperatives
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය.	Ministry of Industries and Scientific Affairs.

විදුලි බල හා මහමාර්ග අමාත්‍යාංශය.	Ministry of Power and Highways.
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.	Ministry of Finance and Planning.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.	Ministry of Lands and Land Development.
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය.	Ministry of Mahaweli Development.
පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය.	Ministry of Parliamentary Affairs and Sport.
වෙළඳ හා නාවුක අමාත්‍යාංශය.	Ministry of Trade and Shipping.
අධ්‍යාපන අමාත්‍යාංශය.	Ministry of Education.
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.	Ministry of Higher Education.
ධීවර අමාත්‍යාංශය.	Ministry of Fisheries.
ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය.	Ministry of Rural Industries Development.
යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය.	Ministry of Youth Affairs and Employment.
රාජ්‍ය අමාත්‍යාංශය.	Ministry of State.
කොළඹ මණ්ඩල රෝහල් අමාත්‍යාංශය.	Ministry of Colombo Group of Hospitals.

DEPARTMENTS

අලෙවි දෙපාර්තමේන්තුව	Marketing Department.
වාරිමාර්ග දෙපාර්තමේන්තුව	Irrigation Department.
කැලෑ දෙපාර්තමේන්තුව	Forest Department.
මිනින්දෝරු දෙපාර්තමේන්තුව	Survey Department.
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව	Land Development Department.
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව	Department of Small Industries.
වන සත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුව	Department of Wildlife Conservation.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	Department of Inland Revenue.
අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව	Department for Development of Marketing.
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	Department of Health.
කම්කරු දෙපාර්තමේන්තුව	Department of Labour.
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	Department of Information.
රේගු දෙපාර්තමේන්තුව	Department of Customs.

CYCLE 21

WHAT KIND OF WORK IS IT THAT THE GRAMA SEWAKA DOES?

M-1

ග්‍රාම සේවක කරන්නේ මොන වීදියේ වැඩ ද?	What kind of work is it that the grama sewaka does?
මහජන සෞඛ්‍ය පරීක්ෂක කරන්නේ මොන වීදියේ වැඩ ද?	What kind of work is it that the Public Health Inspector does?
උප දිසාපතිතුමා කරන්නේ මොන වීදියේ වැඩ ද?	What kind of work is it that the Assistant Government Agent does?
තැපැල් මහත්තයා කරන්නේ මොන වීදියේ වැඩ ද?	What kind of work is it that the postmaster does?
ඔයා කරන්නේ මොන වීදියේ වැඩ ද?	What kind of work do you do?

C-1

The officials named above are some of those who are likely to have administrative responsibilities for small communities. Students should single out one of these officials and ask the instructor, in Sinhala, what his duties are. The instructor should give a short description in Sinhala. It is not likely that students will know all the words which the instructor uses. Students should use Sinhala to find out what the "unknown" words mean. They should not use English. The instructor should repeat the description several times. When all students understand what the instructor is saying, one of the students should try to tell the story to the rest of the class. While the student is trying to tell the story, the instructor should not attempt to correct him. Then other students should have an opportunity to try to tell the story. Students should attempt to repeat the story at a normal rate of speed and without grammatical errors - in other words, students should try to tell it just as the instructor did.

C-2

Class members may wish to discuss the duties of other government officials. Use the procedure given in C-1.

C-2 (continued)

TO THE INSTRUCTOR

These descriptions should be only five sentences long. They should be short, simple, and include only verb forms which are present tense. A sample text is given below.

THE POSTMASTER

තැපැල් මහත්තයා තැපැල් කන්තෝරුවේ වැඩ කරනවා.	The postmaster works in the post office.
ලියුම් බෙදනවා.	He distributes letters.
මුද්දර විකුණනවා.	He sells stamps.
ලියුම් රෙජිස්ටර් කරනවා.	He registers letters.
ටැලිග්‍රෑම් යවනවා.	He sends telegrams.

C-3

Using the skills now at his disposal, each student should select one of the numerous pictures in this book which shows people at work. With the assistance of the instructor, the student should work up a description of the tasks being performed in the picture. Again, the descriptions should be short and simple. A sample text follows.

NOTES ON STRUCTURE: මොන, 'what', and genitive forms.

1. The word මොන in M-1 above is an adjectival form meaning 'what'. It precedes the noun it modifies.

2. The phrase මොන විදියේ වැඩ in M-1 above means 'work of what kind'. විදිය, 'kind, sort, manner', appears in the genitive case. Like ආණ්ඩුව, 'government', and දෙපාර්තමේන්තුව, 'department', which appeared in Cycle 20 in their genitive forms, it belongs to Class B. At this time students and the instructor should review the formation of genitive definite singular forms. Further details appear in Sinhala Structures, section 1.33.

CASTING A HOROSCOPE

හාමුදුරුවෝ	the monk
පන්සල	the temple
වැඩක් කරනවා	performing a task
හාමුදුරුවෝ පන්සලේ වැඩක් කරනවා.	The monk is performing a task in the temple.

උන්නාන්සේ	he (referring to a monk)
හඳහන	the horoscope
උන්නාන්සේ හඳහනක් ලියනවා.	He is writing (casting) a horoscope.
තල්පත	ola leaf
උන්නාන්සේ තල්පතක හඳහන ලියනවා.	He is writing the horoscope on an ola leaf.
පන්හිඳ	the stylus
උන්නාන්සේ පන්හිඳක් පාවිච්චි කරනවා.	He is using a stylus.



RUVANVELISEYA DAGABA, (2nd CENTURY B.C.), ANURADHAPURA

WORKERS WASHING GEM-BEARING GRAVEL

CYCLE 22

WHAT IS THE DAY TODAY?

M-1

අද සඳුදා.	Today is Monday.
අද අඟහරුවාදා.	Today is Tuesday.
අද බදාදා.	Today is Wednesday.
අද බ්‍රහස්පතින්දා.	Today is Thursday.
අද සිකුරාදා.	Today is Friday.
අද සෙනසුරාදා.	Today is Saturday.
අද ඉරිදා.	Today is Sunday.

M-2

අද කවදා ද?	What is the day today?

C-1

TO THE STUDENT

From now on, your instructor will ask you අද කවදා ද? daily. Practice only correct answers. On Wednesday, for instance, practice

A. අද කවදා ද?

B. අද (බදාදා).



WHAT TIME DOES CARGILLS OPEN?

CYCLE 23

WHAT TIME DOES THE EMBASSY OPEN?

M-1

තානාපති කාර්යාලය අරින්නේ උදේ අටට.	The Embassy opens at 8:00.
ඩ්‍රග් ෆෙයාර් සාප්පුව අරින්නේ උදේ හතට.	The Drug Fair opens at 7:00.
ලංකා බැංකුව අරින්නේ නමයට.	The Bank of Ceylon opens at 9:00.
වීසා අංශය අරින්නේ අටයි තිහට.	The visa section opens at 8:30.
තානාපති කාර්යාලය වහන්නේ හතරයි හතලිස් පහට.	The Embassy closes at 4:45.
මේ කන්තෝරුව වහන්නේ හතරට නෙමෙයි. ඒක වහන්නේ පහට.	This office doesn't close at 4:00. It closes at 5:00.

M-2

තානාපති කාර්යාලය අරින්නේ කීයට ද?	What time does the Embassy open?
තානාපති කාර්යාලය වහන්නේ කීයට ද?	What time does the Embassy close?
මේ කන්තෝරුව වහන්නේ පහට ද?	Does this office close at 5:00?

C-1

Students should discuss the local opening and closing times which are of importance to them using the formulas given above.

A. (තානාපති කාර්යාලය වහන්නේ කීයට ද?)

B. (තානාපති කාර්යාලය වහන්නේ හතරයි හතලිස් පහට.)

NOTES ON STRUCTURE: emphatic verb forms; numerals and quantifying phrases in the dative case.

1. The sentences above contain emphatic verb forms. Note the negation with නෙමෙයි, 'is not, are not'.

2. 'At such and such an hour', is expressed by putting the numeral in the dative case. Thus, අට , 'eight'; අටට , 'at eight'. The quantifying phrase කීයට ද? contains the dative case form of කීය 'how much, how many', and here has the idiomatic meaning, 'at what time'. Students who wish to review the formation of dative case forms should consult section 1.32 of Sinhala Structures.

CYCLE 24

WHAT TIME IS IT?

This cycle is the first of a number of cycles which are designed to teach time-telling. For this cycle, discuss only the times given on the 'clocks' below.








M-1

වේලාව තුනයි.	It is 3 o'clock.
වේලාව හතරයි.	It is 4 o'clock.
වේලාව එකොළහයි.	It is 11 o'clock.
වේලාව නමයයි.	It is 9 o'clock.

M-1 (continued)

වේලාව අටයි.	It is 8 o'clock.
වේලාව හයයි.	It is 6 o'clock.

M-2

වේලාව කීය ද?	What time is it?

C-1

Discuss the times on the 'clocks' above.

A. වේලාව කීය ද?

B. වේලාව (එකොළහයි).

MAN WITH PERFORMING MONKEY

CYCLE 25

WHAT TIME IS IT? (continued)








M-1

වේලාව පහයි.	It is 5 o'clock.
වේලාව දහයයි.	It is 10 o'clock.
වේලාව දෙකයි.	It is 2 o'clock.
වේලාව හතයි.	It is 7 o'clock.
වේලාව එකයි.	It is 1 o'clock.

M-2

වේලාව කීය ද?	What time is it?

C-1

Discuss the times given on the "clocks" in this cycle.

A. වේලාව කීය ද?

B. වේලාව (තුනයි).

CYCLE 26

WHAT TIME IS IT? (continued)













M-1

වේලාව දොළහමාරයි.	It is half past twelve.
වේලාව එකහමාරයි.	It is half past one.
වේලාව දෙකහමාරයි.	It is half past two.
වේලාව තුනහමාරයි.	It is half past three.

M-2

වේලාව කීය ද?	What time is it?

C-1

Discuss the times given on the "clocks" above and below.

A. වේලාව කීය ද?

B. වේලාව (තුනහමාරයි)








THE AUKANA BUDDHA

CYCLE 27

WHAT TIME IS IT?
(continued)

M-1

වේලාව නමයට කාලයි.	It is quarter to 9.
වේලාව අටට කාලයි.	It is quarter to 8.
වේලාව එකොලහට කාලයි.	It is quarter to 11.
වේලාව හයට කාලයි.	It is quarter to 6.

M-2

වේලාව හතයි කාලයි.	It is quarter past 7
වේලාව හයයි කාලයි.	It is quarter past 6.
වේලාව එකොලහයි කාලයි.	It is quarter past 11.
වේලාව පහයි කාලයි.	It is quarter past 5.

M-3

වේලාව කීය ද?	What time is it?

C-1

Discuss the times given on the "clocks" below.

A. වේලාව කීය ද?

B. වේලාව (එකොලහයි කාලයි)



















CYCLE 28

WHAT TIME IS IT?
(continued)

M-1

වේලාව දෙකයි විස්සයි.	It is 2:20.
වේලාව එකයි හතලිහයි.	It is 1:40.
වේලාව හතරයි තිහයි.	It is 4:30
වේලාව තුනයි පහයි.	It is 3:05.

M-2

වේලාව හයට විස්සයි.	It is 20 minutes to 6.
වේලාව හතට කාලයි.	It is 15 minutes to 7.
වේලාව හතරට අටයි.	It is 8 minutes to 4.
වේලාව දොළහට පහයි.	It is 5 minutes to 12.

M-3

වේලාව කීය ද?	What time is it?

C-1

Discuss the times given on the "clocks" below.

A. වේලාව කීය ද?

B. වේලාව (හයට විස්සයි)

NOTE ON STRUCTURE: Another use of the particle යි .

The emphasizing particle යි follows numerals when they appear as predicate attributes. Examples have appeared in Cycles 24-28 inclusive. Note that යි appears on both numerals in time expressions involving (a) the house plus x number of minutes and (b) the hour plus කාල , 'quarter.' This යි ... යි construction is an example of the 'and' particle. With 'half-past' time expressions, the emphasizing යි appears only in sentence final position, as it does in time expressions involving x minutes or quarter to an hour. In the latter cases, the hour is in the dative case. Look at the Sinhala given above and in the preceding cycles to make these comparisons. Further discussion appears in Sinhala Structures, sections 5.3, 5.4 and 6.1.



















TWO SISTERS

100117

DIALOGUE V

RECEIVING A CALL AFTER HOURS AT THE EMBASSY

	CPL LOPEZ
අමෙරිකන් තානාපති කාර්යාලය.	American Embassy.
	MR. SILVA
මේ අමෙරිකන් තානාපති කාර්යාලය ද?	Is this the American Embassy?
	CPL LOPEZ
තානාපති කාර්යාලය දැන් වහලා.	The Embassy is now closed.
ආයෙත් අරින්නේ හෙට උදේ අටට.	It will open again tomorrow morning at 8:00.
	MR. SILVA
තානාපති කාර්යාලය ඇරලා තියෙන්නේ කීයේ ඉඳලා කීය වෙනකන් ද?	What are the business hours of the Embassy?
	CPL LOPEZ
අටේ ඉඳලා දොළහමාර වෙනකන්. ආයෙත් දෙකේ ඉඳලා හතරයි හතලිස්පහ වෙනකන්.	From 8 to 12:30. Again from 2 to 4:45.
	MR. SILVA
මට වීසා එකක් ගන්න ඕනෑ. මම දෙකට විතර එන්න ද?	I want to get a visa. Should I come about 2?
	CPL LOPEZ
වීසා කන්තෝරුව දවාලට අරින්නේ නෑ.	The visa office doesn't open after noon.
ඇරලා තියෙන්නේ අට හමාරේ ඉඳලා දොළහමාර වෙනකන් විතරයි.	It is open only from 8:30 to 12:30.
වීසා එකක් ඕනෑනම් දොළහමාරෙන් ඉස්සර එන්න.	If you want a visa, come before 12:30.

	MR. SILVA
මම දොළහමාරට ඉස්සර එන්නේ නැත්තං, වීසා එකක් ගන්නේ කොහොම ද?	If I don't come before 12:30, how do I get a visa?
	CPL LOPEZ
මම දන්නේ නෑ. මම අහලා බලන්නම්.	I don't know. I'll ask and see.

NOTES ON STRUCTURE: ඕනෑ , 'want'; නම් , 'if' and නැත්තං , 'if not'. participle forms; වෙනකන් , 'until', with time expressions; the postpositions ඉස්සර , 'before', and පස්සේ , 'after'. විතර , 'about'; විතරක්, 'only'.

1. The word ඕනෑ means 'want'. It takes an actor in the dative case. Discussion appears in Sinhala Structures, section 2.14.3.

2. The word නම් means 'if'. It may follow simple present tense forms of the verb, emphasized words in emphatic constructions and predicate attributes in equational sentences. The negative නෑ plus නම් becomes නැත්තං . Discussion appears in Sinhala Structures, section 2.9.

3. වහලා , 'closed', and ඇරලා , 'open', are the participle forms of the verbs වහනවා , 'close' and අරිනවා , 'open'. Participles are discussed in Sinhala Structures, section 2.6. They are treated in much greater detail in subsequent lessons (beginning with Cycle 67). The form ඇරලා තියෙනවා , 'is open, has opened', is a perfect form. See also section 2.6 and later lessons.

4. වෙනකන් with time expressions means 'until'.

5. The postpositions ඉස්සර , 'before', and පස්සේ, 'after', follow nouns in the dative case. There is variation, however, and in some dialects the case is instrumental. See Sinhala Structures, section 4.

6. විතර , 'about', is a postposition commonly occuring after numerals which is invariant in its form. The form විතරක් , 'only', is also a postposition. In sentences it occurs in non-final position. In sentence final position, the form විතරයි , 'only' occurs. See Sinhala Structures, section 4.

All of the structures above are treated in greater detail in the pattern practices which follow Dialogue V.

SUMMARY

PRACTICING PATTERNS FROM DIALOGUE V

A. Substitution Drill

Model	I	තානාපති කාර්යාලය දැන් වහලා.	The Embassy is now closed.
	S	තානාපති කාර්යාලය දැන් වහලා.	The Embassy is now closed.
	I	කන්තෝරුව.	The office.
	S	කන්තෝරුව දැන් වහලා.	The office is now closed.

1 තානාපති කාර්යාලය දැන් වහලා. (කන්තෝරුව) [office]

2 කන්තෝරුව දැන් වහලා. (බැංකුව) [bank]

3 බැංකුව දැන් වහලා.(පුස්තකාලය) [library]

4 පුස්තකාලය දැන් වහලා. (තැපැල් කන්තෝරුව). [post office]

5 තැපැල් කන්තෝරුව දැන් වහලා. (රජයේ දෙපාර්තමේන්තු) [government departments]

6 රජයේ දෙපාර්තමේන්තු දැන් වහලා.

B. Response Drill

Model:	I	තානාපති කාර්යාලය තවම ඇරලා ද?	Is the Embassy still open?
	S	නෑ. තානාපති කාර්යාලය දැන් වහලා.	No. The Embassy is now closed.

1	තානාපති කාර්යාලය තවම ඇරලා ද? Is the Embassy still open?	නෑ. තානාපති කාර්යාලය දැන් වහලා. No. The Embassy is now closed.
2	බැංකුව තවම ඇරලා ද? Is the bank still open?	නෑ. බැංකුව දැන් වහලා. No. The bank is now closed.
3	මේ කන්තෝරුව තවම ඇරලා ද? Is this office still open?	නෑ. මේ කන්තෝරුව දැන් වහලා. No. This office is now closed.
4	තැපැල් කන්තෝරුව තවම වහලා ද? Is the post office still closed?	නෑ. තැපැල් කන්තෝරුව දැන් ඇරලා. No. The post office is now open.
5	දොර තවම ඇරලා ද? Is the door still open?	නෑ. දොර දැන් වහලා. No. The door is now closed.

C. Response Drill

Model: I බැංකුව අරින්නේ කීයට ද? What time does the bank open?

S ඒක අරින්නේ අටට. It opens at 8.

1	බැංකුව අරින්නේ කීයට ද? What time does the bank open?	ඒක අරින්නේ අටට. It opens at 8.
2	කන්තෝරුව අරින්නේ කීයට ද? What time does the office open?	ඒක අරින්නේ උදේ හය හමාරට. It opens at 6:30 a.m.
3	මාතර හෝටලය වහන්නේ කීයට ද? What time does the Matara Hotel close?	ඒක වහන්නේ දහයට. It closes at 10.
4	තානාපති කාර්යාලය වහන්නේ කීයට ද? What time does the Embassy close?	ඒක වහන්නේ පහට. It closes at 5.
5	සමුපකාරය වහන්නේ කීයට ද? What time does the Cooperative close?	ඒක වහන්නේ හතට. It closes at 7.
6	පුස්තකාලය අරින්නේ කීයට ද? What time does the library open?	ඒක අරින්නේ උදේ හත හමාරට. It opens at 7:30 a.m.

D. Response Drill

Model: I කීයේ ඉඳලා කීය වෙනකන් ද? From when till when?

S පහේ ඉඳලා පහ වෙනකන්. From 5 till 5.

1	කීයේ ඉඳලා කීය වෙනකන් ද? From when till when?	පහේ ඉඳලා පහ වෙනකන්. From 5 till 5.
2	කීයේ ඉඳලා කීය වෙනකන් ද? From when till when?	අටේ ඉඳලා අට වෙනකන්. From 8 till 8.
3	කීයේ ඉඳලා කීය වෙනකන් ද? From when till when?	හයේ ඉඳලා තුන වෙනකන්. From 6 till 3.
4	කීයේ ඉඳලා කීය වෙනකන් ද? From when till when?	දෙකේ ඉඳලා හතර වෙනකන් From 2 till 4.
5	කීයේ ඉඳලා කීය වෙනකන් ද? From when till when?	දෙකේ ඉඳලා හය වෙනකන්. From 2 till 6.

E. Substitution Drill

Model:	I	මහත්තයාට විසා එකක් ඕනෑ නම්, අටට විතර එන්න.	If you want a visa, sir, come about eight.
	S	මහත්තයාට විසා එකක් ඕනෑ නම්, අටට විතර එන්න.	If you want a visa, sir, come about eight.
	I	තුන.	Three.
	S	මහත්තයාට විසා එකක් ඕනෑ නම්, තුනට විතර එන්න.	If you want a visa, sir, come about three.

1 මහත්තයාට විසා එකක් ඕනෑ නම්, අටට විතර එන්න. (තුන) [three]

2 මහත්තයාට විසා එකක් ඕනෑ නම්, තුනට විතර එන්න. (හත) [seven]

3 මහත්තයාට විසා එකක් ඕනෑ නම්, හතට විතර එන්න. (හය) [six]

4 මහත්තයාට විසා එකක් ඕනෑ නම්, හයට විතර එන්න. (දෙක) [two]

5 මහත්තයාට විසා එකක් ඕනෑ නම්, දෙකට විතර එන්න. (එක) [one]

6 මහත්තයාට විසා එකක් ඕනෑ නම්, එකට විතර එන්න.

F. Transformation Drill

Model:	I	මහත්තයා ගෙදර යනවා.	The gentleman is going home.
	S	මහත්තයාට ගෙදර යන්න ඕනෑ.	The gentleman wants to go home.

1	මහත්තයා ගෙදර යනවා. The gentleman is going home.	මහත්තයාට ගෙදර යන්න ඕනෑ. The gentleman wants to go home.
2	මහත්තයා ලංකාවේ වැඩ කරනවා. The gentleman works in Sri Lanka.	මහත්තයාට ලංකාවේ වැඩ කරන්න ඕනෑ The gentleman wants to work in Sri Lanka.
3	මහත්තයා මේ පොත් කියවනවා. The gentleman is reading these books.	මහත්තයාට මේ පොත් කියවන්න ඕනෑ. The gentleman wants to read these books.
4	මහත්තයා ඉඳගන්නවා. The gentleman is sitting down.	මහත්තයාට ඉඳගන්න ඕනෑ. The gentleman wants to sit down.
5	මහත්තයා දොර අරිනවා. The gentleman is opening the door.	මහත්තයාට දොර අරින්න ඕනෑ. The gentleman wants to open the door.

G. Transformation Drill

Model:	I එයා දැන් වැඩ කරනවා.	He is working now.
	S එයා දැන් වැඩ කරනවා නම්, මට කියන්න.	If he is working now, tell me.

1	එයා දැන් වැඩ කරනවා. He is working now.	එයා දැන් වැඩ කරනවා නම්, මට කියන්න. If he is working now, tell me.
2	එයා පත්තර ආයෙත් කියවනවා. He is reading the papers again.	එයා පත්තර ආයෙත් කියවනවා නම්, මට කියන්න. If he is reading the papers again, tell me.
3	එයාට විසා එකක් ඕනෑ. He wants a visa.	එයාට විසා එකක් ඕනෑ නම්, මට කියන්න. If he wants a visa, tell me.
4	කන්තෝරුව දැන් ඇරලා. The office is now open.	කන්තෝරුව දැන් ඇරලා නම්, මට කියන්න. If the office is now open, tell me.
5	මහත්තයා එන්නේ දෙකට. It is at two that the gentleman is coming.	මහත්තයා එන්නේ දෙකට නම්, මට කියන්න. If it is at two that the gentleman is coming, tell me.
6	ඒක හොඳයි. That's fine.	ඒක හොඳ නම්, මට කියන්න. If that's fine, tell me.

H. Response Drill

Model:	I මම දොළහට ඉස්සර එන්න ද?	Should I come before 12:00?
	S එපා. දොළහට පස්සේ එන්න.	Don't. Come after 12:00.

1	මම දොළහට ඉස්සර එන්න ද? Should I come before 12:00?	එපා. දොළහට පස්සේ එන්න. Don't. Come after 12:00.
2	මම දෙකට ඉස්සර එන්න ද? Should I come before 2:00?	එපා. දෙකට පස්සේ එන්න. Don't. Come after 2:00.
3	මම තුනට ඉස්සර එන්න ද? Should I come before 3:00?	එපා. තුනට පස්සේ එන්න. Don't. Come after 3:00.
4	මම හයට ඉස්සර එන්න ද? Should I come before 6:00?	එපා. හයට පස්සේ එන්න. Don't. Come after 6:00.
5	මම අට හමාරට ඉස්සර එන්න ද? Should I come before 8:30?	එපා. අට හමාරට පස්සේ එන්න. Don't. Come after 8:30.

I Transformation Drill

Model:	I මහත්තයා දන්නේ නෑ.	The gentleman doesn't know.
	S මහත්තයා දන්නේ නැත්තං, මම කියන්නම්.	I'll tell you if the gentleman doesn't know.

1 මහත්තයා දන්නේ නෑ. The gentleman doesn't know.	මහත්තයා දන්නේ නැත්තං, මම කියන්නම්. I'll tell you if the gentleman doesn't know.
2 එයා යන්නේ නෑ. He isn't going.	එයා යන්නේ නැත්තං, මම කියන්නම්. I'll tell you if he isn't going.
3 මෙයා වැඩ කරන්නේ නෑ. This person isn't working.	මෙයා වැඩ කරන්නේ නැත්තං, මම කියන්නම්. I'll tell you if this person isn't working.
4 එයාට වීසා එකක් ඕනෑ නෑ. He doesn't want a visa.	එයාට වීසා එකක් ඕනෑ නැත්තං, මම කියන්නම්. I'll tell you if he doesn't want a visa.
5 ඒක හොඳ නෑ. It isn't good.	ඒක හොඳ නැත්තං, මම කියන්නම්. I'll tell you if it isn't good.
6 එයා ළඟ සල්ලි නෑ. He has no money.	එයා ළඟ සල්ලි නැත්තං, මම කියන්නම්. I'll tell you if he has no money.

J Transformation Drill

Model:	I මා ළඟ කාසි විතරක් තියෙනවා.	I only have coins.
	S මා ළඟ තියෙන්නේ කාසි විතරයි.	It is only coins that I have.

1 මා ළඟ කාසි විතරක් තියෙනවා. I only have coins.	මා ළඟ තියෙන්නේ කාසි විතරයි. It is only coins that I have.
2 මම විතරක් ගෙදර යනවා. Only I am going home.	ගෙදර යන්නේ මම විතරයි. It is only I who is going home.
3 එයා කන්තෝරුවේ විතරක් වැඩ කරනවා. He only works in the office.	එයා වැඩ කරන්නේ කන්තෝරුවේ විතරයි. It is only in the office that he works.
4 මහත්තයා සිගරට් විතරක් බොනවා. The gentleman only smokes cigarettes.	මහත්තයා බොන්නේ සිගරට් විතරයි. It is only cigarettes that the gentleman smokes.
5 එයා මුද්දර විතරක් විකුණනවා. He only sells stamps.	එයා විකුණන්නේ මුද්දර විතරයි. It is only stamps that he sells.
6 මහත්තයා සිංහල විතරක් කතාකරනවා. The gentleman only speaks Sinhala.	මහත්තයා කතාකරන්නේ සිංහල විතරයි. It is only Sinhala that the gentleman speaks.

CYCLE 29

WHAT ARE THE BUSINESS HOURS OF THE POST OFFICE?

M-1

තැපැල් කන්තෝරු උදේ අටේ ඉඳලා රෑ අට වෙනකන් ඇරලා.	Post offices are open from 8 in the morning till 8 at night.
ඩාර්ට් ඩ්‍රග් සාප්පුව පැය විසි හතරම ඇරලා.	Dart Drug is open a full 24 hours.
අමෙරිකාවේ බැංකු සාමාන්‍යයෙන් දහයේ ඉඳලා පහ වෙනකන් ඇරලා.	In America banks are usually open from 10 till 5.
ලංකාවේ බැංකු නමේ ඉඳලා එක වෙනකන් ඇරලා.	In Sri Lanka banks are open from 9 till 1.
අමෙරිකන් සෙන්ටර් පුස්තකාලය දහයේ ඉඳලා හය වෙනකන් ඇරලා.	The American Centre Library is open from 10 till 6.
පැන් ඇම් කන්තෝරුව අටයි කාලේ ඉඳලා හතරයි කාල වෙනකන් ඇරලා.	The Pan Am office is open from 8:15 till 4:15.

M-2

කීයේ ඉඳලා	- from when
කීයට/කීය වෙනකන්	- till when
තැපැල් කන්තෝරු කීයේ ඉඳලා කීය වෙනකන් ඇරලා ද?	What are the business hours of the post office?
රජයේ දෙපාර්තමේන්තු ඇරලා තියෙන්නේ කීයේ ඉඳලා කීයට ද?	What are the business hours of government departments?

C-1

Discuss the business hours of local establishments using the formulas given above.

A. (තැපැල් කන්තෝරු) කීයේ ඉඳලා කීය වෙනකන් ඇරලා ද?

B. (උදේ අටේ ඉඳලා රෑ අට වෙනකන් ඇරලා.)

NOTE ON STRUCTURE: the emphasizing particle ම.

The emphasizing particle ම occurs above after පැය විසි හතර, twenty-four hours. Hence පැය විසි හතරම, 'a full twenty-four hours.' Further discussion of ම appears in Sinhala Structures, section 5.5.



ROCK CARVING, ISURUMUNIYA

CYCLE 30

WHERE DO YOU LIVE NOW?

M-1

දැන් මම ඉන්නේ කොළඹ.	At present I live in Colombo.
දැන් මම ඉන්නේ කැලිෆෝනියාවේ.	At present I live in California.
දැන් අර මහත්තයා ඉන්නේ තර්ස්ටන් පාරේ.	At present that gentleman lives on Thurstan Road.
දැන් මම ඉන්නේ හෝටලයක.	At present I live in a hotel.
දැන් මම ඉන්නේ ගමක.	At present I live in a village.

M-2

දැන් ඉන්නේ කොහේ ද?	Where do you live now?
අර මහත්තයා ඉන්නේ කොහේ ද?	Where does that gentleman live?
අර මහත්තයා ඉන්නේ මොන පාරේ ද?	What street does that gentleman live on?
අර මහත්තයා ඉන්නේ මොන නගරයේ ද?	What city does that gentleman live in?

C-1

The instructor should ask the students where they are living. Then the students should have an opportunity to ask the questions learned in M-2.

A. අර මහත්තයා ඉන්නේ කොහේ ද?

B. අර මහත්තයා ඉන්නේ (කොළඹ).

NOTES ON STRUCTURE: ඉන්නවා , 'be', and genitive forms.

1. ඉන්නේ is an emphatic present tense form of the verb ඉන්නවා 'be'. For notes on this verb, see Sinhala Structures, sections 1.51 and 2.23. For notes on emphatic present tense forms see section 2.2.

2. රටේ , කැලිෆෝනියාවේ , කොළඹ , ගෙදර , හෝටලයක , ගමක , are genitive case forms. See Sinhala Structures, section 1.33.

CYCLE 31

WHERE ARE YOU FROM?

M-1

මම අමෙරිකාවෙන්.	I am from America.
මම ලංකාවෙන්.	I am from Sri Lanka.
මම නිව්යෝක්වලින්.	I am from New York.
මම කොළඹින්	I am from Colombo.
මම නුවරින්.	I am from Kandy.

M-2

මහත්තයා කොහෙන් ද?	Where are you from, sir?
නෝනා මහත්තයා කොහෙන් ද?	Where are you from, madam?
අර මහත්තයා කොහෙන් ද?	Where is that gentleman from?

C-1

Each student should have an opportunity to find out where the others in the class are from.

A. (මහත්තයා) කොහෙන් ද?

B. (මම) (අමෙරිකාවෙන්).

NOTE ON STRUCTURE: instrumental forms.

අමෙරිකාවෙන් , ලංකාවෙන් , නිව්යෝක්වලින් , කොළඹින් , නුවරින් , and කොහෙන් , are instrumental case forms. For information on the formation and use of the instrumental case see Sinhala Structures, Section 1.34.

CYCLE 32

ARE YOU FROM SRI LANKA?

M-1

ඔව්. මම ලංකාවෙන්.	Yes. I am from Sri Lanka.
ඔව්. මම කොළඹින්.	Yes, I am from Colombo.
ඔව්. මම අමෙරිකාවෙන්.	Yes. I am from America.
ඔව්. මම නිව්යෝක්වලින්.	Yes. I am from New York City.

M-2

නෑ. මම ලංකාවෙන් නෙමෙයි.	No. I am not from Sri Lanka.
නෑ. මම අමෙරිකාවෙන් නෙමෙයි.	No. I am not from America.
නෑ. මම කැනඩාවෙන් නෙමෙයි.	No. I am not from Canada.
නෑ. මම ඉන්දියාවෙන් නෙමෙයි.	No. I am not from India.

M-3

මහත්තයා ලංකාවෙන් ද?	Are you from Sri Lanka, sir?
මහත්තයා අමෙරිකාවෙන් ද?	Are you from America, sir?
නෝනා මහත්තයා ඉන්දියාවෙන් ද?	Are you from India, madam?
අර මහත්තයා අමෙරිකාවෙන් ද?	Is that gentleman from America?
අර නෝනා මහත්තයා කොළඹින් ද?	Is that lady from Colombo?

C-1

Class members should exchange information on where they are from.

C-1 (continued)

A. නෝනා මහත්තයා කොහෙන් ද?

B. මම (ඇමෙරිකාවෙන්).

NOTE TO THE STUDENT

Review Sinhala Structures, section 1.34 on instrumental case forms.

CYCLE 33

WHAT AREA OF THE COUNTRY ARE YOU FROM?

M-1 (For American Students)

මම උතුරෙන්.	I am from the North.
මම දකුණෙන්.	I am from the South.
මම නැගෙනහිරෙන්.	I am from the East.
මම බස්නාහිරෙන්.	I am from the West.

M-2 (For residents of Sri Lanka)

මම උතුරු පලාතෙන්.	I am from the Northern Province.
මම නැගෙනහිර පලාතෙන්.	I am from the Eastern Province.
මම දකුණු පලාතෙන්.	I am from the Southern Province.
මම බස්නාහිර පලාතෙන්.	I am from the Western Province.
මම මැද පලාතෙන්.	I am from the Central Province.
මම උතුරු මැද පලාතෙන්.	I am from the North Central Province.
මම වයඹ පලාතෙන්.	I am from the North Western Province.
මම ඌව පලාතෙන්.	I am from the Uva Province.

M-2 (continued)

මම සබරගමුව පලාතෙන්.	I am from the Sabaragamuwa Province.

M-3

මහත්තයා අමෙරිකාවේ මොන පලාතෙන් ද?	What part of America are you from, sir?
මහත්තයා ලංකාවේ මොන පලාතෙන් ද?	What part of Sri Lanka are you from, sir?
නෝනා මහත්තයා ලංකාවේ මොන පලාතෙන් ද?	What part of Sri Lanka are you from, madam?

C-1

Class members should exchange information on what parts of their countries they are from. North American students may find it useful to learn the names of the nine provinces of Sri Lanka.

A. මහත්තයා ලංකාවේ මොන පලාතෙන් ද?

B. මම (ඌව පලාතෙන්.)



INDEPENDENCE HALL, COLOMBO



WHAT PART OF SRI LANKA IS THIS PERSON FROM?



WHAT PART OF SRI LANKA IS THIS PERSON FROM?

CYCLE 34

HOW MANY MILES TO KANDY?



M-1

කොළඹ ඉඳලා නුවරට හැතැප්ම 72යි.	From Colombo to Kandy it is 72 miles.
පේරාදෙනියට හැතැප්ම 68 ක් විතර තියෙනවා.	To Peradeniya it is about 68 miles.
කොළඹ ඉඳලා කළුතරට හැතැප්ම 35 ක් විතර තියෙනවා.	From Colombo to Kalutara it is about 35 miles.

M-2

කොළඹ ඉඳලා නුවරට හැතැප්ම කීය ද?	How many miles from Colombo to Kandy?
නුවර ඉඳලා පේරාදෙනියට හැතැප්ම කීය ද?	How many miles from Kandy to Peradeniya?
කොළඹ ඉඳලා ගාල්ලට හැතැප්ම කීය ද?	How many miles from Colombo to Galle?
කොළඹ ඉඳලා කළුතරට හැතැප්ම කීය ද?	How many miles from Colombo to Kalutara?

C-1

Use the mileage chart in the book to discuss the distances between various points in Sri Lanka which are of interest.

A. (කොළඹ) ඉඳලා (නුවර) ට හැතැප්ම කීය ද?

B. (කොළඹ) ඉඳලා (නුවර)ට හැතැප්ම (72) යි.

C-2

Bring a Sri Lanka road map. Discuss the distances between places of interest.

A. (මෙහේ) ඉඳලා (   ) ට හැතැප්ම කීය ද?

B. හැතැප්ම (72) යි.



වැල්ලවාය																																		
වවුනියාව																																		214
වාලච්චේනයි																																	128	111
ත්‍රිකුණාමලය																																67	60	178
තලෙයිමන්නාරම																															125	181	65	267
රත්නපුරය																														227	176	184	174	75
පුත්තලම																													128	132	112	149	79	183
පොළොන්නරුව																												109	150	141	80	40	88	151
පැල්මඩුල්ල																											162	140	12	239	188	173	186	63
පානදුරය																										55	151	99	43	228	177	191	175	118
නුවරඑළිය																									113	80	135	128	92	212	161	139	159	54
තෝත්තාගම																								114	110	55	211	195	67	294	238	171	241	60
මැදවච්චිය																							225	143	159	170	72	63	158	69	68	112	16	198
මාතර																						242	38	152	82	93	234	182	108	311	260	209	258	98
මාතලේ																					188	79	178	64	105	116	71	96	104	148	97	111	95	119
මරදන්කඩවල																				49	212	30	195	113	129	140	42	67	128	99	61	82	46	268
මන්නාරම																			82	131	294	52	277	195	211	222	124	115	210	17	106	164	48	250
මාදම්පෙ																		230	148	124	85	178	47	88	63	8	170	148	20	247	196	180	194	71
කුරුණෑගල																	94	136	54	42	158	84	141	74	75	86	76	54	74	153	102	116	100	128
කෑගල්ල																20	84	156	74	40	148	104	131	64	65	76	96	74	64	173	122	136	120	118
කන්කසන්තුරේ															219	199	294	147	145	194	357	115	340	258	274	285	187	178	273	164	159	227	99	312
මහනුවර														210	24	26	108	147	65	16	172	95	155	48	89	100	87	80	88	164	113	127	111	102
කළුතර													99	284	75	85	68	221	139	115	72	169	110	119	10	60	161	109	48	238	187	201	185	123
යාපනය												273	199	11	208	188	282	136	134	183	346	104	329	247	263	274	176	167	242	153	148	216	88	301
හම්බන්තොට											339	120	152	350	141	151	57	287	205	168	48	235	10	104	131	65	201	205	77	304	228	161	251	50
හල්දුම්මුල්ල										75	289	98	90	300	106	116	46	237	155	106	123	186	85	42	93	38	175	170	50	254	202	134	201	25
ගාල්ල									138	76	318	45	144	329	119	130	92	266	184	160	28	214	66	180	55	100	206	154	93	283	232	237	230	126
දඹුල්ල								164	135	185	154	119	45	165	54	34	128	102	20	29	192	50	175	93	109	120	42	87	108	119	68	82	66	147
කොළඹ							92	72	113	148	246	27	72	257	48	58	83	194	112	88	100	142	138	112	17	75	134	82	63	211	160	174	158	138
චෙන්කලාඩි						178	92	227	124	152	226	205	106	237	130	126	170	174	92	122	199	122	161	129	195	163	50	159	174	191	77	10	138	101
මඩකලපුව					9	188	101	237	134	162	235	215	116	246	140	135	180	183	101	132	209	131	171	139	204	173	59	168	184	200	86	19	147	111
බදුල්ල				104	94	143	128	159	30	83	282	128	83	293	99	109	76	230	148	99	131	178	93	35	123	68	145	163	80	247	172	104	194	33
අවිස්සාවේල්ල			107	177	167	36	81	88	77	104	235	43	61	246	37	47	47	183	101	77	116	131	93	76	37	39	123	101	27	200	149	163	147	102
අනුරාධපුරය		122	169	122	113	128	41	200	170	226	121	155	86	132	95	75	169	69	21	70	228	17	216	134	145	161	63	46	149	86	66	103	33	184
අඹේපුස්ස	96	26	110	151	141	37	55	109	103	130	209	64	35	220	11	21	74	157	75	51	137	105	120	75	54	66	97	75	53	174	123	137	121	128

DISTANCES BETWEEN MAJOR POINTS IN SRI LANKA

CYCLE 35

HOW OLD ARE YOU?

M-1

මට අවුරුදු විසි එකයි.	I am 21 years.
මට අවුරුදු විසි අටයි.	I am 28 years.
මට අවුරුදු විසි දෙකයි.	I am 22 years.
මට අවුරුදු තිස් පහයි.	I am 35 years.
අර මහත්තයාට අවුරුදු තිහයි.	That gentleman is 30.

M-2

මහත්තයාට වයස කීය ද?	How old are you, sir?
අර මහත්තයාට වයස කීය ද?	How old is that gentleman?

C-1

Students should take this opportunity to find out the ages of others in the classroom using the formulas given above.

A. (මහත්තයාට) වයස කීය ද?

B. මට අවුරුදු (විසි එකයි).

NOTE ON STRUCTURE: expressing age in Sinhala.

මට අවුරුදු විසි එකයි is an equational sentence with the literal meaning 'to me (there are) 21 years.' In the sentence මහත්තයාට වයස කීය ද? , වයස means 'age'. The literal meaning of this sentence is 'how much (is) the age to the gentleman.' මහත්තයාගේ වයස කීය ද? 'how much is the gentleman's age', is also acceptable.

HOMEWORK AND CLASSWORK FOR STUDENTS

Students have had to use a large number of numerals in this lesson and in the ones which have immediately preceded. Now is the time for students to review inanimate numerals in Sinhala Structures, section 6, and to commit them to memory, if they have not already done so. Students should be able to recite and decode numbers from 1 - 300. Special classroom attention should be paid to decoding numerals involving හත, 'seven', and අට, 'eight', and numbers 61-79 which contain some near minimal pairs.

CYCLE 36

ASK THAT GENTLEMAN...

M-1

අරයාගෙන් අහන්න.	Ask that person.
අර මහත්තයාගෙන් අහන්න.	Ask that gentleman.
අර නෝනා මහත්තයාගෙන් අහන්න.	Ask that lady.

M-2

අරයාගෙන් අහන්න වයස කීය ද කියලා.	Ask that person how old he is.
අර මහත්තයාගෙන් අහන්න නම මොකද්ද කියලා.	Ask that gentleman what his name is.
අර නෝනා මහත්තයාගෙන් අහන්න කොහෙන් ද කියලා.	Ask that lady where she's from.
අර මහත්තයාගෙන් අහන්න අමෙරිකාවෙන් ද කියලා.	Ask that gentleman whether he's from America.
අර මහත්තයාගෙන් අහන්න නම ස්මිත් ද කියලා.	Ask that gentleman if his name is Smith.

M-3

මහත්තයාට වයස කීය ද?	How old are you, sir?
අද කවදා ද?	What day is today?
මහත්තයාගේ නම මොකද්ද?	What is your name, sir?
මහත්තයා කොහෙන් ද?	Where are you from, sir?
මහත්තයා ලංකාවෙන් ද?	Are you from Sri Lanka, sir?
මහත්තයාගේ නම ස්මිත් ද?	Is the gentleman's name Smith?

C-1

Students should use the formulas given here to review the questions they have learned to ask. Students should ask each other for biographical information. Student A should ask for information from B who will ask a question of C.

A. අරයාගෙන් අහන්න වයස කීයද කියලා.

B. වයස කීය ද?

C. මට අවුරුදු (විසි දෙකයි)

C-2 Being an interpreter

Student A should play the role of a monolingual Sinhala speaker. Student B should be the interpreter. Student C should play the role of someone who knows only English.

A. අරයාගෙන් අහන්න වයස කීය ද කියලා.

B. How old are you?

C. I'm (twenty-five)

B. (Back to A) වයස අවුරුදු (විසි පහයි)

NOTE ON STRUCTURE: instrumental forms.

With අහන්න,' to ask', the person asked is in the instrumental case. අරයාගෙන් and ඒයාගෙන් above are animate instrumental singular forms. Refer to information on the formation of the instrumental in Sinhala Structures, section 1.34.

CYCLE 37

ASK THOSE GENTLEMEN ....

M-1

අර මහත්තුරුන්ගෙන් අහන්න වයස කීය ද කියලා.	Ask those gentlemen how old they are.
ඒගොල්ලන්ගෙන් අහන්න ඉන්නේ කොහේ ද කියලා.	Ask those people where they live.
ඒගොල්ලන්ගෙන් අහන්න නම් මොනවා ද කියලා.	Ask those people what their names are.

C-1

This C phase should be similar to that of Cycle 25. In this case, however, the student asking the questions will have to ask more than one person.

A. (අර මහත්තුරුන්ගෙන් අහන්න වයස කිය ද කියලා.)

B. (වයස කිය ද?)

NOTE ON STRUCTURE: instrumental forms.

මහත්තුරුන්ගෙන් and ඒගොල්ලන්ගෙන් are instrumental plurals. See Sinhala Structures, section 1.34.

GIVING A MONOLOGUE

TO THE STUDENT AND TO THE TEACHER

Each student should give a short monologue in Sinhala, giving as much information about himself, his teacher and his classmates as he is able.

Sample Monologue

මගේ නම බාබරා ස්මිත්.	My name is Barbara Smith.
මට අවුරුදු විසි දෙකයි.	I am 22.

Sample Monologue (continued)

මම දැන් ඉන්නේ කැලිෆෝනියාවේ.	Now I live in California.
මම ඉන්නේ උතුරු පලාතේ.	I live in the North.
මම වැඩ කරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ.	I work for the Department of Agriculture
මගේ ගුරුවරියගේ නම ඔලිවියා සිල්වා.	My teacher's name is Olivia Silva.
සිල්වා නෝනා මහත්තයා ලංකාවෙන්.	Mrs. Silva is from Sri Lanka.

ELEPHANT BEING USED TO MOVE HEAVY TIMBERS

CYCLE 38

WHEN WILL YOU GO TO SRI LANKA .. OR BACK TO THE UNITED STATES

M-1

මම අප්‍රේල් මාසේ ලංකාවට යනවා.	I will go to Sri Lanka in April.
මම මාර්තු මාසේ ලංකාවට යනවා.	I will go to Sri Lanka in March.
මම ජූනි මාසේ ලංකාවට යනවා.	I will go to Sri Lanka in June.

මම ජනවාරි මාසේ ආපහු යනවා.	I will go back in January.
මම පෙබරවාරි මාසේ ආපහු යනවා.	I will go back in February.
මම ජූලි මාසේ ආපහු යනවා.	I will go back in July.

M-3

මම මැයි මාසේ ලංකාවට යන්න බලාපොරොත්තු වෙනවා.	I expect to go to Sri Lanka in May.
මම දෙසැම්බර් මාසේ ලංකාවට යන්න බලාපොරොත්තු වෙනවා.	I expect to go to Sri Lanka in December.
මම අගෝස්තු මාසේ ආපහු යන්න බලාපොරොත්තු වෙනවා.	I expect to go back in August.
මම සැප්තැම්බර් මාසේ ආපහු යන්න බලාපොරොත්තු වෙනවා.	I expect to go back in September.

M-4

මහත්තයා ලංකාවට යන්නේ කවදා ද?	When are you going to Sri Lanka , sir?
මහත්තයා වොෂිංටන්වලට යන්න බලාපොරොත්තු වෙන්නේ කවදා ද?	When do you expect to go to Washington , sir?

C-1

Students should be given an opportunity to tell when they will go to Sri Lanka, or if they are already living there, back to the United States.

A. (මහත්තයා ලංකාවට යන්නේ කවදා ද?)

B. (මම අප්‍රේල් මාසේ ලංකාවට යනවා.)

NOTES ON STRUCTURE

1. This lesson contains the following new verbs:

බලාපොරොත්තු වෙනවා	expect
ආපහු යනවා.	go back, return

2. The months. The names of the months in Sinhala used for most official and commercial purposes are borrowings. They are:

ජනවාරි	January	ජූලි	July
පෙබරවාරි	February	අගෝස්තු	August
මාර්තු	March	සැප්තැම්බර්	September
අප්‍රේල්	April	ඔක්තෝබර්	October
මැයි	May	නොවැම්බර්	November
ජූනි	June	දෙසැම්බර්	December

The month is expressed by adding මාසේ, 'month', to one of the words above. For example, ජනවාරි මාසේ, 'January'.

3. කවදා is one Sinhala word for 'when'. Literally, it means 'what day' as in අද කවදා ද?, 'What day is today?' (see Cycle 22).

ADDITIONAL VOCABULARY

1. The names of the Sinhala months.

The names of the Sinhala months of the traditional Buddhist calendar are given below. Students who are studying Sinhala in Sri Lanka may already be familiar with some of them since they are associated with certain well-known festivals. For example, වෙසක් (May) is a time when the countryside is exuberantly decorated and lighted. Beginning with the first month of the Sinhalese New Year which begins in April, they are:

බක්	March-April	වප්	September-October
වෙසක්	April-May	ඉල්	October-Nov mber
පොසොන්	May-June	උඳුවප්	November-December
ඇසළ	June-July	දුරුතු	December-January
නිකිනි	July-August	නවම්	January-February
බිනර	August-September	මැදින්	February-March.

2. Other useful vocabulary

එන සුමානේ (ලබන සුමානේ)	Next week
එන මාසේ (ලබන මාසේ)	Next month
එන අවුරුද්දේ (ලබන අවුරුද්දේ)	Next year
හෙට	Tomorrow
අනිද්දා	The day after tomorrow
ළඟදී	Soon
හෙට උදේ	Tomorrow morning
හෙට හවස	Tomorrow afternoon (evening)
පෝය දා	Poya day



THE COLOMBO HARBOUR

CYCLE 39

WHY ARE YOU GOING TO SRI LANKA NEXT YEAR?

M-1

මම තානාපති කාර්යාලයේ වැඩ කරන්න යනවා.	I am going to work in the Embassy.
මම වොෂිංටන්වල වැඩ කරන්න යනවා.	I am going to work in Washington.
මම ග්‍රාම සංවර්ධන වැඩ කරන්න යනවා.	I am going to do rural development work.

M-2

ඇයි යන්නේ, මහත්තයා?	Why (are you) going, sir?
ඇයි යන්නේ ලබන මාසේ?	Why (are you) going next month?
ඇයි ආපහු යන්නේ?	Why (are you) going back?

C-1

This cycle should be done in conjunction with Cycle 38. Students should be given an opportunity to tell when they will go to Sri Lanka, or if they are already living there, back to the United States.

A. (ඇයි යන්නේ, මහත්තයා?)

B. (මම කොළඹ වැඩ කරන්න යනවා.)

NOTE ON STRUCTURE: ඇයි, 'why'.

ඇයි means 'why'. Note that it stands alone as a question word and is not followed by the question marker ද. Like many other question words, it occurs with emphatic forms of the verb.

CYCLE 40

WHY ARE YOU GOING IN JANUARY?
WHY DON'T YOU GO IN MARCH?

M-1

නත්තල	Christmas
පටන් ගන්නවා	begin, start
වැඩ නත්තලින් පස්සේ පටන් ගන්න නිසා.	Because the work starts after Christmas.
මාරුව	the transfer
මාරුවක් ලැබෙනවා	receive a transfer
මට මාරුවක් ලැබෙන නිසා.	Because I am getting a transfer.
නිවාඩුව	the holiday, vacation
මට නිවාඩුවට යන්න ඕනෑ නිසා.	Because I want to go on holiday.
ඉවර වෙනවා	finish, to be over
ලංකාවේ වැඩ ඉවර වෙන නිසා.	Because the work in Sri Lanka is over.
මට වොෂිංටන්වල වැඩ තියෙන නිසා.	Because I have work in Washington.

M-2

මහත්තයා ජනවාරි මාසේ යන්නේ මොකද?	Why are you going in January, sir?
මහත්තයා මාර්තු මාසේ යන්නේ නැත්තේ මොකද?	Why don't you go in March?
නෝනා මහත්තයා දැනට යන්නේ නැත්තේ මොකද?	Why don't you go now, madam?

C-1

The class should continue the discussion which was begun in Cycles 38 and 39.

C-1 (continued)

A. (මහත්තයා ලබන මාසේ යන්නේ මොකද?)

B. (මට මාරුවක් ලැබෙන නිසා)

NOTES ON STRUCTURE: නිසා , 'because', with verb forms. The emphatic negative form නැත්තේ ; දැනට, 'right now'; පටන් ගන්නවා, 'begin', and ඉවර වෙනවා , 'finish, to be over'; rapid speech forms.

1. The word නිසා , 'because', follows the present verbal adjective form of the verb, not the simple present tense. Look closely at the examples which appear above in the M-phase. The formation of the present verbal adjective form is treated in Sinhala Structures, section 2.32.

2. නැත්තේ is an emphatic negative which occurs with question words. For example:

කවුද යන්නේ?	Who is going?
කවුද යන්නේ නැත්තේ?	Who isn't going?
යන්නේ මොකද?	Why (are you) going?
යන්නේ නැත්තේ මොකද?	Why (are you) not going?

Further details appear in Sinhala Structures, section 2.24.

3. දැනට means 'right now.' Another way of expressing 'right now' is දැන්ම . This second form is composed of දැන්, 'now', plus the emphasizing particle ම .

4. The verbs පටන් ගන්නවා , 'begin', and ඉවර වෙනවා , 'finish, be over', have appeared for the first time in this lesson. ඉවර වෙනවා is intransitive. The transitive form is ඉවර කරනවා , 'finish, get done.' For example:

වැඩ ඉවර වෙනවා.	The work is getting finished.
මම වැඩ ඉවර කරනවා.	I am finishing the work.

5. කරන්නේ, යන්නේ, එන්නේ, and related forms when followed by නැ , නැත්තේ or related negative forms appear as කරන්, යන් , එන් , and so on in rapid speech. This is very common and thus important for decoding. For example:

එයා වැඩ කරන් නැ.	He isn't working.
එයා යන් නැත්තේ මොකද?	Why isn't he going?

DIALOGUE VI

RECEIVING A VISITOR IN THE CONSULAR SECTION

	MRS. RANASINGHE
ඩයිල් මහත්තයා ඉන්නවා ද?	Is Mr. Dial in?
	MR. PERERA
නෑ. එයා කන්තෝරුවේ නෑ.	No. He is not in the office.
	MRS. RANASINGHE
මහත්තයා එන්නේ කීයට ද?	At what time will he come?
	MR. PERERA
ඩයිල් මහත්තයා වොෂිංටන්වලට ආපහු ගියා. ලබන සුමානේ එයි.	Mr. Dial went back to Washington. He'll come next week.
	MRS. RANASINGHE
ආය කවුද ඉන්නේ මෙහේ?	Who else is here?
	MR. PERERA
කවුරුවත් නෑ, නෝනා මහත්තයා. මම තනියම ඉන්නවා.	No one, madam. I am alone.
	MRS. RANASINGHE
එහෙනම්, සිල්වා නෝනා මහත්තයාත් කන්තෝරුවේ නෑ.	Then Mrs. Silva is not in the office either.
	MR. PERERA
සිල්වා නෝනා මහත්තයාට අද නිවාඩු.	Mrs. Silva is on leave today.
	MRS. RANASINGHE
මට ඩයිල් මහත්තයාට නැත්නම් සිල්වා නෝනා මහත්තයාට කතාකරන්න ඕනෑ. එයාලා ළඟ මගේ පාස්පෝට් එක තියෙනවා.	I want to speak to Mr. Dial or Mrs. Silva. They have my passport.
	MR. PERERA
සිල්වා නෝනා මහත්තයාට නුවර වැඩ තියෙන නිසා, අද කන්තෝරුවේ නෑ.	Mrs. Silva is not in the office today, because she has work in Kandy.
මම පාස්පෝට් එක දෙන්නම්.	I'll give the passport, if you like.
	MRS. RANASINGHE
බොහොම ඉස්තුතියි. මම අනිද්දා වොෂිංටන්වලට යන නිසා, පාස්පෝට් එක දැන්ම අරන් යන්න ඕනෑ.	Thank you. I want to take the passport now because I am going to Washington the day after tomorrow.

NOTES ON STRUCTURE: the යි form of the verb; an idiomatic use of ඉන්නවා, 'be'; ගියා, 'went'; කවුරු, 'who'; -ත, 'also'; නැත්නම්, 'or, otherwise'; plural third person pronominal forms; නිවාඩු, 'on leave.'

1. යි forms of the verb as in ලබන සුමානේ එයි , 'he'll come next week', occur with second and third person subjects. They refer to future time and usually convey a sense of uncertainty. The formation and use of this form are discussed in Sinhala Structures, section 2.13.

2. මහත්තයා ඉන්නවා ද? , has the idiomatic meaning 'Is the gentleman in (or around)?' This expression is commonly used when telephoning or calling at an office or residence.

3. ගියා , 'went', is the past tense form of යනවා, 'go'. It is an irregular form. See Sinhala Structures, section 2.4.

4. කවුරුවත් means 'someone'; කවුරුවත් නෑ , 'no one'. These are forms of කවුරු , 'who'. See the discussion in Sinhala Structures, section 3.22.

5. ත is added to words to give the meaning 'too' or 'also'. For example, මමත් යනවා , 'I am going too.' Negatively, it can mean 'either', as in නෝනා මහත්තයාත් කන්තෝරුවේ නෑ , 'The lady isn't in the office either.' For a discussion of this particle, see Sinhala Structures, section 5.1.

6. නැත්නම් means 'or' or 'otherwise'. See Sinhala Structures, section 5.6.

7. එයාලා, those people, they', is the plural animate form of එයා , 'he, she'. For a discussion see Sinhala Structures, section 3.22.

8. නිවාඩු occurs above with the meaning 'on leave'. It takes an actor in the dative case. Thus, මහත්තයාට නිවාඩු,'the gentleman is on leave.'

SUMMARY

PRACTICING PATTERNS FROM DIALOGUE VI

A. Substitution Drill

Model:	I	මහත්තයාට අද නිවාඩු.	The gentleman is on leave today.
	S	මහත්තයාට අද නිවාඩු.	The gentleman is on leave today.
	I	සිල්වා නෝනා මහත්තයා.	Mrs. Silva.
	S	සිල්වා නෝනා මහත්තයාට අද නිවාඩු.	Mrs. Silva is on leave today.

1 මහත්තයාට අද නිවාඩු. (සිල්වා නෝනා මහත්තයා) [Mrs. Silva]

2 සිල්වා නෝනා මහත්තයාට අද නිවාඩු. (මම) [I]

3 මට අද නිවාඩු. (එයා) [he]

4 එයාට අද නිවාඩු. (එයාලා) [they]

5 එයාලාට අද නිවාඩු.

B. Transformation Drill

Model:	I එයා වැඩ ඉවර කරනවා.	He is finishing the work.
	S එයා වැඩ ඉවර කරන නිසා.	Because he is finishing the work.

1	එයා වැඩ ඉවර කරනවා. He is finishing the work.	එයා වැඩ ඉවර කරන නිසා. Because he is finishing the work.
2	එයා නිවාඩුවට යනවා. He is going on vacation.	එයා නිවාඩුවට යන නිසා. Because he is going on vacation.
3	මහත්තයා කතාකරන්න පටන් ගන්නවා. The gentleman is starting to speak.	මහත්තයා කතාකරන්න පටන් ගන්න නිසා. Because the gentleman is starting to speak.
4	මට වැඩ තියෙනවා. I have work.	මට වැඩ තියෙන නිසා. Because I have work.
5	මට තැපැල් කන්තෝරුවට යන්න ඕනෑ. I want to go to the post office.	මට තැපැල් කන්තෝරුවට යන්න ඕනෑ නිසා. Because I want to go to the post office.
6	වැඩ. The work.	වැඩ නිසා. Because of the work.

C. Response Drill

Model:	I මහත්තයා එන්නේ නැත්තේ, මොකද?	Why aren't you coming, sir?
	S මම වැඩ ඉවර කරන නිසා.	Because I am finishing the work.

1	මහත්තයා එන්නේ නැත්තේ මොකද? Why aren't you coming, sir?	මම වැඩ ඉවර කරන නිසා. Because I am finishing the work.
2	මහත්තයා එන්නේ නැත්තේ මොකද? Why aren't you coming, sir?	මම නිවාඩුවට යන නිසා. Because I am going on vacation.
3	මහත්තයා එන්නේ නැත්තේ මොකද? Why aren't you coming, sir?	මහත්තයා කතාකරන්න පටන් ගන්න නිසා. Because the gentleman is starting to speak.
4	මහත්තයා එන්නේ නැත්තේ මොකද? Why aren't you coming, sir?	මට වැඩ තියෙන නිසා. Because I have work.
5	මහත්තයා එන්නේ නැත්තේ මොකද? Why aren't you coming, sir?	මට තැපැල් කන්තෝරුවට යන්න ඕනෑ නිසා. Because I want to go to the post office.
6	මහත්තයා එන්නේ නැත්තේ මොකද? Why aren't you coming, sir?	වැඩ නිසා. Because of the work.

D. Response Drill

Model:	I සිල්වා නෝනා මහත්තයා පාස්පෝට් එක අරන් යන්නේ කවදා ද?	When will Mrs. Silva take the passport?
	S හෙට අරන් යයි.	She is likely to take it tomorrow.

1	සිල්වා නෝනා මහත්තයා පාස්පෝට් එක් අරන් යන්නේ කවදා ද? When will Mrs. Silva take the passport?	හෙට අරන් යයි. She is likely to take it tomorrow.
2	එයා කන්තෝරුවට එන්නේ කවදා ද? When will he come to the office?	එයා අනිද්දා එයි. He is likely to come the day after tomorrow.
3	මහත්තයා අපට කියන්නේ කවදා ද? When will the gentleman tell us?	මහත්තයා අද කියයි. The gentleman is likely to tell today.
4	වැඩ ඉවර වෙන්නේ කීයට ද? At what time will the work be over?	පහට විතර ඉවර වෙයි. It is likely to be over about five.
5	මහත්තයා තැපැල් කන්තෝරුවට යන්නේ කීයට ද? At what time will the gentleman go to the P.O?	අටට පස්සේ යයි. He is likely to go after eight.
6	කවුද යන්නේ අමෙරිකාවට? Who is going to the United States?	මහත්තයා විතරක් යයි. Only the gentleman is likely to go.

E. Substitution Drill

Model:	I මමත් යන්න බලාපොරොත්තු වෙනවා.	I too am expecting to go.
	S මමත් යන්න බලාපොරොත්තු වෙනවා.	I too am expecting to go.
	I එයාලා.	They.
	S එයාලාත් යන්න බලාපොරොත්තු වෙනවා.	They too are expecting to go.

1 මමත් යන්න බලාපොරොත්තු වෙනවා. (එයාලා) [they]

2 එයාලාත් යන්න බලාපොරොත්තු වෙනවා. (මහත්තයා) [the gentleman]

3 මහත්තයාත් යන්න බලාපොරොත්තු වෙනවා. (මෙයා) [this person]

4 මෙයාත් යන්න බලාපොරොත්තු වෙනවා. (අපි) [we]

5 අපිත් යන්න බලාපොරොත්තු වෙනවා. (මිනිස්සු) [people, men]

6 මිනිස්සුත් යන්න බලාපොරොත්තු වෙනවා.

SEATED BUDDHA, DAMBULLA ROCK TEMPLES

CYCLE 41

WHAT IS THE DATE TODAY?

M-1

අගෝස්තු මාසේ තුන්වෙනිදා.	The 3rd of August.
සැප්තැම්බර් මාසේ හතරවෙනිදා.	The 4th of September.
ජුලි මාසේ විසිපස්වෙනිදා.	The 25th of July.
ඔක්තෝබර් මාසේ දහවෙනිදා.	The 19th of October.

M-2

අද කීවෙනිදා ද?	What is the date today?

C-1

From now on, each day, the instructor will ask the students: අද කීවෙනිදා ද? and teach them the appropriate numeral. Both cardinal and ordinal numerals are treated in Sinhala Structures so if students are curious they can look up the appropriate number before class. See section 6.2.

A. අද කීවෙනිදා ද?

B. (සැප්තැම්බර් මාසේ හතරවෙනිදා.)

CYCLE 42

WHEN WERE YOU BORN SIR?
AND WHERE?

M-1

මම ඉපදුනේ එක්දාස් නමසිය හතලිස් පහේ.	I was born in 1945.
මම ඉපදුනේ එක්දාස් නමසිය හතලිස් එකේ.	I was born in 1941.
මම ඉපදුනේ එක්දාස් නමසිය තිස් නමේ.	I was born in 1939.
මම ඉපදුනේ එක්දාස් නමසිය හතලිස් අටේ.	I was born in 1948.
මම ඉපදුනේ ලංකාවේ.	I was born in Sri Lanka.
මම ඉපදුනේ එක්සත් ජනපදයේ.	I was born in the United States.

M-2

මහත්තයා ඉපදුනේ කවදා ද?	When were you born, sir?
මහත්තයා ඉපදුනේ මොන අවුරුද්දේ ද?	In what year were you born, sir?
නෝනා මහත්තයා ඉපදුනේ කොහේ ද?	Where were you born, madam?

C-1

Students should use the formulas given above to construct conversations according to the following model:

A. (මහත්තයා) ඉපදුනේ කොහේ ද?

B. මම ඉපදුනේ (ලංකාවේ).

NOTES ON STRUCTURE: උපදිනවා , 'be born'; expressing the year; numerals in the genitive case.

1. ඉපදුනේ is an emphatic past tense form (see Sinhala Structures, section 2.42) of උපදිනවා , 'be born'. The form is irregular.

2. එක්දාස් නමසිය above means 'one thousand, nine hundred.' At this point students should memorize it as an unanalyzed phrase. It may be prefixed to the numerals 1-99 to express the years of this century. See Sinhala Structures, section 6 for further details.

3. The numerals above are in the genitive case to give the meaning '*in* such and such a year.' Thus, හතලිස් එකේ , 'in '41.'

CYCLE 43

WERE YOU BORN IN THE UNITED STATES?

M-1

මගේ අම්මා ඉපදුනේත් එක්සත් ජනපදයේ.	My mother was also born in the United States.
මගේ තාත්තා ඉපදුනේත් අමෙරිකාවේ.	My father was also born in America.
මම ඉපදුනේත් බොස්ටන්වල.	I was also born in Boston.

M-2

නෑ. මම ඉපදුනේත් බොස්ටන්වල නෙමෙයි.	No, I was not born in Boston either.
නෑ. මම ඉපදුනේත් වොෂිංටන්වල නෙමෙයි.	No, I was not born in Washington either.
නෑ. මම ඉපදුනේත් ලංකාවේ නෙමෙයි.	No, I was not born in Sri Lanka either.

M-3

මහත්තයා ඉපදුනේ එක්සත් ජනපදයේ ද?	Were you born in the United States?
දෙමව්පියෝ ඉපදුනේත් එහේ ද?	Were your parents born there too?
අර මහත්තයා ඉපදුනේ එක්සත් ජනපදයේ ද?	Was that gentleman born in the United States?
එයාගේ දෙමව්පියෝ ඉපදුනේත් එහේ ද?	Were his parents born there too?

C-1

Students should discuss the citizenship of others in the class, according to the following model.

C-1 (continued)

A. (මහත්තයා) ඉපදුනේ (ලංකාවේ) ද?

B. (ඔව්.) මම ඉපදුනේ (ලංකාවේ).

A. දෙමව්පියෝ ඉපදුනේත් (ලංකාවේ) ද?

B. (ඔව්.) දෙමව්පියෝ ඉපදුනේත් (ලංකාවේ).

NOTES ON STRUCTURE: ත්, 'also'.

In this cycle ත්, 'also', is affixed to the verb form. For example:

මම ඉපදුනේත් බොස්ටන්වල. I was also born in Boston.

A discussion of this particle appears in Sinhala Structures, section 5.1.

BUDDHA STATUE AT ATADAGE, POLONNARUWA

CYCLE 44

ARE YOU AN AMERICAN CITIZEN?

M-1

මම අමෙරිකන් පුරවැසියෙක්.	I am an American citizen.
ඔව්. මම නිව්යෝර්ක්වල ඉපදුන නිසා මම අමෙරිකන් පුරවැසියෙක්.	Yes. I am an American citizen because I was born in New York.
ඔව්. 1931 දී මගේ අම්මාට පුරවැසිභාවය ලැබුන නිසා මගේ අම්මා පුරවැසියෙක්.	Yes. My mother is a citizen because she was naturalized in 1931.

M-2

ඔව්. මම කැනඩාවේ ඉපදුනත් මම අමෙරිකන් පුරවැසියෙක්.	Yes. Even though I was born in Canada, I am an American citizen.
ඔව්. මම ලංකාවේ පදිංචිවෙලා හිටියත් මම අමෙරිකන් පුරවැසියෙක්.	Yes. Even though I live in Sri Lanka, I am an American citizen.
නෑ. මම ලංකාවේ පදිංචිවෙලා හිටියත් මම ලංකාවේ පුරවැසියෙක් නෙමෙයි.	No. I am not a citizen of Sri Lanka, even though I live in Sri Lanka.

M-3

මහත්තයා ලංකාවේ පුරවැසියෙක් ද?	Are you a citizen of Sri Lanka?
මහත්තයා එක්සත් ජනපදයේ පුරවැසියෙක් ද?	Are you a citizen of the United States?
මහත්තයාගේ අම්මාත් අමෙරිකන් පුරවැසියෙක් ද?	Is your mother an American citizen too?
මහත්තයාගේ තාත්තාත් අමෙරිකන් පුරවැසියෙක් ද?	Is your father an American citizen?

C-1

Students should discuss the citizenship of other students in the class using the models given above in the M- phase.

A. (මහත්තයා) (ඇමෙරිකන්) පුරවැසියෙක් ද?

B. ඔව්. මම (ලංකාවේ) ඉපදුනත් මම (ඇමෙරිකන්) පුරවැසියෙක්.

NOTES ON STRUCTURE: the 'even though, even if' form of the verb; the past verbal adjective with නිසා , 'because'; පදිංචිවෙලා ඉන්නවා, 'reside, be residing'; පුරවැසිභාවය ලැබෙනවා ,'receive citizenship'.

1. The 'even if, even though' form is discussed in Sinhala Structures, section 2.10. It is based on the past tense (Sinhala Structures, section 2.4). In this lesson two forms based on the past tense appear. The simple past forms, the first two of which are irregular, are given below along with the 'even if' forms.

simple present form		simple past form	even if form
ඉන්නවා	be	හිටියා	හිටියත්
උපදිනවා	be born	ඉපදුනා	ඉපදුනත්
ලැබෙනවා	receive	ලැබුනා	ලැබුනත්

The 'even if' form is derived from the simple past by removing final ආ and adding ත් .

2. The past verbal adjective is discussed in Sinhala Structures, section 2.46. It may modify nouns. In this lesson it appears in construction with නිසා , 'because', to express past time. Note that the form which precedes නිසා is always (whether present or past in sense) an adjectival form of the verb, not the basic form. The past verbal adjective is formed from the simple past by removing final ආ and adding අ .

3. පදිංචිවෙලා ඉන්නවා means 'reside'. Its past form is පදිංචිවෙලා හිටියා.

4. The verb ලැබෙනවා means 'receive'. It appears here in පුරවැසිභාවය ලැබෙනවා , 'receive citizenship.' It takes an actor in the dative case.



A KANDYAN WEDDING PROCESSION

CYCLE 45

ARE YOU MARRIED?

M-1

ඔව්. කසාද බැඳලා.	Yes, married.
නෑ. කසාද බැඳලා නෑ.	No, not married.

M-2

මහත්තයා කසාද බැඳලා ද?	Are you married, sir?
නෝනා මහත්තයා කසාද බැඳලා ද?	Are you married, madam?

C-1

Students should ask each other questions according to the model below.

A. (මහත්තයා)
කසාද බැඳලා ද?

B. (ඔව්. මම
කසාද බැඳලා.)

or

(නෑ. මම
කසාද බැඳලා නෑ.)

C-2

Talking about other members of the class:

A. (මහත්තයා)
කසාද බැඳලා ද?

B. (නෑ. කසාද බැඳලා නෑ.)

NOTE ON STRUCTURE: කසාද බැඳලා , 'be married, have married.'

බැඳලා is the participle form (Sinhala Structures, section 2.6) of බඳිනවා , 'tie, bind.' This verb belongs to class 3. කසාද බැඳලා takes on the idiomatic meaning 'be married.'

CYCLE 46

(For married people only)

HOW LONG HAVE YOU BEEN MARRIED?

M-1

මම කසාද බැඳලා අවුරුද්දක් වෙනවා.	I have been married for one year.
මම කසාද බැඳලා අවුරුදු දෙකක් වෙනවා.	I have been married for two years.
මම කසාද බැඳලා අවුරුදු දහයක් වෙනවා.	I have been married for ten years.

M-2

කසාද බැඳලා කොච්චර කල් වෙනවා ද?	How long have you been married?
එයා කසාද බැඳලා අවුරුදු කීය ද?	How many years has he been married?

C-1

Students should ask each other questions according to the model below:

A. (කසාද බැඳලා කොච්චර කල් වෙනවා ද?)

B. (මම කසාද බැඳලා (අවුරුදු දෙකක් වෙනවා.)

NOTES ON STRUCTURE: වෙනවා , 'become', with time expressions; කොච්චර , 'how much'.

1. The verb වෙනවා, 'become', occurs in time expressions. As in M-1 above there is often no idiomatic English equivalent. For example, the sentence මම කසාද බැඳලා අවුරුද්දක් වෙනවා literally means 'It becomes a year I have been married.' This type of construction has appeared previously in such expressions as හය වෙනකන්, 'till 6:00.' Here වෙනකන් is actually a form of the verb වෙනවා , 'become.' (See Sinhala Structures, section 2.33 for the 'until' form of the verb.)

2. කොච්චර , 'how much', is part of a set of related words (this much, that much) which is discussed in Sinhala Structures, section 3.3.

CYCLE 47

ARE YOUR PARENTS LIVING?

M-1

දෙමව්පියෝ ඉන්නවා.	Both parents are living.
අම්මා ඉන්නවා. එයාට අවුරුදු හැට පහයි.	My mother is living. She is 65 years old.
තාත්තා ඉන්නවා.	My father is living.

දෙමව්පියෝ මැරුණා	Both parents died.
අම්මා ගිය අවුරුද්දේ නැති උනා.	My mother passed away last year.

M-3

දෙමව්පියෝ ඉන්නවා ද?	Are your parents living?
අම්මා ඉන්නවා ද?	Is your mother living?
තාත්තත් ඉන්නවා ද?	Is your father living too?

C-1

Students in the class should exchange information about their families, using the formulas given above.

A. (අම්මා ඉන්නවා ද?)

B. (අම්මා ඉන්නවා.)

NOTES ON STRUCTURE: new past tense forms; 'die'; a further note on the use of ඉන්නවා , 'be'.

1. Two new past forms have appeared in this cycle:

simple present form		simple past	class
මැරෙනවා	die	මැරුණා*	2
නැති වෙනවා	pass away, get lost	නැති උනා	irregular

2. The expression නැති වෙනවා is often used as a euphemism for 'die'. It also means 'get lost'.

3. In this lesson an expression such as අම්මා ඉන්නවා ද?has the contextual meaning 'is your mother living.' Here ඉන්නවා has the meaning 'living, existing.'

*Past forms of class 2 nouns may be written either with the retroflex ණ or with න . The latter convention is generally followed in this book.



A FUNERAL



කීදෙනෙක් ඉන්නවා ද?

CYCLE 48

HOW MANY PEOPLE ARE THERE IN THIS ROOM?

M-1

හතර දෙනෙක් ඉන්නවා.	There are four people.
හත් දෙනෙක් ඉන්නවා.	There are seven people.
අට දෙනෙක් ඉන්නවා.	There are eight people.
දහ දෙනෙක් ඉන්නවා.	There are ten people.
නම දෙනෙක් ඉන්නවා.	There are nine people.

M-2

මේ කාමරේ කීදෙනෙක් ඉන්නවා ද?	How many people are there in this room?
මේ කාමරේ ගෑනු කීදෙනෙක් ඉන්නවා ද?	How many women are in this room?
මේ කාමරේ පිරිමි කීදෙනෙක් ඉන්නවා ද?	How many men are in this room?

C-1

Students should construct conversations of the following type, according to the formulas given above:

A. මේ කාමරේ කීදෙනෙක් ඉන්නවා ද?

B. (හත් දෙනෙක්) ඉන්නවා.

NOTES ON STRUCTURE: animate numerals and question words; ඉන්නවා, 'be'.

1. Examples of animate numerals appear above. They are discussed in Sinhala Structures, section 1.52 and section 6. The form කීදෙනෙක් means 'how many' and refers to animates only.

2. The verb ඉන්නවා, 'be' takes animate subjects only whereas තියෙනවා, 'be', takes inanimate subjects. Compare:

මේ කාමරේ පිරිමි පස් දෙනෙක් ඉන්නවා.	There are five men in this room.
මේ කාමරේ පොල් ගෙඩි පහක් තියෙනවා.	There are five coconuts in this room.

Further discussion appears in Sinhala Structures, section 1.52.

CYCLE 49

DO YOU HAVE ANY CHILDREN, SIR?

M-1

ළමයි තුන් දෙනෙක් ඉන්නවා.	There are 3 children.
ළමයි දෙන්නෙක් ඉන්නවා.	There are 2 children.
ළමයි හතර දෙනෙක් ඉන්නවා.	There are 4 children.
එක පුතෙක් ඉන්නවා.	There is one son.
පුත්තු දෙන්නෙක් ඉන්නවා.	There are 2 sons.
පුත්තු තුන් දෙනෙක් ඉන්නවා.	There are 3 sons.
එක දුවෙක් ඉන්නවා.	There is one daughter.
දුලා දෙන්නෙක් ඉන්නවා.	There are 2 daughters.
දුලා තුන් දෙනෙක් ඉන්නවා.	There are 3 daughters.
ළමයි නෑ.	There are no children.

M-2

මහත්තයාට ළමයි ඉන්නවා ද?	Do you have any children, sir?
නෝනා මහත්තයාට ළමයි ඉන්නවා ද?	Do you have any children, madam?

C-1

Students should construct conversations of the following type using the formulas given above:

A. (මහත්තයාට) ළමයි ඉන්නවා ද?

B. (ළමයි තුන් දෙනෙක් ඉන්නවා.)

NOTES ON STRUCTURE: ඉන්නවා meaning 'have' with an actor in the dative case; reviewing animate numerals.

1. An expression such as මට ළමයි දෙන්නෙක් ඉන්නවා literally means 'to me there are two children.' Idiomatically it takes on the meaning 'I have two children.'

2. Now is the time for students to review animate numerals in Sinhala Structures, section 6 and to begin memorizing them.

171

CHILDREN ON THEIR WAY TO SCHOOL

CYCLE 50

DO YOU HAVE ANY BROTHERS?

M-1

අයියලා තුන් දෙනෙක් ඉන්නවා.	There are three older brothers.
මල්ලිලා දෙන්නෙක් ඉන්නවා.	There are two younger brothers.
මට අයියා කෙනෙකුයි මල්ලි කෙනෙකුයි ඉන්නවා.	I have an older brother and a younger one.

M-2

අයියලා නෑ.	No older brothers.
මල්ලිලා නෑ.	No younger brothers.

M-3

සහෝදරයෝ ඉන්නවා ද?	Do you have brothers?
සහෝදරයෝ කීදෙනෙක් ඉන්නවා ද?	How many brothers do you have?

C-1

Students should ask each other questions according to the following model:

A. (අයියලා) ඉන්නවා ද?

B. (ඔව්. දෙන්නෙක් ඉන්නවා)

or

(නෑ. අයියලා නෑ)

NOTE ON STRUCTURE: review

The structures which appear in this lesson should be familiar. Students should take this opportunity to review animate numerals. A number of plural forms appear in this lesson. Students are reminded that plurals must be memorized.

YOUNG GIRLS AT THE NEW YEAR

CYCLE 51

DO YOU HAVE ANY SISTERS?

M-1

අක්කලා දෙන්නෙක් ඉන්නවා.	There are two older sisters.
නංගිලා තුන් දෙනෙක් ඉන්නවා.	There are three younger sisters.
දෙන්නෙක් ඉන්නවා.	There are two.
අක්කලා තුන් දෙනෙක් ඉන්නවා.	There are three older sisters.
සහෝදරියෝ නෑ.	No sisters.
අක්කා කෙනෙක් ඉන්නවා.	There is an older sister.

M-2

සහෝදරියෝ ඉන්නවා ද?	Do you have any sisters?
සහෝදරියෝ කීදෙනෙක් ඉන්නවා ද?	How many sisters do you have?
නංගිලා කීදෙනෙක් ඉන්නවා ද?	How many younger sisters do you have?
අක්කලා කීදෙනෙක් ඉන්නවා ද?	How many older sisters do you have?

C-1

Students should ask each other questions according to the following model:

A. (අක්කලා) ඉන්නවා ද?

B. (ඔව්. ඉන්නවා.)

A. (අක්කලා) කීදෙනෙක් ඉන්නවා ද?

B. (තුන් දෙනෙක්) ඉන්නවා.

CYCLE 52

PROBLEMS IN ARITHMETIC

M-1

මිනිස්සු හය දෙනෙක් හිටියා.	There were six men.
දෙන්නෙක් ගියා.	Two went.
කීදෙනෙක් ඉන්නවා ද?	How many (men) are there?
මිනිස්සු හතර දෙනෙක් හිටියා.	There were four men.
එක්කෙනෙක් ගියා.	One went.
කීදෙනෙක් ඉන්නවා ද?	How many are there?
මිනිස්සු දහ දෙනෙක් හිටියා.	There were ten men.
තුන් දෙනෙක් මැරුණා.	Three died.
කීදෙනෙක් ඉන්නවා ද?	How many are there?
ගෙදර ලමයි පස් දෙනෙක් හිටියා.	There were five children in the house.
දෙන්නෙක් ඉස්කෝලේ ගියා.	Two went off to school.
ගෙදර කීදෙනෙක් ඉන්නවා ද?	How many are in the house?
මිනිස්සු පස් දෙනෙක් හිටියා.	There were five men.
තව දෙන්නෙක් ආවා.	Two more came.
මිනිස්සු කීදෙනෙක් ඉන්නවා ද?	How many men are there?

C-1

Each student should make up problems in addition and subtraction based on the above M sentences. Then a student should present a problem. Another student should give the answer. For example:

A. ළමයි හතර දෙනෙක් හිටියා.

දෙන්නෙක් ගියා.

කීදෙනෙක් ඉන්නවා ද?

B. දෙන්නෙක් ඉන්නවා.

NOTE ON STRUCTURE: ආවා, 'came'.

The simple past form of එනවා, 'come', is ආවා. It is an irregular form.

CYCLE 53

WHAT DO YOU CALL YOUR MOTHER'S MOTHER?

M-1

අම්මාගේ අම්මාට අපි කියන්නේ ආච්චි කියලා.	We call mother's mother aacci.
තාත්තාගේ අම්මාටත් අපි කියන්නේ ආච්චි කියලා.	We call father's mother aacci also.
අම්මාගේ තාත්තාට අපි කියන්නේ සීයා කියලා.	We call mother's father siiya.
තාත්තාගේ තාත්තාටත් අපි කියන්නේ සීයා කියලා.	We call father's father siiya also.
තාත්තාගේ අයියාට අපි කියන්නේ ලොකු අප්පච්චි කියලා.	We call father's older brother loku appacci.
අයියා බැඳලා ඉන්න එක්කෙනාට අපි කියන්නේ නෑනා කියලා.	We call the person married to our aiyya, naeaena.
නංගි බැඳලා ඉන්න එක්කෙනාට අපි කියන්නේ මස්සිනා කියලා.	We call the person married to our nangi, massina.

M-2

අම්මාගේ අම්මාට කියන්නේ මොකද්ද?	What do you call your mother's mother?
තාත්තාගේ අයියාට කියන්නේ මොකද්ද?	What do you call your father's older brother?
අයියා බැඳලා ඉන්න එක්කෙනාට කියන්නේ මොකද්ද?	What do you call the person married to your aiyya?

C-1

This is a good opportunity for students to find out what the various kinship terms in Sinhala are. Some have already been introduced. The rest should be elicited from the instructor. Different instructors may use different words for father, for in-laws and for grandparents.

A. (අම්මාගේ අම්මාට) කියන්නෙ මොකද්ද?

B. (ආච්චි) කියලා කියනවා.

NOTES ON STRUCTURE: the present verbal adjective; බැඳලා ඉන්නවා, 'be married'; the extension of kinship terms to non-relatives.

1. The present verbal adjective is discussed in Sinhala Structures, section 2.3. ඉන්න above in අයියා කසාද බැඳලා ඉන්න එක්කෙනාට 'to the person married to older brother', is the verbal adjective of ඉන්නවා, 'be'.

2. The participle plus forms of the verb ඉන්නවා, 'be' are durative forms. The implication is that an action which began in the past continues or continued. මම කසාද බැඳලා ඉන්නවා, I've married and I continue to be married now' is an example of such a construction. A discussion of this construction and further examples appear in Sinhala Structures, section 2.612.

3. Kinship terms acquire an importance for the learner above and beyond the description of his own family since the Sinhalese frequently extend them to non-relatives. An old man met casually on the road, for example, may be addressed as 'grandfather.' 'Son' and 'daughter' are sometimes extended as affectionate terms to the children of others. Good friends of the family are known as 'uncles' and 'aunts' to the children.

SUMMARY

TALKING TO A "MONOLINGUAL"

Using the language skills now at their disposal, students should try to find out as much about the instructor as possible. The instructor must play the role of a monolingual Sinhala speaker students have met - that is, for present purposes, the instructor has no understanding of English and is neither interested in correcting the students nor able to do so. It may be more interesting for the class if the instructor plays the role of a fictitious person. If the questions asked are intelligible, even if partially ungrammatical, the "monolingual" should answer them. If they are judged to be unintelligible, the "monolingual" should shrug his shoulders, look blank or give some other non-verbal indication that he has not understood. It may be necessary for students to try several times in order to get the "monolingual" to understand. They may discuss how to rephrase the questions among themselves if their first attempts to communicate do not succeed.

This exercise will give students a preview of the trial and error situation which is found outside the classroom. The important point of this exercise is that the goal in learning a language is to get messages across. The most important grammatical errors are those which obstruct communication. Unlike the teacher, the average Sinhala speaker is not interested in testing or correcting the learner, but in understanding the message.

Ideas for the instructor. If the instructor chooses to play a fictitious person he or she should think up an occupation, place of residence, family history and a purpose for being in Colombo. For example: a postmaster from the Eastern Province who is married, has five children and has come to Colombo to see his father who works in Customs; a schoolteacher who works in Kandy who has come to the Embassy to obtain a visa, and so on. The instructor should not wander too far afield from the basic vocabulary which has been learned by the students. On the other hand, the judicious inclusion of at least a few unknown words will test their resources.

Ideas for the students. Who is this person? What is his or her name? age? place of origin? reason for being in Colombo or wherever instruction is taking place? What kind of work does this person do? Where? Is he or she married? Are there children? When were they born? How old are they? Are the parents living? Are they working?

SUMMARY

CONDUCTING AN INTERVIEW: THE FAMILY HISTORY

One class member, preferably the instructor, should be the subject of this interview. The rest of the students should find out as much about the family in question as is now possible. One student should be at the blackboard to keep track of the information. If possible, each student should have the opportunity to be the subject of an interview in front of the class. If the class is very large, students should form groups, obtain the information, and report back to the rest of the class. Students should give information not only on their own families, but on those of their parents. Cousins, aunts, uncles and grandparents should also be discussed.

Sample Interview

A. මහත්තයාගේ නම මොකද්ද?	What is your name, sir?
B. මගේ නම ජෝන් ජෝන්ස්.	My name is John Jones.
A. වයස කීය ද?	How old are you?
B. අවුරුදු විසි දෙකයි.	22 years.
A. දෙමව්පියෝ ඉන්නවා ද?	Are your parents living?
B. ඔව්. දෙන්නාම ඉන්නවා.	Yes. Both are living.
A. ඒගොල්ල ඉන්නේ කොහේ ද?	Where do they live?
B. කැලිෆෝර්නියාවේ.	In California.
A. අම්මාට වයස කීය ද?	How old is your mother?
B. පනස් දෙකක් විතර වෙයි.	Must be about 52.
A තාත්තාට වයස කීය ද?'	How old is your father?
B. පනස් පහයි.	55.
A. සහෝදරයෝ ඉන්නවා ද?	Do you have brothers?
B. ඔව්.	Yes.

A.	කී දෙනෙක් ඉන්නවා ද?	How many?
B.	පස් දෙනෙක් ඉන්නවා.	There are five.
	මල්ලිලා දෙන්නයි.	Two younger brothers.
	අයියලා තුන් දෙනයි.	And three older ones.
A.	කසාද බැඳලා ද?	Married?
B.	මම ද?	Me?
A.	ඔව්.	Yes.
B.	නෑ. කසාද බැඳලා නෑ.	No. Not married.
A.	අම්මාගේ අම්මා ඉන්නවා ද?	Is your mother's mother living?
B.	ආච්චි නෑ.	aacci isn't living.
A.	අයියලා කසාද බැඳලා ද?	Are your older brothers married?
B.	එක්කෙනෙක් කසාද බැඳලා.	One is married.
A.	එයාගේ නම මොකද්ද?	What's his name?
B.	රොබට් ජෝන්ස්.	Robert Jones.
A.	එයා බැඳලා ඉන්න එක්කෙනාගේ නම මොකද්ද?	What's his wife's name?
B.	මේරි.	Mary.
A.	ළමයි ඉන්නවා ද?	Are there any children?
B.	පුතෙක් ඉන්නවා.	There is a son.
A.	පුතාට වයස කීය ද?	How old is the son?
B.	දෙකක් විතර වෙයි.	Must be about two.
A.	සහෝදරියෝ ඉන්නවා ද?	Any sisters?
B.	මට ද?	To me?
A.	ඔව්.	Yes.
B.	නෑ.	No sisters.

A.	මහත්තයා ඉපදුනේ කොහේ ද?	Where were you born?
B.	කැනඩාවේ.	In Canada.
A.	කැනඩාවේ පුරවැසියෙක් ද?	Are you a Canadian citizen?
B.	නෑ. මම කැනඩාවේ පුරවැසියෙක් නෙමෙයි. මම කැනඩාවේ ඉපදුනත් මගේ දෙමව්පියෝ ඇමෙරිකන්. ඒ නිසා මම ඇමෙරිකන් පුරවැසියෙක්.	No, I'm not a Canadian citizen. Even though I was born in Canada, my parents were American. So I'm an American citizen.
A.	මහත්තයාගේ සහෝදරයොත් ඇමෙරිකන් පුරවැසියෝ ද?	Are your brothers American citizens too?
B.	ඔව්.	Yes.



ENTRANCE TO THE SIGIRIYA ROCK FORTRESS

HIRDARAMANI
SINGER
VELONA

CHATHAM STREET, COLOMBO FORT

CYCLE 54

HOW DID YOU COME HERE SIR?

M-1

මම පන්තියට ආවේ බස් එකෙන්.	I came to class by bus.
මම මෙහාට ආවේ කෝච්චියෙන්.	I came here by train.
මම ලංකාවට ආවේ අහස්යත්‍රාවෙන්.	I came to Sri Lanka by plane.
මම රස්සාවට ආවේ කාර් එකෙන්.	I came to work by car.
මම ආවේ මෙට්‍රෝ එකෙන්.	I came by Metro.

M-2

නෑ. මම මෙහාට ආවේ කෝච්චියෙන් නෙමෙයි.	No. I did not come here by train.
නෑ. මම මෙහාට ආවේ බස් එකෙන් නෙමෙයි.	No. I did not come here by bus.

M-3

මහත්තයා මෙහාට ආවේ මොකෙන් ද?	By what means (how) did you come here sir?
අර මහත්තයා මෙහාට ආවේ මොකෙන් ද?	By what means did that gentleman over there come here?
මහත්තයා මෙහාට ආවේ බස් එකෙන් ද?	Did you come here by bus, sir?

C-1

Students should find out how the others got to the area in which the class is located. Find out how they got from home to class today.

A. මහත්තයා මෙහාට ආවේ මොකෙන් ද?

B. මම මෙහාට ආවේ (බස් එකෙන්)

NOTES ON STRUCTURE: instrumental forms; ආවේ, 'came'; මෙහා, 'here';
1. මොකෙන් , 'by what means', and the emphasized nouns in M-1 are in the instrumental case.
2. ආවේ is a past emphatic verb form. See Sinhala Structures, section 2.21 on past emphatics.
3. මෙහාට, 'to this direction, here', is the dative form of මෙහා, 'here, this direction, side'. See Sinhala Structures, section 3.

කොල්ලුපිටියේ ඉඳලා ඇස් ඉස්පිරිතාලේට යන්නේ මොන බස් එකෙන් ද?



LIPTON CIRCUS, COLOMBO

CYCLE 55

USING THE COLOMBO BUS SYSTEM

M-1

කොල්ලුපිටිය හන්දියේ ඉඳලා ලිප්ටන් සර්කස් එකට නොම්මර එකසිය හතලිහේ බස් එකෙන් යන්න පුලුවන්.	You can go to Lipton Circus from Colpetty Junction by bus number 140.
මෙතන ඉඳලා තෝමස් කුක්ස් කන්තෝරුවට නොම්මර එකසිය දොලහේ බස් එකෙන් යන්න පුලුවන්.	You can go from here to Thomas Cooks by bus number 112.
ගාලු පාරේ ඉඳලා කොටුවට නොම්මර සීයේ බස් එකෙන් යන්න පුලුවන්.	You can go from Galle Road to the Fort by bus number 100.
අමෙරිකන් තානාපති කාර්යාලයට නොම්මර එකසිය දෙකේ බස් එකෙන් යන්න පුලුවන්.	You can go to the American Embassy by bus number 102.
කොටුවේ ඉස්ටේසමට නොම්මර එකසිය තිස් හතරේ බස් එකෙන් යන්න පුලුවන්.	You can go to the Fort Railway Station by bus number 134.

M-2

ජී. පි. ඕ. එකට නොම්මර එකසිය හයේ බස් එකෙන් යන්න බැ.	You cannot go to the G.P.O. by bus number 106.
වෝඩ් ප්ලේස් එකට නොම්මර එකසිය හැත්තෑ හතේ බස් එකෙන් යන්න බැ.	You cannot go to Ward Place by bus number 177.

M-3

විශ්වවිද්‍යාලයට නොම්මර එකසිය තිස් අටේ බස් එකෙන් යන්න පුලුවන් ද?	Can you go to the University by bus number 138?
නොම්මර එකසිය හැත්තෑ හතේ බස් එකෙන් හෝර්ටන් ප්ලේස් එකට යන්න පුලුවන් ද?	Can you go to Horton Place by bus number 177?
මේ බස් එකෙන් රිගල් සිනමා එකට යන්න පුලුවන් ද?	Can you go to the Regal Cinema by this bus?
නොම්මර එකසිය තිස් දෙකේ බස් එකෙන් ජාවත්ත පාරට යන්න පුලුවන් ද?	Can you go to Jawatte Road by bus number 132?

M-4

වෝඩ් ප්ලේස් එකට යන්න පුළුවන් මොන බස් එකෙන් ද?	By what bus can you go to Ward Place?

C-1

Students should use the formulas they have learned to discuss the bus route maps in the textbook.

A. (කොටුවට) යන්න පුළුවන් මොන බස් එකෙන් ද?

B. (එකසිය දොළහේ) බස් එකෙන් යන්න පුළුවන්.

TRAVELING NEAR RAMBODA PASS

NOTE ON STRUCTURE: පුළුවන් , 'can', and බැ , 'can't'.

පුළුවන් , 'can', and බැ , 'can't', take actors in the dative case. See Sinhala Structures, section 2.14.2.


BUS SERVICES
COLOMBO & ENVIRONS
COLOMBO FORT
PETTAH
BEIRA LAKE
BORELLA
NARAHENPITA
LAKE
SEA

COLOMBO CITY AND SUBURBAN BUS ROUTES

100	PANADURA - PETTAH
101	KATUBEDDA - WATTALA
102	KOTAHENA - LUNAWA
103	NARAHENPITA - FORT
104	BAMBALAPITIYA - WATTALA
105	ATTIDIYA - KOTAHENA
106	KOTAHENA - PANADURA
107	KALUBOWILA - ELAKANDA
108	KOTTAWA - FORT
109	WATTALA - BORALESGAMUWA
111	NARAHENPITA - BAMBALAPITIYA
112	MAHARAGAMA - FORT
113	JUBILIEE POST - FORT
114	PITAKOTTE - PETTAH (VIA PAGODA)
115	PITAKOTTE - PETTAH (VIA JUBILIEE POST)
116	PILIYANDALA - MATTAKKULIYA
120	KESBEWA - PETTAH
130	KOLONNAWA - FORT
131	WIJERAMA - KOLONNAWA
132	ZOO (KARAGAMPITIYA) - MAWARA MANDIYA
133	PANADURA - FORT
134	ANGODA - GALKISSA
135	KOHUWALA - KELANIYA
137	JA - ELA - VIHARALANE
138	HOMAGAMA - PETTAH
139	PILIYANDALA - FORT
140	KOLLUPITIYA - KADUWELA
141	NARAHENPITA - WELLAWATTA
143	HANWELLA - PETTAH
144	NUGEGODA - WELLAWATTA
146	VELUWANAPURA - FORT
147	MT. LAVINIA - KALUBOWILA
150	ANGODA - MUTTIAH ROAD
151	AMBATALE - PETTAH
152	KOSWATTA - PETTAH
153	PITAKOTTE - JETTY
154	MT. LAVINIA - KIRIBATHGODA
155	RATMALANA - MATTAKKULIYA
156	DEHIWALA - WELLAWATTA
160	BATTARAMULLA - RASAMUNAKANDA
164	HIMBUTANA - TOWN HALL
165	KADUWELA - POLHENGODA
166	MATTAKKULIYA - FORT
166	ANGODA MENTAL HOSPITAL - FORT
167	DEHIWALA - THOTALANGA
168	NUGEGODA - KOTAHENA
169	NAWALA - FORT
170	ATURUGIRIYA - FORT
171	BATTARAMULLA - JETTY
172	MORAGASMULLA - BORELLA
173	PITA KOTTE - THOTALANGA
174	KOTTAWA - BORELLA
175	KOTTANGAHA JUNCTION - KOLLUPITIYA R. S.
176	KARAGAMPITIYA - KOTAHENA
177	KADUWELA - PETTAH
178	NARAHENPITA - MATTAKKULIYA
179	RAJAGIRIYA - BAMBALAPITIYA R. S.
186	HANWELLA - TOWN HALL
188	KANDANA - KOMPANNAWEEDIYA
190	MEEGODA - PETTAH
193	KADAWATA - BAMBALAPITIYA
194	RAGAMA - DEHIWALA
195	NUGEGODA - HETTIYAWATTA
197	KETAWALAMULLA - MORATUWA
198	DEHIWALA - BATTARAMULLA
199	MITTAMBUWA - FORT
224	BIYAGAMA - PETTAH
230	SAPUGASKANDA - PETTAH
235	KELANIYA - PETTAH
240	NEGOMBO - PETTAH
253	IHALA WELIKADA - BORELLA
260	WATTALA - PETTAH
261	KADAWATA - PETTAH
262	RAGAMA - PETTAH
274	BOPITIYA - PETTAH
275	BOPITIYA - PETTAH


HARBOUR
N.H.M. ABDUL CADER RD
MAIN STREET
FRONT STREET
OLCOTT MAVATA
Fort Railway Station
D. R. WIJEWARDENA MAVATA
BEIRA LAKE
Canal
LOTUS ROAD
Y. M. B. A.
G. T. O.
DUKE STREET
Times
Y. M. C. A.
BRISTOL STREET
Lake House
C GARDINER MAV
Regal Theatre
LEYDEN BASTION ROAD
SIR BARON JAYATILAKA MAVATA
LOWER CHATHAM STREET
Dept. of Buildings
YORK STREET
CHURCH STREET
Hotel Taprobane
New Secretariat
General Post Office
MUDALIGE MAVATA
Laksala
CHATHAM STREET
HOSPITAL ST
CANAL ROW
Cargills
ECHELON BARRACKS
LOTUS ROAD
Secretariat
BALADAKSHA MAVATA
National State Assembly
JANADHIPATHI MAVATA
Janadhipathi Medura
FLAG STAFF STREET
GALLE BUCK ROAD
UPPER CHATHAM ST
Central Bank
Hotel Ceylon Intercontinental
MARINE DRIVE
SEA

FORT BUS ROUTES

MORE ABOUT BUSSES

The destination appears on the front of the bus...



... and the depot of origin on the rear.



This is a converted double-decker, known colloquially as a යකා බස් එක, 'demon bus.'

A DEVOTEE UNDERGOING AN ORDEAL AT HOLY KATARAGAMA

KNOWING LANGUAGES

CYCLE 56

DO YOU KNOW SINHALA, SIR?

M-1

මම සිංහල දන්නවා.	I know Sinhala.
මට සිංහල කියවන්න පුළුවනි.	I can read Sinhala.
මට සිංහල කතාකරන්න පුළුවනි.	I can speak Sinhala.

M-2

මම දෙමළ දන්නේ නෑ.	I do not know Tamil.
මට ඉංග්‍රීසි කියවන්න බෑ.	I cannot read English.
මට හොඳට කතාකරන්න බෑ.	I cannot speak well.

M-3

මහත්තයා සිංහල දන්නවා ද?	Do you know Sinhala, sir?
නෝනා මහත්තයාට දෙමල කතාකරන්න පුළුවන් ද?	Can you speak Tamil, madam?
මහත්තයාට ඉංග්‍රීසි ලියන්න පුළුවන් ද?	Can you write English, sir?

C-1

Students should discuss their foreign language skills, using the formulas given above.

A. (මහත්තයා සිංහල දන්නවා ද?)

B. (ඔව්. මම සිංහල දන්නවා.)

FIREWALKING AT HOLY KATARAGAMA

KNOWING LANGUAGES

CYCLE 57

WHERE DID YOU LEARN SINHALA, SIR? HOW? WHO TAUGHT YOU?

M-1

මම සිංහල අමෙරිකාවේ ඉගෙනගත්තා.	I learned Sinhala in America.
මම සිංහල ලංකාවේ ඉගෙනගත්තා.	I learned Sinhala in Sri Lanka.
සේරම් කියලා මහත්තයෙක් මට සිංහල ඉගැන්නුවා.	A gentleman named Saram taught me Sinhala.

M-2

මහත්තයා සිංහල කොහේ ද ඉගෙනගත්තේ?	Where did you learn Sinhala?
සිංහල කොහොම ද ඉගෙනගත්තේ?	How did you learn Sinhala?
සිංහල කවුද ඉගැන්නුවේ?	Who taught you Sinhala?

C-1

Students should continue to talk about their language skills, using the formulas given above.

A. මහත්තයා සිංහල කොහේ ද ඉගෙනගත්තේ?

B. මම (ලංකාවේ) ඉගෙනගත්තා.

NOTES ON STRUCTURE: new past forms; basic and emphatic past.

1. Two new past forms have appeared above: ඉගෙනගත්තා , the past of ඉගෙනගන්නවා , 'learn', and ඉගැන්නුවා , the past of උගන්නනවා, 'teach'. Both forms are irregular.

2. Basic past forms are distinguished from emphatic past forms only by the final vowel. The basic form ends in ආ and the emphatic form in ඒ . Further details appear in Sinhala Structures, section 2.45.

CYCLE 58

DID YOU STUDY AT THE UNIVERSITY SIR? WHICH UNIVERSITY? WHAT SUBJECTS DID YOU STUDY? IN WHAT YEAR DID YOU ENTER? IN WHAT YEAR DID YOU RECEIVE THE DEGREE?

M-1

මම ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලේ ඉගෙනගත්තා.	I studied at the University of Sri Lanka.
මම කෘෂිකර්මය ඉගෙනගත්තා.	I studied agriculture.
මම විද්‍යා විෂයවල් ඉගෙනගත්තා.	I studied science subjects.
මම ගෘහ විද්‍යාව ඉගෙනගත්තා.	I studied home science.
මම ආර්ථික විද්‍යාව ඉගෙනගත්තා.	I studied economics.
මම ඉංග්‍රීසි සාහිත්‍යය ඉගෙනගත්තා.	I studied English literature.

M-2

එක්දාස් නමසිය හැට පහේ මම විශ්වවිද්‍යාලේට ඇතුල් උනා.	I entered university in 1965.
එක්දාස් නමසිය හැට අටේ මට බී. එස්. උපාධිය ලැබුනා.	I received the B.S. degree in 1968.

M-3

මහත්තයා විශ්වවිද්‍යාලේ ඉගෙනගත්තා ද? කොයි විශ්වවිද්‍යාලේ?	Did you study in the university, sir? Which university?
කොයි විෂය ද? කොයි විෂයවල් ද?	What subject? What subjects?
කොයි අවුරුද්දේ ද ඇතුල් උනේ?	In what year did you enter?
උපාධියක් ලැබුනා ද? කොයි උපාධිය? කොයි අවුරුද්දේ ද?	Did you receive a degree? What degree? In what year?

C-1

The structures above should be familiar to the students although some of the vocabulary is new. Many of the words here are very formal, but university education is generally discussed in formal terms. Students should take this opportunity to work up a description of their university experience.

THE EDUCATIONAL SYSTEM IN SRI LANKA

In Sri Lanka, children begin school at the age of 6. There are schools virtually everywhere in Sri Lanka and most students attend. In 1971, the student population comprised approximately 70% of all students of compulsory school-going age, i.e. 6-14. Because of the availability of schooling for virtually every child in Sri Lanka, most people are literate in at least one language. Students attend a primary school from kindergarten up to the fifth standard (fifth grade). After that, they transfer to a secondary school which trains students up to University entrance. After what would be grade 10 in the United States, students sit for the G.C.E. (General Certificate of Education) ordinary level exam. After this exam, some students leave school or go on to various technical institutions. All students who pass the G.C.E. ordinary level exam are awarded G.C.E. ordinary level certificates. The students who do very well in the G.C.E. ordinary level exams and hope to enter the University, remain in school for two more years. Students who pass their exams at the end of these two years are awarded a G.C.E. advanced level certificate. Entrance to the University is now highly competitive because of the limited number of places in the entering class in any given year. Time spent at the University varies. An arts or a science degree takes three years. Engineering takes four years. Medicine and Veterinary Science take five. Those students who do not seek admission to the University often enter technical training colleges, teacher training colleges or agricultural colleges after completing the G.C.E. ordinary level.

NOTES ON STRUCTURE: the past of වෙනවා , 'become'; ඇතුල් වෙනවා, 'enter'; කොයි , 'which';

1. වෙනවා , 'become', has the past form උනා . It is irregular.

2. ඇතුල් වෙනවා means 'enter'. The place or institution entered is in the dative case.

3. කොයි is an adjective meaning 'which'. See Sinhala Structures, section 3.

DIALOGUE VII

TAKING A RIDE IN A COLOMBO TAXI

JULIA

තර්ස්ටන් පාර දන්නවා, නේ ද?	You know Thurstan Road, don't you.

TAXI DRIVER

ඔව්, නෝනා මහත්තයා. හොඳට දන්නවා.	Yes madam. I know it well.
නෝනා මහත්තයා ඉපදුනේ ලංකාවේ ද?	Were you born in Sri Lanka madam?

JULIA

නෑ. මම අමෙරිකාවෙන්. මම ලංකාවට ආවේ ගිය අවුරුද්දේ මයි.	No. I'm from America. I came to Sri Lanka just last year.

TAXI DRIVER

නෝනා මහත්තයා සිංහල හොඳට කතාකරනවා.	You speak Sinhala very well.
සිංහල කොහේ ද ඉගෙනගත්තේ?	Where did you study Sinhala?

JULIA

මම සිංහල ලංකාවේ ඉගෙනගත්තා.	I learned Sinhala in Sri Lanka.
ඔලිවියා සිල්වා කියලා නෝනා මහත්තයෙක් මට සිංහල ඉගැන්නුවා.	A lady named Olivia Silva taught me.

TAXI DRIVER

සිංහල කියවන්න පුලුවන් ද?	Can you read Sinhala?

JULIA

මම අකුරු දන්නවා. මට සයින්බෝට් කියවන්න පුලුවනි. මට ශබ්දකෝෂෙන් වචන හොයාබලන්න පුලුවනි. ඒ උනාට සිංහල පොත් කියවන්න හරි අමාරුයි. පත්තර කියවන්නත් ලේසි නෑ.	I know my letters. I can read signboards. I can look up words in the dictionary. However, it is very difficult to read Sinhala books. And its not easy to read the papers.

	TAXI DRIVER
ඒක නේන්නං.	That's for sure.
	JULIA
ඩ්‍රයිවර් කොයි බාසාවල් ද දන්නේ?	What languages do you know driver?
	TAXI DRIVER
සිංහල ඉංග්‍රීසි දෙකම දන්නවා. ඒ උනාට මට කියවන්න පුලුවන් සිංහල විතරයි.	I know Sinhala and English. But I can read only Sinhala.
	JULIA
ඉංග්‍රීසි කියවන්න ඉගෙනගන්නේ නැත්තේ මොක ද?	Why don't you learn to read English?
	TAXI DRIVER
අප්පොච්චි! වේලා නැති නිසා, මට ඉංග්‍රීසි ඉගෙනගන්න බෑ.	Come on! I can't study English because there's no time.
	JULIA
ඉස්කෝලේ ඉංග්‍රීසි ඉගෙනගත්තේ නැද්ද?	Didn't you study English in school?
	TAXI DRIVER
නෑ. තාත්තා මට ඉංග්‍රීසි ඉගැන්නුවා.	No. My father taught me English.

NOTES ON STRUCTURE: නේ ද? , 'isn't it?'; the negatives නෑ and බෑ in interrogative sentences; negatives before නිසා , 'because'; the particle ම . ඒ උනාට, 'nevertheless, but'; an interjection.

1. නේ ද? means 'isn't it?' and alsc equates with English 'don't you', 'aren't you' and similar expressions.

2. In an interrogative sentence, නෑ becomes නැද්ද and බෑ becomes බැරි ද.
3. Before නිසා , 'because', නෑ becomes නැති and බෑ becomes බැරි.

4. When the emphasizing particle ම occurs in sentence final position, it takes the form මයි . The numeral දෙක, 'two' + ම means 'both'. It is inanimate. දෙන්නාම is the animate equivalent.

5. ඒ උනාට is an expression which means 'nevertheless, but.'

6. අප්පොච්චි is an interjection which conveys a sense of disbelief. Literally it means 'father'.

SUMMARY

PRACTICING PATTERNS FROM DIALOGUE VII

A. Response Drill

Model: I මහත්තයා සිංහල දන්නවා, නේ ද? — You know Sinhala, don't you sir?
S ඔව්. මම සිංහල දන්නවා. — Yes. I know Sinhala.

1. මහත්තයා සිංහල දන්නවා, නේ ද? You know Sinhala, don't you sir?	ඔව්. මම සිංහල දන්නවා. Yes. I know Sinhala.
2 මහත්තයා පත්තර කියවනවා, නේ ද? You read the papers, don't you sir?	ඔව්. මම පත්තර කියවනවා. Yes. I read the papers.
3 නෝනා මහත්තයා ගෙදර යනවා, නේ ද? You are going home, aren't you madam?	ඔව්. මම ගෙදර යනවා. Yes. I am going home.
4 නෝනා මහත්තයා වැඩ කරනවා, නේ ද? You are working, aren't you madam?	ඔව්. මම වැඩ කරනවා. Yes. I am working.
5 මහත්තයා ලංකාවෙන්, නේ ද? You are from Sri Lanka, aren't you sir?	ඔව්. මම ලංකාවෙන්. Yes. I am from Sri Lanka.
6 මහත්තයා අමෙරිකන් පුරවැසියෙක්, නේ ද? You are an American citizen, aren't you sir?	ඔව්. මම අමෙරිකන් පුරවැසියෙක්. Yes. I am an American citizen.

B. Transformation Drill

Model I එයා සිංහල දන්නේ නෑ. — He doesn't know Sinhala.

S එයා සිංහල දන්නේ නැත්තේ මොක ද? — Why doesn't he know Sinhala.

1 එයා සිංහල දන්නේ නෑ. He doesn't know Sinhala.	එයා සිංහල දන්නේ නැත්තේ මොක ද? Why doesn't he know Sinhala.
2 මහත්තයා වැඩ කරන්නේ නෑ. The gentleman doesn't work.	මහත්තයා වැඩ කරන්නේ නැත්තේ මොක ද? Why doesn't the gentleman work?

B. Transformation Drill (continued)

3	එයා ලංකාවේ ඉගෙනගත්තේ නෑ. He didn't study in Sri Lanka.	එයා ලංකාවේ ඉගෙනගත්තේ නැත්තේ මොක ද? Why didn't he study in Sri Lanka?
4	එයා දෙමල කියවන්න ඉගෙනගන්නේ නෑ. He isn't learning to read Tamil.	එයා දෙමල කියවන්න ඉගෙනගන්නේ නැත්තේ මොක ද? Why isn't he learning to read Tamil?
5	නෝනා මහත්තයා ආවේ නෑ. The lady didn't come.	නෝනා මහත්තයා ආවේ නැත්තේ මොක ද? Why didn't the lady come?
6	ගොවියා වී වපුරන්නේ නෑ. The farmer isn't sowing rice.	ගොවියා වී වපුරන්නේ නැත්තේ මොක ද? Why isn't the farmer sowing rice?

C. Transformation Drill

Model: I ගොවියා අද වැඩ කරන්නේ නෑ. The farmer isn't working today.

S ගොවියා අද වැඩ කරන්නේ නැද්ද? Isn't the farmer working today?

1	ගොවියා අද වැඩ කරන්නේ නෑ. The farmer isn't working today.	ගොවියා අද වැඩ කරන්නේ නැද්ද? Isn't the farmer working today?
2	ඒගොල්ල පත්තර කියවන්නේ නෑ. They don't read the papers.	ඒගොල්ල පත්තර කියවන්නේ නැද්ද? Don't they read the papers?
3	මහත්තයා ළඟ සල්ලි නෑ. The gentleman doesn't have money.	මහත්තයා ළඟ සල්ලි නැද්ද? Doesn't the gentleman have money?
4	මහත්තයා කසාද බැඳලා නෑ. The gentleman isn't married.	මහත්තයා කසාද බැඳලා නැද්ද? Isn't the gentleman married?
5	කන්තෝරුව දවලට අරින්නේ නෑ. The office doesn't open after lunch.	කන්තෝරුව දවලට අරින්නේ නැද්ද? Doesn't the office open after lunch?
6	තානාපති කාර්යාලය දවලට වහන්නේ නෑ. The Embassy doesn't close after lunch.	තානාපති කාර්යාලය දවලට වහන්නේ නැද්ද? Doesn't the Embassy close after lunch?

BUDDHIST MONKS

D. Substitution Drill

Model:		
	I මට සිංහල අකුරු ලියන්න පුළුවනි.	I can write the Sinhala letters.
	S මට සිංහල අකුරු ලියන්න පුළුවනි.	I can write the Sinhala letters.
	I අම්මා.	Mother.
	S අම්මාට සිංහල අකුරු ලියන්න පුළුවනි.	Mother can write the Sinhala letters.

1 මට සිංහල අකුරු ලියන්න පුළුවනි. (අම්මා). [mother]

2 අම්මාට සිංහල අකුරු ලියන්න පුළුවනි. (එයා) [he, she]

3 එයාට සිංහල අකුරු ලියන්න පුළුවනි. (මහත්තයා) [the gentleman]

4 මහත්තයාට සිංහල අකුරු ලියන්න පුළුවනි. (නෝනා) [the lady]

5 නෝනාට සිංහල අකුරු ලියන්න පුළුවනි. (නංගි) [younger sister]

6 නංගිට සිංහල අකුරු ලියන්න පුළුවනි.

E. Substitution Drill

Model:		
	I මට දැන් ගෙදර යන්න බෑ.	I can't go home now.
	S මට දැන් ගෙදර යන්න බෑ.	I can't go home now.
	I නංගිලා.	(My) younger sisters.
	S නංගිලාට දැන් ගෙදර යන්න බෑ.	My younger sisters can't go home now.

1 මට දැන් ගෙදර යන්න බෑ. (නංගිලා) [younger sisters]

2 නංගිලාට දැන් ගෙදර යන්න බෑ. (මහත්තුරු) [gentlemen]

3 මහත්තුරුන්ට දැන් ගෙදර යන්න බෑ. (පුතා) [the son]

4 පුතාට දැන් ගෙදර යන්න බෑ. (දුව) [the daughter]

5 දුවට දැන් ගෙදර යන්න බෑ. (තැපැල් මහත්තයා) [the postmaster]

6 තැපැල් මහත්තයාට දැන් ගෙදර යන්න බෑ.

F. Transformation Drill

Model: I එයාට සිංහල කියවන්න පුළුවනි. He can read Sinhala.

S එයාට සිංහල කියවන්න පුළුවන් ද? Can he read Sinhala?

1 එයාට සිංහල කියවන්න පුළුවනි. He can read Sinhala.	එයාට සිංහල කියවන්න පුළුවන් ද? Can he read Sinhala?
2 මට බස් එකෙන් යන්න පුළුවනි. I can go by bus.	මට බස් එකෙන් යන්න පුළුවන් ද? Can I go by bus?
3 මහත්තයාට දෙමල කතාකරන්න පුළුවනි. The gentleman can speak Tamil.	මහත්තයාට දෙමල කතාකරන්න පුළුවන් ද? Can the gentleman speak Tamil?
4 අපට ගෙදර යන්න පුළුවනි. We can go home.	අපට ගෙදර යන්න පුළුවන් ද? Can we go home?
5 ඒගොල්ලන්ට සිංහල ඉගෙනගන්න පුළුවනි. They can learn Sinhala.	ඒගොල්ලන්ට සිංහල ඉගෙනගන්න පුළුවන් ද? Can they learn Sinhala?
6 මහත්තුරුන්ට වැඩ කරන්න පුළුවනි. The gentlemen can work.	මහත්තුරුන්ට වැඩ කරන්න පුළුවන් ද? Can the gentlemen work?

G. Transformation Drill

Model:	I මහත්තයාට දෙමල කතාකරන්න බෑ.	The gentleman can't speak Tamil.
	S මහත්තයාට දෙමල කතාකරන්න බැරි ද?	Can't the gentleman speak Tamil?

1 මහත්තයාට දෙමල කතාකරන්න බෑ. The gentleman can't speak Tamil.	මහත්තයාට දෙමල කතාකරන්න බැරි ද? Can't the gentleman speak Tamil?
2 මට කන්තෝරුවට යන්න බෑ. I can't go to the office.	මට කන්තෝරුවට යන්න බැරි ද? Can't I go to the office.
3 එයාට ඉංග්‍රීසි කතාකරන්න බෑ. He can't speak English.	එයාට ඉංග්‍රීසි කතාකරන්න බැරි ද? Can't he speak English?

4 එයාට හොඳට වැඩ කරන්න බැ. He can't work well.	එයාට හොඳට වැඩ කරන්න බැරි ද? Can't he work well?
5 එයාට නිවාඩුවට යන්න බැ. He can't go on vacation.	එයාට නිවාඩුවට යන්න බැරි ද? Can't he go on vacation?
6 මට වචන හොයාබලන්න බැ. I can't look up words.	මට වචන හොයාබලන්න බැරි ද? Can't I look up words?

H. Substitution Drill

Model:	I වේලා නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ.	I can't study Sinhala because there's no time.
	S වේලා නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ.	I can't study Sinhala because there's no time.
	I පොත් නැ.	There are no books.
	S පොත් නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ.	I can't study Sinhala because there are no books.

1 වේලා නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ. (පොත් නැ). [There are no books.]

2 පොත් නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ. (ගුරුවරයා එන්නේ නැ). [The teacher doesn't come.]

3 ගුරුවරයා එන්නේ නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ. (ගුරුවරයෙක් නැ). [There is no teacher.]

4 ගුරුවරයෙක් නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ. (ඉස්කෝලේ මහත්තයා ආවේ නැ). [The schoolmaster didn't come.]

5 ඉස්කෝලේ මහත්තයා ආවේ නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ. (මහත්තයා මට කතාකරන්නේ නැ). [The gentleman won't talk to me.]

6 මහත්තයා මට කතාකරන්නේ නැති නිසා, මට සිංහල ඉගෙනගන්න බැ.

I Transformation Drill

Model:	I එයා ක්ලාස් එකට එන නිසා සිංහල කතාකරන්න පුලුවනි.	He can speak Sinhala because he comes to class.
	S එයා ක්ලාස් එකට එන්නේ නැති නිසා, සිංහල කතාකරන්න බැ.	He can't speak Sinhala because he doesn't come to class.

1	එයා ක්ලාස් එකට එන නිසා, සිංහල කතාකරන්න පුලුවනි. He can speak Sinhala because he comes to class.	එයා ක්ලාස් එකට එන්නේ නැති නිසා, සිංහල කතාකරන්න බෑ. He can't speak Sinhala because he doesn't come to class.
2	එයා හොඳට ඉගෙනගන්න නිසා, සිංහල කියවන්න පුලුවනි. He can read Sinhala because he studies well.	එයා හොඳට ඉගෙනගන්නේ නැති නිසා, සිංහල කියවන්න බෑ. He can't read Sinhala because he doesn't study well.
3	එයා ලංකාවේ වැඩ කරන නිසා, සිංහල ඉගෙනගන්න පුලුවනි. He can learn Sinhala because he works in Sri Lanka.	එයා ලංකාවේ වැඩ කරන නිසා, සිංහල ඉගෙනගන්න බෑ. He can't learn Sinhala because he doesn't work in Sri Lanka.
4	ගුරුවරයා එන නිසා, අපට අකුරු ඉගෙනගන්න පුලුවනි. We can learn the letters because the teacher is coming.	ගුරුවරයා එන්නේ නැති නිසා, අපට අකුරු ඉගෙනගන්න බෑ. We can't learn the letters because the teacher isn't coming.
5	මහත්තයා කොළඹ වැඩ කරන නිසා, මට එයාට කතාකරන්න පුලුවනි. Because the gentleman works in Colombo, I can talk to him.	මහත්තයා කොළඹ වැඩ කරන්නේ නැති නිසා, මට එයාට කතාකරන්න බෑ. Because the gentleman doesn't work in Colombo, I can't talk to him.
6	මට මාරුවක් ලැබුන නිසා, අමෙරිකාවට යන්න පුලුවනි. I can go to America because I received a transfer.	මට මාරුවක් ලැබුනේ නැති නිසා, අමෙරිකාවට යන්න බෑ. I can't go to America because I didn't receive a transfer.

FISHERMEN ON THE BEACH

CYCLE 59

IN WHAT LANGUAGE IS LANKADIPA PUBLISHED?



M-1

ඩේලි නිව්ස් පත්තරේ අච්චු ගහන්නේ ඉංග්‍රීසියෙන්.	The Daily News is published in English.
ජනතා පත්තරේ අච්චු ගහන්නේ සිංහලෙන්.	Janata is published in Sinhala.
ලංකාදීප පත්තරේ අච්චු ගහන්නේ සිංහලෙන්.	Lankadipa is published in Sinhala.
වීරකේසරි පත්තරේ අච්චු ගහන්නේ දෙමලෙන්.	Virakesari is published in Tamil.

M-2

ජනතා පත්තරේ අච්චු ගහන්නේ මොන බාසාවෙන් ද?	In what language is Janata published?
ටයිම්ස් ඔෆ් සිලෝන් පත්තරේ අච්චු ගහන්නේ මොන බාසාවෙන් ද?	In what language is the Times of Ceylon published?
සිළුමිණ පත්තරේ අච්චු ගහන්නේ මොන බාසාවෙන් ද?	In what language is Silumina published?

C-1

Using the formulas given above, discuss the information given below under Newspapers Published in Sri Lanka.

A. (සිළුමිණ) පත්තරේ අච්චු ගහන්නේ මොන බාසාවෙන් ද?

B. (සිංහලෙන්)

DAILY NEWSPAPERS PUBLISHED IN SRI LANKA

Name of Newspaper	Year estab-lished	Language of Publication	Average Circulation	Publishers
(i) Morning daily				
Dinamina	1909	Sinhala	104,305	The Associated Newspapers of Ceylon Limited.
Lankadipa	1947	Sinhala	33,751	The Times of Ceylon Limited.
Virakesari	1930	Tamil	17,584	The Express Newspapers (Ceylon) Limited.
Thinakaran	1932	Tamil	17,261	The Associated Newspapers of Ceylon Limited.
Ceylon Daily News	1918	English	54,752	The Associated Newspapers of Ceylon Limited.
Daily Mirror	1961	English	15,995	The Times of Ceylon Limited.
(ii) Evening daily				
Janatha	1953	Sinhala	11,703	The Associated Newspapers of Ceylon Limited.
Mithran	1966	Tamil	9,665	The Express Newspapers (Ceylon) Limited
Ceylon Observer	1834	English	5,757	The Associated Newspapers of Ceylon Limited

Source: Sri Lanka Yearbook, 1975.

TEXT

THE NEWSPAPERS IN SRI LANKA

The following text material should be drilled in class and finally memorized by the students.

ලංකාවේ හුඟක් පත්තර අච්චු ගහනවා.	They publish a large number of newspapers in Sri Lanka.
ඔක්කොම පත්තර අච්චු ගහන්නේ කොළඹ.	All of the papers are published in Colombo.
ඒ උනත් ලංකාවේ හැම පලාතකම ආරංචි ඒවායේ තියෙනවා.	Nevertheless, they have news from every area of Sri Lanka.
සමහර පත්තර අච්චු ගහන්නේ සිංහලෙන්.	Some of the papers are published in Sinhala.
සමහරක් අච්චු ගහන්නේ දෙමලෙන්.	Some are published in Tamil.
සමහරක් අච්චු ගහන්නේ ඉංග්‍රීසියෙන්.	Some are published in English.



NOTES ON STRUCTURE: හැම ... ම , 'each and every'; ඔක්කොම , 'all'; හුඟක් , 'many, a large number'; ඒ උනත්, 'nevertheless'; instrumental forms.

1. හැම means 'every'. It occurs in construction with a following nominal plus the emphasizing particle ම and takes on the meaning 'each and every.' Thus, හැමදාම , 'every day, each and every day'; Commonly, the nouns which occur in this construction are indefinites. Thus ලංකාවේ හැම පලාතකම , of each and every area of Sri Lanka.'

2. ඔක්කොම , 'all', is a pronoun which may substitute for both animate and inanimate nouns. It also occurs in quantity phrases where it may precede or follow the noun.

3. හුඟක් is a quantity word which means 'many, a large number'. Its antonym is ටිකක් , 'a little, a few.'

4. ඒ උනත් is yet another expression which means 'nevertheless.'

බාසාවෙන් , 'in .... language', which occurs in Cycle 59, M-2 is an instrumental form as are the emphasized words in M-1. See Sinhala Structures, section 1.34 for a discussion of the instrumental case.



AMBULUGALA VIHARE

CYCLE 60

SIR, WHAT PAPERS DID YOU READ THIS WEEK?

දිනමිණ
THE DINAMINA

M-1

මම නිව්යෝක් ටයිම්ස් පත්තරේ කියෙව්වා.	I read the New York Times.
මම දවස පත්තරේ කියෙව්වා.	I read Dawasa.
මම ටයිම්ස් ඔෆ් සිලෝන් පත්තරේ කියෙව්වා.	I read the Times of Ceylon.
මම ලංකාදීප පත්තරේ කියෙව්වා.	I read Lankadipa.

M-2

මහත්තයා මේ සුමානේ පත්තර කියෙව්වා ද?	Sir, did you read the papers this week?
මහත්තයා කියෙව්වේ මොන පත්තර ද?	Sir, what papers did you read?

C-1

Using the formulas given above, students should discuss the newspapers they have read recently.

A. (මහත්තයා මේ සුමානේ පත්තර කියෙව්වා ද?)

B. (මම ලංකාදීප පත්තරේ කියෙව්වා.)

NOTE ON STRUCTURE: the past tense of කියවනවා , 'read'.

The past tense form of කියවනවා , 'read', is කියෙව්වා.

CYCLE 61

WHAT HAS BEEN THE LATEST NEWS IN THE PAPERS?

M-1

ආර්ථික තත්වය ගැන ආරංචි තිබුනා.	There was news about the economic situation.
හොරකමක් ගැන ආරංචි තිබුනා.	There was news about a theft.
ලං.ග.ම. ගැන ආරංචි තිබුනා.	There was news about the C.T.B. (Ceylon Transport Board).
ආණ්ඩුව කරන වැඩ ගැන ආරංචි තිබුනා.	There was news about the work the government is doing.

M-2

ලංකාව ගැන	About Sri Lanka.
විශ්වවිද්‍යාලේ ගැන	About the university.
රගර් කණ්ඩායම ගැන	About the rugger team.
කෘෂිකර්ම වැඩ ගැන	About the agricultural work.
පත්තරවල තියෙන අලුත්ම ආරංචි මොනවා ද?	What has been the latest news in the papers?
ලංකාව ගැන පත්තරවල තියෙන අලුත්ම ආරංචි මොනවා ද?	What has been the latest news in the papers about Sri Lanka?

C-1

Using the formulas given above, students should review the main news topics of the week. Necessary additional vocabulary should be supplied by the instructor.

A. (ලංකාව ගැන පත්තරවල තියෙන අලුත්ම ආරංචි මොනවා ද?)

B. (ආණ්ඩුව කරන වැඩ ගැන ආරංචි තිබුනා.)

NOTES ON STRUCTURE: the present verbal adjective; superlatives; the past of තියෙනවා, 'be'; ආරංචි, 'news'; ගැන, 'about'.

1. Further examples of the present verbal adjective (Sinhala Structures, section 2.3) appear above. They include:

පත්තරවල තියෙන ආරංචි.	The news being in the papers.
ආණ්ඩුව කරන වැඩ.	The work the government is doing.

2. Adjectives may be given a superlative meaning with the addition of the emphasizing particle ම. Hence අලුත්, 'new'; අලුත්ම 'newest, most recent.'

3. The past of තියෙනවා, 'be', is තිබුණා. It is an irregular form.

4. ආරංචි means 'news, tidings.' It is a plural form. It often figures as a conversation opener in such expressions as අලුත් ආරංචි මොනවා ද?, 'What's new?'

5. ගැන, 'about, concerning', is a postposition which follows nouns in the direct case.

AMBULUGALA VIHARE, INTERIOR

THE DAILY ROUTINE

CYCLE 62

WHAT DO YOU DO IN THE MORNING?

M-1

මම නැගිටිනවා.	I get up.
මම නානවා.	I bathe.
මම ඇඳුම් දමාගන්නවා.	I put on my clothes.
මම උදේ කෑම කනවා.	I eat breakfast.
ඊට පස්සේ, මම සිංහල ඉගෙනගන්නවා.	After that, I study Sinhala.
ඊට පස්සේ , මම ගෙදරින් යනවා.	After that, I leave the house.
මම කන්තෝරුවට කාර් එක එලවනවා.	I drive the car to the office.
මම සිංහල පන්තියට යනවා.	I go to Sinhala class.
ඊට පස්සේ, මම කන්තෝරුවේ වැඩ කරනවා.	After that, I work in the office.
සාමාන්‍යයෙන්, හදිසි වැඩ කරන්න තියෙනවා.	Usually, there is urgent work to do.
සමහර දවස්වල, මම රැස්වීමකට යනවා.	On some days I go to a meeting.

M-2

මහත්තයා, උදේ කරන්නේ මොනවා ද?	Sir, what do you do in the morning?
නෝනා මහත්තයා, සාමාන්‍යයෙන් උදේ කරන්නේ මොනවා ද?	Madam, what do you usually do in the morning?
මහත්තයා, අපට කියන්න උදේ කරන්නෙ මොනවා ද කියලා.	Sir, please tell us what you do in the morning.

C-1

Each student should give an account of his morning routine, using the formulas given above. If the necessary Sinhala does not appear here, students should ask the instructor for it.

C-1

A. (මහත්තයා) උදේ කරන්නේ මොනවා ද?

B. මම (නානවා). ඊට පස්සේ, මම (කෑම කනවා).

NOTES ON STRUCTURE: basic present forms.

The verbs which appear in M-1 are the familiar basic present forms. Some of them are new words. This cycle provides an opportunity for students to expand their working vocabulary of verbs considerably. The Sinhala for shave, turn on the radio, turn off the alarm, listen to the radio are additional examples which could easily come up in connection with this cycle. Students should begin keeping a list of the verbs which they learn in this manner since it will be necessary shortly (see Cycle 63) to add additional information about them, namely their past and participle forms.

NOTES ON STRUCTURE:, CYCLE 63: A 'when' form of the verb; ඉස්සෙල්ලා , 'before', and පස්සේ , 'after', with preceding verb forms.

1. In Cycle 63, M-2 opposite, a 'when' form of the verb appears. It is made up of the present verbal adjective form (see Sinhala Structures, section 2.3), plus කොට , 'when'. This form is discussed in Sinhala Structures, section 2.9. It is used only if the action in the 'when' clause is simultaneous with that of the main clause. These matters are drawn out in greater detail in section 2.9.

2. ඉස්සෙල්ලා , 'before', and පස්සේ, 'after', occur in construction with dependent verb forms to give the meaning 'before doing something' and 'after doing something.' See the examples in M-1 and M-3 opposite. The former occurs with preceding infinitives. The latter occurs with past forms in the dative case. Students should begin reviewing past forms in Sinhala Structures, section 2.4 at this time.

CYCLE 63

DO YOU STUDY SINHALA BEFORE YOU EAT BREAKFAST, OR AFTER?

M-1

උදේ කෑම කන්න ඉස්සෙල්ලා, මම සිංහල ඉගෙනගන්නවා.	I study Sinhala before I eat breakfast.
උදේ කෑම කෑවාට පස්සේ, මම පත්තර කියවනවා.	I read the papers after I eat breakfast.
නෑවාට පස්සේ, මම උදේ කෑම කනවා.	I eat breakfast after I bathe.

M-2

මම උදේ කෑම කනකොට, සිංහල ඉගෙනගන්නවා.	I study Sinhala when I am eating breakfast.
මම නානකොට, සිංදු කියනවා.	I sing when I am bathing.
මම කන්තෝරුවට කාර් එක එලවනකොට, රේඩියෝ එක අහනවා.	I listen to the radio when I am driving the car to the office.

M-3

මහත්තයා පත්තර කියවන්නේ උදේ කෑම කන්න ඉස්සෙල්ලා ද, කෑවාට පස්සේ ද?	Sir, do you read the papers before you eat breakfast, or after?
නෝනා මහත්තයා සිංහල ඉගෙනගන්නේ කන්තෝරුවට යන්න ඉස්සෙල්ලා ද, ගියාට පස්සේ ද?	Madam, do you study Sinhala before you go to the office, or after?

C-1

In the preceding cycle students have already described the events of the morning. Now, using the formulas given above, students should ask questions about the sequence of events.

A. (මහත්තයා උදේ කෑම කන්නේ නාන්න ඉස්සෙල්ලා ද, නෑවාට පස්සේ ද?)

B. (නෑවාට පස්සේ මම උදේ කෑම කනවා.)

THE DAILY ROUTINE

CYCLE 64

AT WHAT TIME DO YOU EAT BREAKFAST?

M-1

මම උදේ කෑම කන්නේ නමයට.	I eat breakfast at nine.
මම නැගිටින්නේ හයට.	I get up at six.
මම පන්තියට එන්නේ අට හමාරට.	I come to class at 8:30.
මම මූන හෝදන්නේ හතට විතර.	I wash my face about 7.

M-2

මහත්තයා පන්තියට එන්නේ කීයට ද?	What time do you come to class, sir?
මහත්තයා නැගිටින්නේ කීයට ද?	What time do you get up, sir?
මහත්තයා උදේ කෑම කන්නේ කීයට ද?	At what time do you eat breakfast, sir?

C-1

Using the above formulas, discuss the morning's activities.

A. (මහත්තයා උදේ කෑම කන්නේ කීයට ද?)

B. (උදේ කෑම කන්නේ අටට)

THE DAILY ROUTINE - I

CYCLE 65

WHEN DID YOU GET UP TODAY?

M-1

මම හයට විතර නැගිට්ටා.	I got up about six.
මම හය හමාරට නැගිට්ටා.	I got up at 6:30.
මම හරියටම හතට නැගිට්ටා.	I got up at exactly seven.
මම අටට විතර නැගිට්ටා.	I got up about 8.
ජෝන් හයට විතර නැගිට්ටා.	John got up about 6.
අර මහත්තයා පහමාරට නැගිට්ටා.	That gentleman got up at 5:30.

M-2

නැගිට්ටේ කීයට ද?	What time did (you) get up?
මහත්තයා ඊයේ නැගිට්ටේ කීයට ද?	What time did you get up yesterday, sir?

C-1

Using the formulas given above, students should construct conversations of the type given below.

A. (මහත්තයා ඊයේ නැගිට්ටේ කීයට ද?)

B. (මම හයට විතර නැගිට්ටා.)

THE DAILY ROUTINE

CYCLE 66

IT SEEMS THAT HE EATS BREAKFAST AT 8:00.

M-1

එයා උදේ කෑම කන්නෙ අටට ලු.	It seems that he eats breakfast at 8:00.
එයා අද උදේ කෑම කෑවේ හතට ලු.	It seems that he ate breakfast today at 7:00.
සාමාන්‍යයෙන්, එයා උදේ කෑම කන්නේ හත හමාරට ලු.	It seems that he usually eats breakfast at 7:30.

M-2

ඔව. එයා කීයට ද නැගිට්ටේ කියලා, මම දන්නවා.	Yes. I know what time she gets up.
නෑ. මහත්තයා කීයට නැගිට්ටේ කියලා, මම දන්නේ නෑ.	No. I don't know what time the gentleman gets up.
නෑ. එයා සාමාන්‍යයෙන් උදේ කෑම කන්නේ කීයට ද කියලා, මම දන්නේ නෑ.	No. I don't know what time he usually eats breakfast.

M-3

මහත්තයා දන්නවා ද අර මහත්තයා කෑම කන්නේ කීයට ද කියලා?	Do you know what time the gentleman eats breakfast?
මහත්තයා දන්නවා ද අර නෝනා මහත්තයා කීයට ද නැගිට්ටේ කියලා?	Do you know what time the lady gets up?

C-1

Students should use the formulas which appear in this cycle to construct conversations of the type given below.

SAMPLE CONVERSATION

A.	මහත්තයා දන්නවා ද ජෝන්ස් මහත්තයා සාමාන්‍යයෙන් උදේ කෑම කන්නේ කීයට ද කියලා?	Do you know what time Mr. Jones usually eats breakfast?
B.	නෑ. මම දන්නේ නෑ.	No. I don't know.

B.	මම එයාගෙන් අහන්න ද?	Should I ask him?
		or
	මම එයාගෙන් අහන්නම්.	I'll ask him, if you like.
A.	ඔව්. එයාගෙන් අහන්න.	Yes. Please ask him.
B.	ජෝන්ස් මහත්තයා, සාමාන්‍යයෙන් උදේ කෑම කන්නේ කීයට ද?	Mr. Jones, what time do you usually eat breakfast?
C.	සාමාන්‍යයෙන්, මම උදේ කෑම කන්නේ හතට.	I usually eat breakfast at 7:00.
B.	එයා හතට කෑම කනවා ලු.	It seems that he eats at 7:00.

NOTE ON STRUCTURE: 'it seems.'

The particle ලු means 'it seems', 'evidently','apparently.' A discussion appears in Sinhala Structures, section 2.16.

CLOCK TOWER, KANDY

THE DAILY ROUTINE

CYCLE 67

AFTER YOU GOT UP THIS MORNING, WHAT DID YOU DO?

M-1

නැගිටලා, මම නැවා.	Having gotten up, I bathed.
නැගිටලා, මම දත් මැද්දා.	Having gotten up, I brushed my teeth.
නැගිටලා, මම ඇඳුම් ඇඳගත්තා.	Having gotten up, I got dressed.
නැගිටලා, නාලා, දත් මැදලා, මම ඇඳුම් ඇඳගත්තා.	I got up, bathed, brushed my teeth and got dressed.
ඇඳුම් ඇඳගෙන, මම උදේ කැම කැවා.	Having gotten dressed, I ate breakfast.

M-2

නෝනා මහත්තයා, නැගිටලා, අද උදේ මොනවා ද කෙරුවේ?	Madam, after you got up this morning, what did you do?
මහත්තයා, නැගිටලා, අද උදේ මොනවා ද කෙරුවේ?	Sir, after you got up this morning, what did you do?
නෝනා මහත්තයා, අපට කියන්න අද උදේ මොනවා ද කෙරුවේ කියලා.	Madam, tell us what you did this morning.

C-1

Using the vocabulary and the formulas given above, students should give descriptions of their early morning activities.

A. (මහත්තයා, නැගිටලා, අද උදේ මොනවා ද කෙරුවේ?)

B. (නැගිටලා, මම නැවා.)

THE DAILY ROUTINE

CYCLE 68

WHAT DID YOU EAT FOR BREAKFAST?

M-1

මම බිත්තර කෑවා.	I ate eggs.
මම තම්බපු බිත්තර දෙකක් කෑවා.	I ate two boiled eggs.
මම බිත්තර දෙකක් තම්බලා කෑවා.	I boiled two eggs and ate them.
මම බේකන් පෙති දෙකක් කෑවා.	I ate two slices of bacon.
මම ලිංගුස් දෙකක් කෑවා.	I ate two sausages.
මම බතුයි කුකුල් මසුයි කෑවා.	I ate rice and chicken.
මම කිරි කෝපි කෝප්පයක් බිව්වා.	I drank a cup of milk coffee.

M-2

උදේ කෑමට මොනවා ද කෑවේ?	What did you eat for breakfast?
දවල් කෑමට මොනවා ද කෑවේ?	What did you eat for lunch?
රෑ කෑමට ඊයේ මොනවා ද කෑවේ?	What did you eat for supper yesterday?

C-1

Each student should be given an opportunity to describe what he ate on the preceding day. Necessary vocabulary should be elicited from the instructor.

A. (රෑ කෑමට) ඊයේ මොනවා ද කෑවේ?

B. මම (බිත්තර) කෑවා.

NOTES ON STRUCTURE: past forms; the පු form.

1. One new past form appears above: බිව්වා the past of බොනවා, 'drink.'

2. තම්බපු is the participial adjective or පු form of තම්බනවා, 'boil.' See Sinhala Structures, section 2.7 for a discussion of this form.

WOODWORKING

THE DAILY ROUTINE

CYCLE 69

AFTER YOU ATE BREAKFAST, WHAT DID YOU DO?

M-1

මම උදේ කෑම කාලා නමය වෙන කන් සිංහල ඉගෙනගත්තා.	After I ate breakfast, I studied Sinhala till 9.
මම උදේ කෑම කාලා ඇඳ අස්පස්කෙරුවා.	After I ate breakfast, I made the bed.
මම උදේ කෑම කාලා ලියුමක් ලිව්වා.	After I ate breakfast, I wrote a letter.
මම උදේ කෑම කාලා පන්තියට ගියා.	After I ate breakfast, I went to class.
මම උදේ කෑම කාලා ගේ අස්පස්කෙරුවා.	After I ate breakfast, I straightened up the house.
මම උදේ කෑම කාලා තැපැල් කන්තෝරුවට ගියා.	After I ate breakfast, I went to the post office.

M-2

උදේ කෑම කාලා කෙරුවේ මොනවා ද?	After you ate breakfast, what did you do?

C-1

A. උදේ කෑම කාලා කෙරුවේ මොනවා ද?

B. (පන්තියට ගියා.)

NOTE ON STRUCTURE: the past tense and the past participle.

Students should take this opportunity to review Sinhala Structures, section 2.4 on the past tense and section 2.6 on the participle.

PREPARING COCONUT

THE DAILY ROUTINE

CYCLE 70

WHO USUALLY MAKES BREAKFAST?

M-1

සාමාන්‍යයෙන්, මම උදේ කෑම හදාගන්නවා.	I usually make breakfast (for myself).
සාමාන්‍යයෙන්, මම උදේ කෑම ලෑස්ති කරගන්නවා.	I usually prepare breakfast (for myself).
සාමාන්‍යයෙන්, මම උදේ කෑම උයාගන්නවා.	I usually cook breakfast (for myself).
නැගිටලා, මම උදේ කෑම උයලා කනවා.	After I get up, I cook and eat breakfast (for myself).

M-2

ජෝන් උදේ කෑම හදලා දෙනවා.	John makes breakfast (for others).
මේරි උදේ කෑම උයලා දෙනවා.	Mary cooks breakfast (for others).
මහත්තයා කෑම ලෑස්ති කරලා දෙනවා.	The gentleman prepares food (for others).
මම උදේ කෑම උයලා කනවා.	I cook and eat breakfast.

M-3

කෑම හදලා දෙන්න කිසි කෙනෙක් නෑ.	There is no one to prepare breakfast (for others).
එයාලා තමන්ගේ කෑම ලෑස්ති කරගන්නවා.	They prepare their own food.

M-4

උදේ කෑම හදලා දෙන්නේ කවුද?	Who makes breakfast?
දවල් කෑම?	lunch?
රෑ කෑම?	dinner?

M-4

කෑම හදලා දෙන්න එක්කෙනෙක් ඉන්නවා ද?	Is there a person to prepare food (for others)?
මහත්තයා තමන්ගේ උදේ කෑම හදාගන්නවා ද?	Do you make your own breakfast, sir?

C-1

Using the formulas given above, students should construct conversations according to the following model.

A. (උදේ කෑම හදලා දෙන්නේ කවුද?)

B. (මේරි උදේ කෑම හදලා දෙනවා.)

NOTES ON STRUCTURE: reflexive pronoun; complex verbs; කිසි, 'no'.

1. The reflexive pronoun තමන් , 'oneself, himself, themselves', (See Sinhala Structures, section 3.27) appears here in its genitive form. Examples:

එයා තමන්ගේ වැඩ කරගන්නවා.	He does his own work.
එයාලා තමන්ගේ වැඩ කරගන්නවා.	They do their own work.

Sometimes this pronoun appears in a reduplicated form and takes on the special meaning 'each, his own, each their own.'

එයාලා තම තමන්ගේ කෑම ලෑස්ති කරගන්නවා.	They each prepare their own food, i.e., they do it separately rather than collectively.

2. A number of complex verbs with දෙනවා, 'give', and ගන්නවා , 'take, get', appear in this lesson. Those with දෙනවා take on the meaning 'to do something for someone else', and those with ගන්නවා take on the meaning 'to do something for oneself.' Examples:

මම කිරි බත් හදාගන්නවා.	I make milk rice (for myself).
මම කිරි බත් හදාදෙනවා. or optionally මම කිරි බත් හදලා දෙනවා.	I make milk rice (for others).

This pattern involves a limited number of high-frequency verbs. Some other verbs show only a partial set, often with semantically specialized meanings. For example:

බලනවා	see, look at	බලාගන්නවා	look after, care for
දමනවා	put, place	දමාගන්නවා	put on (as with clothes)
කියනවා	say	කියාදෙනවා	inform, explain

3. කිසි , 'no; not any', appears in the phrase කිසි කෙනෙක් නෑ, 'no person.' It appears before singular indefinite forms of the noun. Examples:

කිසි කෙනෙක් ඇවිල්ලා නෑ.	No one has come.
එයාලා කිසි වැඩක් කෙරුවේ නෑ.	They did no work.

It occurs in sentences with negated verbs.

UPCOUNTRY PADDY TERRACES

CYCLE 71

HOW DO YOU LIKE TO DRINK YOUR TEA?

STREET VENDOR MAKING TEA

M-1

සීනි දාලා, බොන්න කැමතියි.	Having put sugar, I like to drink it.
කිරි දාලා, බොන්න කැමතියි.	I like to drink it with milk.
සීනියි කිරි ටිකකුයි දාලා, බොන්න කැමතියි.	I like to drink it with sugar and a little milk.
සීනි තේ හැන්දක් දාලා, බොන්න කැමතියි.	I like to drink it with a teaspoon of sugar.
සීනි තේ හැඳි දෙකක් දාලා, බොන්න කැමතියි.	I like to drink it with two teaspoons of sugar.

M-2

නෝනා මහත්තයා තේ බොන්න කැමති කොහොම ද?	How do you like to drink your tea, madam?
මහත්තයා තේ බොන්න කැමති කොහොම ද?	How do you like to drink your tea, sir?
මොනවා ද බොන්නේ, තේ ද, කෝපි ද?	What do you drink, tea or coffee?

C-1

Using the formulas given above, students should ask and answer questions as follows:

A. (තේ බොන්න කැමති කොහොම ද?)

B. (සීනි දාලා, බොන්න කැමතියි.)

ADDITIONAL USEFUL WORDS AND PHRASES

( ) = plural form

කෝප්පය (කෝප්ප)	the cup
හැන්ද (හැඳි)	the spoon
පීරිසිය (පීරිසි)	the saucer
කහට තේ එක	the plain tea
කිරි කහට එක	the milk tea (without sugar)
කෝපි එකක් හදලා දෙන්න කෝ.	Make me a coffee, will you.
තේ එකක් හදලා දෙන්න කෝ.	Make me a tea, will you.
කහට තේ එකක් හදලා දෙන්න කෝ.	Make me a plain tea, will you.
සීනි නැතුව කෝපි එකක් දෙන්න කෝ.	Give me a coffee without any sugar, will you.

NOTES ON STRUCTURE: කැමති , 'like'; the participle.

1. කැමති means 'like' and occurs with dependent nouns in the dative case and with dependent infinitives. It is discussed in Sinhala Structures, section 2.14.1.

2. දාලා is the participle form of දානවා , 'put', and is one of a number of participle forms which have now appeared. Students should now review Sinhala Structures, section 6 on the participle.

UPCOUNTRY TEA ESTATE WITH FACTORY IN DISTANCE

DIRECTIONS FOR PREPARING TEA

Below, there are sets of drills which are preliminary to three texts on how to prepare tea. The drills should be practiced chorally and individually until students know the meanings of the sentences and are able to repeat them without significant hesitation.

තේ ලෑස්ති කරන හැටි

1. (වක්කරනවා) Pouring

වතුර වක්කරන්න.	Pour the water.
කෝපි වක්කරන්න.	Pour the coffee.
තෙල් වක්කරන්න.	Pour the oil.
බූමිතෙල් වක්කරන්න.	Pour the kerosine.
පොල්තෙල් වක්කරන්න.	Pour the coconut oil.
ඇල්වතුර වක්කරන්න.	Pour the cold water.
උනුවතුර වක්කරන්න.	Pour the boiling water.

2. (හැඳිගානවා) Stirring

එක සැරයක් හැඳිගාන්න.	Stir it once.
දෙසැරයක් හැඳිගාන්න.	Stir it twice.
තුන් සැරයක් හැඳිගාන්න.	Stir it three times.
දෙතුන් සැරයක් හැඳිගාන්න.	Stir it two or three times.
හොඳට හැඳිගාන්න.	Stir it well.
ආයෙත් සැරයක් හැඳිගාන්න.	Stir it again.

4. (ඉන්නවා) **Wait ...**

මිනිත්තුවක් විතර ඉන්න.	Wait a minute or so.
මිනිත්තු දෙකක් විතර ඉන්න.	Wait two minutes or so.
මිනිත්තු පහක් විතර ඉන්න.	Wait five minutes or so.
මිනිත්තු කීපයක් ඉන්න.	Wait several minutes.

5. (ඊට පස්සේ) After that ...

ඊට පස්සේ පෝච්චියක් ගන්න.	After that, get a pot.
ඊට පස්සේ කේතලයක් ගන්න.	After that, get a kettle.
ඊට පස්සේ තේ පෙරන එකක් ගන්න.	After that, get a tea strainer.
ඊට පස්සේ හැන්දක් ගන්න.	After that, get a spoon.
ඊට පස්සේ කෝප්පයක් ගන්න.	After that, get a cup.
ඊට පස්සේ පිඟානක් ගන්න.	After that, get a plate.
ඊට පස්සේ පෝච්චි දෙකක් ගන්න.	After that, get two pots.
ඊට පස්සේ කේතල් දෙකක් ගන්න.	After that, get two kettles.
ඊට පස්සේ හැඳි දෙකක් ගන්න.	After that, get two spoons.
ඊට පස්සේ තේහැඳි දෙකක් ගන්න.	After that, get two teaspoons.
ඊට පස්සේ වීදුරුවක් ගන්න.	After that, get a glass.

6. (කිරි දානවා) Adding the milk ...

කිරි ටිකක් දාන්න.	Put in a little milk.
සිනි ටිකක් දාන්න.	put in a little sugar.

235

තේ කොළ දාන්න.	Put in loose tea.
තේ ටිකක් බොන්න.	Drink a little tea.
කිරි ටිකක් බොන්න.	Drink a little milk.

7.

පෙරලා, කිරි ටිකක් දාන්න.	Having strained (it), put in a little milk.
සීනි දාලා පෙරන්න.	Having put sugar, strain.
පෝච්චියක් අරන්, ටිකක් ඉන්න.	Having gotten a pot, wait a little.
සීනි දාලා, කිරි දාලා, බොන්න.	Having put sugar, having put milk, drink (it).
හැන්දක් අරන් සීනි දාන්න.	Having gotten a spoon, put in sugar.

NOTE TO THE STUDENT AND THE INSTRUCTOR

On the following pages there are three texts describing how to prepare tea. Using the same vocabulary, the information is essentially repeated three times in slightly different ways. This material should be handled in the following way. First the instructor should read an entire text aloud. Then the students should repeat the sentences after the instructor. Students should make sure that they understand the meanings of the sentences. When the entire text has been practiced in this manner, students should close their books. Then the teacher should read the entire text once again. When the material in all the texts has been reviewed in this manner, the instructor should close his or her book and describe the process of making tea. Each student should then be asked to repeat the instructions.



PROCESSING TEA

TEXT

HOW TO MAKE TEA -1

VERSION 1

කේතලයට ඇල්වතුර දාලා,	Having put cold water in the kettle,
ලිපේ තියන්න.	Keep it on the hearth.
වතුර උතුරනකොට,	When the water is boiling,
පෝච්චියක් ගන්න.	Get a pot.
පෝච්චියක් අරන්,	Having gotten a pot.
තේ කොළ දාන්න.	Put in tea leaves.
තේ කොළ හැන්දක් දාලා,	Having put in a teaspoon of tea leaves,
එක සැරයක් හැඳිගාන්න.	Stir it once.
මිනිත්තු දෙකක් විතර ඉන්න.	Wait two minutes or so.
ඊට පස්සේ තේ පෙරන්න.	After that, strain the tea.
කිරියි සීනියි දාලා බොන්න.	Put in milk and sugar and drink.



PROCESSING TEA

TEXT

HOW TO MAKE TEA - 2

කේතලයට ඇල්වතුර දාලා,	Having put cold water in the kettle,
ලිපේ තියන්න.	Keep it on the hearth.
වතුර හොඳට උතුරනකොට,	When the water is boiling well,
තේ පෝච්චියක් ගන්න.	Get a teapot.
තේ කොළ තේහැන්දක් පෝච්චියට දාන්න.	Put a teaspoon of tea leaves in the pot.
උතුරන වතුර කෝප්ප දෙකක් වක්කරලා,	Having poured in two cups of boiling water,
තේහැන්දකින් සැරයක් හැඳිගාලා,	Having stirred it once with a teaspoon,
මිනිත්තු දෙකක් විතර ඉන්න.	Wait two minutes or so.
ඊට පස්සේ තේ පෙරන එකකින් පෙරලා,	After that, having strained it with a tea strainer,
සීනි දාලා බොන්න.	Put in sugar and drink.
කිරි තේ කැමති නම්,	If you like milk tea,
කිරි ටිකක් දාන්න.	Put in a little milk.

TEXT

HOW TO MAKE TEA - 3

කේතලයට ඇල්වතුර දාන්න.	Put cold water in the kettle.
ලිපේ තියන්න.	Keep it on the hearth.
ලිපේ තියලා,	Having kept it on the hearth,
වතුර උතුරනකොට	When the water is boiling
තේ පෝච්චියක් ගන්න.	Get a teapot.
තේ කොළ තේහැන්දක් තේ පෝච්චියට දාලා,	Having put a teaspoon of tea leaves in the teapot,
උතුරන වතුර කෝප්ප දෙකක් වක්කරන්න.	Pour in two cups of boiling water.
එක සැරයක් හැඳිගාලා,	Having stirred it once,
පොඩ්ඩක් ඉන්න.	Wait a little.
තේ පෙරලා, සීනි දාලා, බොන්න.	Strain the tea, put in sugar and drink.

NOTE TO THE STUDENT AND TO THE INSTRUCTOR: OPTIONAL WORK

The skills which have been developed in the preceding exercise should be transferable to understanding other simple descriptions on similar topics. For example, preparing rice, making hakuru from kitul syrup or making curd. Directions for preparing other foods such as milk rice or pol sambol are also possible topics but involve more steps and more ingredients. If the students and the instructor wish to pursue this type of exercise with a new topic, they should do so in the following way. First they should decide on the food or dish to be discussed, and then the instructor should supply the class with a list of necessary ingredients. Then, slowly and succinctly, the instructor should describe how to make the dish. Students should find out the meanings of the words they do not know. Then the instructor should give the description several more times. When all students feel that they can easily comprehend what the instructor is saying, one student should try to repeat the directions to the rest of the class. Then another student should try, and so on.

THE DAILY ROUTINE

CYCLE 72

HAVE YOU RECEIVED ANY LETTERS RECENTLY?

M-1

මට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් ලියුමක් ලැබුනා.	I received a letter from the Sri Lanka Broadcasting Corporation.
මට මල්ලිගෙන් ටැලිග්‍රෑම් එකක් ලැබුනා.	I received a telegram from my younger brother.
මට රේගුවෙන් පාර්සලයක් ලැබුනා.	I received a parcel from Customs.
මහජන බැංකුවෙන් රෙපිස්ටර් ලියුමක් ලැබුනා.	Received a registered letter from the People's Bank.
ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලියුමක් ලැබුනා.	Received a letter from the Ceylon Electricity Board.
යාලුවන්ගෙන් ලියුම් ලැබුනා.	Received letters from friends.

M-2

නංගිගෙනුයි අම්මාගෙනුයි ලියුම් ලැබුනා.	Received letters from nangi and mother.
අම්මාගෙනුයි තාත්තාගෙනුයි ලියුමක් ලැබුනා.	Received a letter from my mother and father.

M-3

මේ සුමානේ	This week.
මේ මාසේ	This month.
අද	Today.
ඊයේ	Yesterday.
ගිය සුමානේ	Last week.
ලීයුමක් ලැබුනේ කාගෙන් ද?	From whom did you receive a letter?

THE DAILY ROUTINE

M-3 (continued)

ලියුමක් ලැබුනා ද?	Did you receive a letter?
ලියුම් ලැබුනා ද?	Did you receive letters?
මහත්තයාට ලඟදි ලියුම් ලැබිලා තියෙනවා ද?	Have you received any letters recently, sir?

C-1

Students should ask each other questions using the formulas given above.

A. (අද) ලියුමක් ලැබුනේ කාගෙන් ද?

B. (නංගිගෙන්) ලියුමක් ලැබුනා.

NOTES ON STRUCTURE: 'receive'; instrumental forms.

1. ලැබෙනවා , 'receive', occurs in its participial form in this lesson (ලැබිලා) and in its past form (ලැබුනා). It takes an actor in the dative case. Another, less formal verb meaning receive is හම්බ වෙනවා . Its past form is හම්බ උනා.
Examples:

මට ලියුන් දෙකක් ලැබුනා.	I received two letters.
මට ලියුන් දෙකක් හම්බ උනා.	

2. With 'receive', the person, institution, etc. from whom the item has been received is in the instrumental case. In this instance, the instrumental translates as 'from such and such a person or institution.'

THE DAILY ROUTINE

CYCLE 73

WHAT DO YOU DO WHEN YOU HAVE FINISHED WORK?

M-1

මම වැඩ ඉවර කරපුහම, ගෙදර යනවා.	When I have finished (my) work, I go home.
සාමාන්‍යයෙන්, මම තේ එකක් හදලා, හවස පත්තර කියවනවා.	I usually make a cup of tea and read the evening papers.
ඉඳලා හිටලා මම පාටියකට යනවා.	Now and then I go to a party.
සමහර දවස්වලට, මම චිත්‍රපටියක් බලන්න යනවා.	Some days I go to see a movie.
ඊයේ රෑ මම එළියට ගිහින්, ගෝල් ෆේස් හෝටලේ රෑ කෑම කෑවා.	Last night I went out and ate supper at the Galle Face Hotel.
අනිත් දවස්වලට, නිදිමත වෙනකන්, මම නිකං ඉන්නවා.	Other days I just sit around till I get sleepy.
ඊට පස්සේ මම රෑ කෑම කාලා, නිදාගන්න යනවා.	Then I eat supper and go to bed.

M-2

මහත්තයා වැඩ ඉවර කරපුහම, සාමාන්‍යයෙන් මොනවා ද කරන්නේ?	When you have finished (your) work sir, what do you usually do?
නෝනා මහත්තයා වැඩ ඉවර කරපුහම, මොනවා ද කරන්නේ?	What do you do when you have finished (your) work, madam?

C-1

Students should take this opportunity to discuss how they usually spend the evening and how they have spent recent evenings. Additional necessary vocabulary should be elicited from the instructor.

A. (මහත්තයා) වැඩ ඉවර කරපුහම, මොනවා ද කරන්නේ?

B. (ගෙදර යනවා).

NOTES ON STRUCTURE: The හම form of the verb; compound verbs with වෙනවා , 'become'; නිකං , 'just, for no particular purpose.'

1. The හම form of the verb is one of the 'when' forms. It is discussed in Sinhala Structures, section 2.91.

2. නිදිමත වෙනවා , 'become sleepy', is one of a large number of compound verbs with adjectives plus වෙනවා , 'become.' For example:

තරහ වෙනවා	become angry, get angry
මහන්සි වෙනවා	get tired
බය වෙනවා	get scared, frightened

Further discussion of compound verbs appears in Sinhala Structures, section 2.17.1.

3. The word නිකං means 'just' or 'for no particular purpose.' When followed by the emphasizing particle ම it becomes නිකම්ම Examples:

එයාලා නිකං ඉන්නවා.	They are just being, i.e., just hanging around without doing anything.
එයා නිකම්ම මැරුණා.	He just died, i.e., from no particular illness or cause.

THE DAILY ROUTINE

CYCLE 74

THERE IS A GOOD MOVIE SHOWING AT THE LIDO.

M-1

ලිඩෝ එකේ හොඳ චිත්‍රපටියක් පෙන්නනවා.	There is a good movie showing at the Lido.
ඒ ෆිල්ම් එකට කියන්නේ මධුවන්ති කියලා.	The film is called Maduvanthi.
ගැහැනු ළමයි කියලා ෆිල්ම් එක රිට්ස් එකේ පෙන්නනවා.	A film called Gehenu Lamay is showing at the Ritz.
ඒකත් බොහොම හොඳ ලු.	It is also very good, it seems.
හවස ෂෝ එක පටන් ගන්නේ හයට.	The evening show begins at six.

M-2

කොයි සිංහල ෆිල්ම් ද පෙන්නනේ?	What Sinhala films are showing?
කොයි දෙමළ ෆිල්ම් ද පෙන්නනේ?	What Tamil films are showing?
කොයි ඉංග්‍රීසි ෆිල්ම් ද පෙන්නනේ?	What English films are showing?
කොහේ ද?	Where?
කොයි හෝල් එකේ?	In what picture hall?
ෂෝ පටන් ගන්නේ කීයට ද?	When do the shows begin?
හවස ෂෝ එක පටන් ගන්නේ කීයට ද?	When does the evening show begin?

C-1

Students should use the newspaper copy on the following page to construct conversations using the formulas given above. Students may also use copies of current Sinhala or English papers to broaden the information available for the C-phase.

'ගැහැණු ළමයි'

A SCENE FROM GEHENU LAMAY, A POPULAR SINHALA FILM OF 1978.

MOVIE SCHEDULE



ලංකාදීප

ගැහැණු ළමයි

THE DAILY ROUTINE

CYCLE 75

HAVE YOU SEEN THAT MOVIE?

M-1

මම ඒක දැකලා තියෙනවා.	I have seen it.
ජෝන් දැනටම ඒක දැකලා තියෙනවා.	John has already seen it.
එයා දෙ සැරයක් දැකලා තියෙනවා.	He has seen it twice.

M-2

මම ඒ චිත්‍රපටිය දැකලා නෑ.	I have not seen that movie.
ජෝන් ඒක තවම දැකලා නෑ.	John has still not seen it.

M-3

මහත්තයා ඒ චිත්‍රපටිය දැකලා තියෙනවා ද?	Have you seen that movie, sir?
ඒක බලන්න ගිහින් තියෙනවා ද?	Have you gone to see it?

C-1

Using the movie ads in a current newspaper, students should discuss which films they have and have not seen.

A. (මහත්තයා ඒ චිත්‍රපටිය දැකලා තියෙනවා ද?)

B. (මම ඒක දැකලා නෑ).

NOTES ON STRUCTURE: perfect forms; 'see'.

1. The verb forms which appear above are perfect forms. See Sinhala Structures, section 2.6.

2. දකිනවා is another verb which means 'see'. It generally occurs only in its participipial form (දැකලා) or in its past form (දැක්කා).

THE DAILY ROUTINE

CYCLE 76

LET'S GO SEE GEHENU LAMAY

M-1

චිත්‍රපටියක් බලන්න යමු.	Let's go see a movie.
ගැහැණු ළමයි බලන්න යමු.	Let's go see Gehenu Lamay.
හොඳයි. යමු. මම ඒක කවදාවත් දැකලා නෑ.	Good. Let's go. I've never seen it.

M-2

ඒ චිත්‍රපටියට නොගිහිල්ලා ඉඳිමු. මම ඒක දැකලා තියෙනවා.	Let's not go to that picture. I've seen it.
ගැහැණු ළමයි නොබලා ඉඳිමු. ජෝන් දැනටම දැකලා තියෙනවා.	Let's not see Gehenu Lamay. John has already seen it.

M-3

ගැහැණු ළමයි බලන්න යමු ද?	Should we go see Gehenu Lamay?
වෙන චිත්‍රපටියක් බලමු ද?	Should we see another picture?
මහත්තයා ඒක කවදාවත් දැකලා තියෙනවා ද?	Have you ever seen it?

C-1

Using the formulas given above, students should make plans to actually see a picture together.

NOTES ON STRUCTURE

1. Perfect forms (Sinhala Structures, section 2.6) continue to appear above.

2. The මු form, meaning 'let's do something', is a first person plural form with අපි as the stated or implied subject. See Sinhala Structures, section 2.11. The formula for its negative is නො + participle form + ඉඳිමු , 'let's be'. This construction literally means 'not having done something, let's be', i.e., 'let's not do it.' The participle form which appears in this construction is sometimes the full form as in නොගිහිල්ලා ඉඳිමු, 'let's not go', but in most cases it is a stem form of the participle which is not treated in any detail here. viz., නොබලා ඉඳිමු, 'let's not see.'

THE DAILY ROUTINE

CYCLE 77

HOW DO YOU GET FROM HERE TO THERE?



M-1

වමට හැරෙන්න.	Turn left.
දකුණට හැරෙන්න.	Turn right.
කෙලින්ම යන්න.	Go straight.

M-2

එතනින් වමට හැරිලා යන්න.	Turn left and go from there.
එතනින් දකුණට හැරිලා යන්න.	Turn right and go from here.

M-3

තානායම දකුණු පැත්තේ.	The rest house is on the right.
ක්වීන්ස් හෝටලේ පාරේ වම් පැත්තේ.	The Queens Hotel is on the left side of the road.

M-4

හන්දියට ආවාම, දකුණට හැරෙන්න.	When you come to the junction, turn right.
බුලර්ස් පාරට ආවාම, වමට හැරෙන්න.	When you come to Bullers Road, turn left.
තැපැල් කන්තෝරුව ළඟට ගියාම, දකුණු පැත්තේ පාරක් තියෙනවා.	When you go up to the Post Office, there is a road on the right.
හෝටලේට ගිහිල්ලා, වමට හැරිලා, කෙලින්ම යන්න.	Go up to the hotel, turn left and go straight.

M-5

මෙතන ඉඳලා ගෝල්ෆේස් හෝටලේට යන හැටි මට කියන්න.	Tell me the way from here to the Galle Face Hotel.
මෙතන ඉඳලා පිටකොටුවට යන හැටි මට කියන්න.	Tell me the way from here to the Pettah.
ගෙදර ඉඳලා කන්තෝරුවට මහත්තයා යන්නේ කොහොම ද?	How do you go from your house to the office, sir?

C-1

The instructor should describe how he or she goes from home to work. Then students should describe the route to each other. Next, students should describe how they go from their own homes to work, using the formulas given above.

C-2

Using the maps which are included below, students should practice asking for and giving directions between points of interest.

NOTES ON STRUCTURE: verb forms

Giving and understanding directions is often thought of as an elementary language skill, but it a difficult task in any language because it requires close attention to detail on the part of both speaker and listener. In addition, the grammatical structures involved in giving and receiving accurate directions are numerous, as the Sinhala given above should suggest.

1. Verb forms which appear in this cycle.

a. The infinitive (command) form. See Sinhala Structures, section 2.5. Examples:

වමට හැරෙන්න.	Turn left.
දකුණට හැරෙන්න.	Turn right.

b. The present tense forms. See Sinhala Structures, section 2.2. Examples:

දකුණු පැත්තේ පාරක් තියෙනවා.	There is a road on the right.
මහත්තයා යන්නේ කොහොම ද?	How do you go, sir?

c. The 'when' form. See Sinhala Structures, section 2.8. Example:

හන්දියට ආවාම, දකුණට හැරෙන්න.	When you come to the junction, turn right.

d. The participle form. See Sinhala Structures, section 2.6

වමට හැරිලා යන්න.	Turn left and go.

e. The present verbal adjective form. See Sinhala Structures, 2.3. In this cycle the verbal adjective form modifies the plural noun හැටි, 'means', and takes on an idiomatic meaning. Examples:

යන හැටි	Going means; the means, manner of going, i.e., how (you) go.
යන හැටි මට කියන්න.	Tell me how (you) go.

Similarly:

හදන හැටි මට කියන්න.	Tell me how you make it, i.e., give me the instructions.
කිරි බත් උයන හැටි මට කියන්න.	Tell me how you cook milk rice.



OLD DUTCH CHURCH, GALLE


tterfly Bridge
Star Bastion
Aeolus Bastion
Clippenberg Bastion
Neptune Bastion
Triton Bastion
Light House
Jetty
Club
Jetty
Zwart Bastion
olice Station
Fort
Bastion
chcheri
rora Bastion
Point Utrecht Bastion
0
5
10 CHAINS
SCALE

GUIDE MAP TO GALLE FORT


MAWILMADA
MAHAWELI REACH
NITTAWELA
WATAPULUWA
MAHAIYAWA
ARUPPOLA
Mahaweli Ganga
Suspension Bridge
ASGIRI VIHARA
TOWN HALL
POST OFFICE
PEAK VIEW
HOTEL DEHIGAMA
BAHIRAWAKANDA
OLD EMPIRE
DALADA MALIGAWA
(Temple of the Tooth)
QUEEN'S HOTEL
ARTS & CRAFTS CENTRE
KANDY TOURINN
HOTEL TOPAZ
POLICE
MARKET
KANDY LAKE
TOURIST BOARD OFFICE
SUNRAY INN
TO HANGURANKETA
POST OFFICE
Y.M.C.A.
Y.M.C.A.
MALWATTA VIHARA
WINDY COT
KANDY R.S.
CASTLE HILL
HOTEL SUISSE
RIVERDALE
BOY SCOUTS HEAD QRS.
HOSPITAL
RUBAIYAT
CHALET
FRANGIPANI
AMPITIYA
RAJAPIHILLA
(King's Bath)
SUDUHUMPOLA

KANDY GUIDE MAP


Twin Ponds
Ratna Prasada
(TANK)
BASAWAK KULAMA (TANK)
Jetavanaramaya
Ruvanveliseya
Brazen Palace
Mirisavatiya
Tissawewa Rest House
ROYAL
PLEASURE GARDENS
Dakkhina
Pagoda
Bodhi
Tree
RAILWAY STATION
AND REST HOUSE
Market
Isurumuniya
Vessagiriya
MALVATU
OYA
Bank of Ceylon
Post Office
The Kachcheri
Police Station
Hospital
To Air Port

ANURADHAPURA GUIDE MAP

MONOLOGUE

WHAT I DID YESTERDAY

Each student should be given an opportunity to tell, in some detail, what he did yesterday. Students who do not know the vocabulary they need should ask the instructor for it. Other students in the class should be free to ask questions of the student who is giving the monologue. When each student has finished telling his story, a second student should be assigned to retell the story to the rest of the class.

On the following pages there are sample texts pertaining to the daily routine. The two texts differ in their vocabulary but present a wide range of similar structures which should by now be familiar to the student. These texts may be used as models for the monologues, and otherwise as the class chooses.

THE DAILY ROUTINE

WHAT DID YOU DO TODAY?

TEXT I

අද උදේ මම නැගිට්ටේ පහට විතර.	This morning I got up about five.
බත් කාලා, තේ ටිකක් බීලා, කුඹුරට ගියා.	I ate rice, drank some tea and went to the field.
අද උදේ මමයි, මල්ලියි, උඩහ කුඹුරු හාන්න පටන්ගත්තා.	This morning, my younger brother and I began to plow the upper fields.
අපි දහය වෙනකන් කුඹුරුවල වැඩ කරලා, තේ ටිකක් බිව්වා.	We worked in the fields till 10 and then drank some tea.
අපි දවල් වෙනකන් කුඹුරුවල වැඩ කෙරුවා.	We worked in the fields till noon.
දවල්, මගේ දුව කුඹුරට බත් ගෙනාවා.	At noon, my daughter brought rice to the field.
අපි කෑම කාලා, මහන්සි ඇරියා.	Having eaten, we rested.
මහන්සි ඇරලා, අපි හතර වෙනකන් හෑවා.	Having rested, we plowed till four.
හතරට, හරක් නගුලෙන් ලිහලා, අපි ආපහු ගමට ගියා.	At 4, we untied the buffaloes from the plow, and returned to the village.
අපි ආපහු ගමට ඇවිල්ලා, වැවට නාන්න ගියා.	We returned to the village, and went to the tank to bathe.
අපි නාලා, ගෙදර ගිහිල්ලා රෑ කෑම කෑවා.	We bathed, we went home and ate dinner.
අපි කෑම කාලා, ඉස්කෝලෙට ගිහිල්ලා, රේඩියෝ එක ඇහැව්වා.	Having eaten, we went to the school and listened to the radio.
අපි ඉස්කෝලෙන් ඇවිල්ලා, නිදාගන්න ගියා.	We came back from the school and went to bed.

THE DAILY ROUTINE

WHAT DID YOU DO TODAY?

TEXT II

අද උදේ මම නැගිට්ටේ හතට විතර.	This morning I got up about seven.
මම නැගිටලා, නාලා, උදේ කෑම කෑවා.	I got up, bathed and ate breakfast.
මම බිත්තරයි බේකනුයි කෑවා.	I ate eggs and bacon.
කෑම කාලා මම කාමරයට ගියා.	I ate and returned to my room.
කාමරයට ගිහිල්ලා, මම පැය එක හමාරක් සිංහල ඉගෙනගත්තා.	Having returned to my room, I studied Sinhala for one and a half hours.
ඉගෙනගෙන, මම පන්තියට ගියා.	After studying, I went to class.
මම මුළු උදේම පන්තියේ හිටියා.	I was in class throughout the morning.
දොලහට, මම ලියුම් ගේන්න තැපැල් කන්තෝරුවට ගියා.	At 12, I went to the post office to bring my mail.
මට අම්මාගෙන් ලියුමක් ලැබුනා.	I received a letter from my mother.
මම සහෝදරයාට ලියුමක් තැපැල් කෙරුවා.	I posted a letter to my brother.
ඊට පස්සේ මම දවල් කෑම කෑවා.	After that, I ate lunch.
දවල් කෑම කාලා, මම වත්තට ගියා.	Having eaten lunch, I went to my garden.
වත්තට ගිහිල්ලා, මම පැළවලට වතුර දැම්මා. තණකොළ ගැලෙව්වා.	Having gone to my garden, I watered the plants. I uprooted the grass.
ඊට පස්සේ මම කුකුල්ලු බලාගන්න ගියා.	Then, I went to look after the chickens.
හතරට, මම ලංකාව ගැන චිත්‍රපටියක් බලන්න ගියා.	At 4:00, I went to see a film about Sri Lanka.

THE DAILY ROUTINE

TEXT II (continued)

මම හයට රෑ කෑම කාලා, හත වෙනකන් පාඩම්කරලා, දහයමාරට නිදාගන්න ගියා.	I ate dinner at 6, studied till 7, and went to bed at 10:30.

UNDERSTANDING CONVERSATIONS BETWEEN SINHALA SPEAKERS

For the purpose of the present exercise, two speakers of Sinhala should be in the classroom.

The first instructor should describe what he did yesterday to the second instructor. The second instructor is free to respond by asking questions of the first. The instructors should speak rapidly and carry on the conversation, as nearly as possible, as if the students were not there. The instructors should assume that in this rapid first telling students will not be able to understand everything which is said. When the second instructor gets all the details, he should tell them slowly and carefully to the class. Students should find out the meanings of vocabulary items they do not know. The the second instructor should tell the story one or two more times. When all students have understood, one student should volunteer to tell the story to the rest of the class. Then a second student should try to tell the story faster and with fewer errors than the first student. A third student should try to improve on the second telling and so on.



WHICH PILE IS BIGGER, THIS ONE OR THAT ONE?

CYCLE 78

HOW MUCH IS IT?
WHICH IS CHEAPER?

M-1

රාත්තලක් සත හැත්තෑපහයි.	75¢ a pound.
ටින් එකක් විසි හයයි පනහයි.	Rs. 26.50 a tin.
එකක් සත දහයයි.	10¢ each.
සේරුවක් එකයි හැත්තෑපහයි.	Rs. 1.75 a measure.
පැකැට් එකක් හතයි පනහයි.	Rs. 7.50 a packet.
රාත්තලක් එකයි පනහයි.	Rs. 1.50 a pound.
බෝතලයක් රුපියලයි.	A rupee a bottle.

M-2

කුකුල් මස්වලට වැඩියෙ ඌරු මස් ලාබයි.	Pork is cheaper than chicken.
වම්බොටුවලට වැඩියෙ බෝංචි ගණන්.	Green beans are more expensive than brinjals.

බෝංචි රාත්තලක් කීය ද?	How much is a pound of green beans?
බටර් රාත්තල් බාගයක් කීය ද?	How much is a half pound of butter?
කෝපි කුඩු රාත්තල් කාලක් කීය ද?	How much is a quarter pound of coffee?
ලුණු කීය ද?	How much is salt?
ලූනු කීය ද?	How much are onions?
හාල් පිටි කීය ද?	How much is rice flour?
(පාන්) (තිරිඟු) පිටි කීය ද?	How much is wheat flour?
අන්නාසි කීය ද?	How much is pineapple?
බූමි තෙල් ගැලුමක් කීය ද?	How much is a gallon of kerosene?
පැට්‍රල් ගැලුමක් කීය ද?	How much is a gallon of gas?

M-4

මොනවා ද ගණන්, පැට්‍රල් ද, බූමි තෙල් ද?	Which is more expensive, gas or kerosene?
මොනවා ද ගණන්, හාල් පිටි ද, පාන් පිටි ද?	Which is more expensive, rice flour or wheat flour?
මොනවා ද ලාබ, ඌරු මස් ද, කුකුල් මස් ද?	Which is cheaper, pork or chicken?
කුකුල් මස්වලට වැඩියෙ ඌරු මස් ලාබ ද?	Is pork cheaper than chicken?

C-1

Students should elicit the going prices of major foodstuffs from the instructor. If the class is conducted in the United States, dollars should be substituted for rupees. If the class is conducted in Sri Lanka, the C-phase of this cycle provides a good opportunity to visit shops which sell fruits, vegetables, spices and Sinhalese medicines. Many of the items sold in such shops will not be familiar to the learner. This is a chance to learn to identify them by shape, color and smell and perhaps to make a few purchases.

A. (අන්නාසි) කීය ද?

B. (එකක්) (දෙකයි පනහයි).

NOTE ON STRUCTURE: the comparative. See Sinhala Structures, section 4.1.

ADDITIONAL VOCABULARY: FOODSTUFFS

A list of some of the foodstuffs marketed in Sri Lanka appears below. Names of foodstuffs in Sinhala are generally plural forms. All forms below are plurals unless otherwise noted.

1. Vegetables (එළවළු ජාති)

අළු කෙහෙල්	ash plantain	මුරුංගා	drumsticks
අළු පුහුල්	ash pumpkin	කොස්	jakfruit
බෝංචි	beans	බණ්ඩක්කා	ladies' fingers
කරවිල	bitter gourd	ලීක්	leeks
දෙල්	breadfruit	රාබු	radish
වම්බොටු	brinjal (eggplant)	පතෝල	snake gourd
ගෝවා	cabbage	තක්කාලි	tomatoes
කැරට්	carrots		
පිපිඤ්ඤා	cucumber		

2. Yams (අල ජාති)

රට ළූනු	bombay onions	මඤ්ඤොක්කා	manioc
දෙහි අල	dehiala	අර්තාපල්	potatoes
සුදු ළූනු	garlic	රතු ළූනු	red onions
ඉන්නල	innala	බතල	sweet potatoes
කිරි අල	kiriala		

3. Cereals and pulses

අමු	amu millet	මෙනේරි	mineri
කඩල	Bengal gram	හාල්	rice
මුං ඇට	green gram	තණහාල්	thanahal
කුරක්කන් (කුරහන්)	kurakkan millet	තිරිඟු	wheat
ඉරිඟු	maize		

4. Fruits (පලතුරු ජාති)

ඇපල්	apple	අන්නාසි	pineapple
පේර	avocado	කෙසෙල්ගෙඩි	plantain
අඹ	mango	රඹුටන්	rambutan
දොඩම්	orange	ජම්බු	rose apple
ගස් ලබු	papaya	දිවුල්	wood apple

5. Spices and condiments (කුළුබඩු)

එනසාල්	cardamom	අබ	mustard
කුරුඳු	cinnamon	සාදික්කා	nutmeg
කොත්තමල්ලි	coriander	ගම්මිරිස්	pepper (black)
තුනපහ කුඩු	curry powder	මිරිස්	pepper (red)
ඉඟුරු	ginger	කහ	saffron (tumeric)
දෙහි	lime	ලුණු	salt
උම්බලකඩ	Maldive fish	විනාකිරි	vinegar

6. Meats, fish and eggs

හරක් මස්	beef	එළු මස්	mutton
හරක් පිඟුඩු	beef liver	ඌරු මස්	pork
කුකුල් මස්	chicken	ඉස්සෝ	prawns
කකුළුවෝ	crab	තෝර	seer fish
බිත්තර	eggs		

7. Dairy products

මී කිරි	buffalo milk	කේජු, චීස්	cheese
බටර්	butter	පිටි කිරි	powdered milk
එළ කිරි	cow milk	මුදවපු කිරි	yoghurt

8. Ingedients for beverages, prepared beverages

අරක්කු	arrack	සෝඩා	soda
බීර	beer	තේ කොළ	tea leaves
කෝපි ඇට	coffee beans	රා	toddy
කෝපි කුඩු	coffee powder	වයින්	wine
නෙස්කෝපි	coffee powder ("imported")		

9. Prepared foods

විස්කෝත්තුව (විස්-කෝත්තු pl.)	biscuit (cookie)	ජෙලි	jelly
පාන්	bread	කොකිස්	kokis
පාන් ගෙඩිය (sing.)	bread, loaf of	කැවුම්	oil cakes
බනිස්	buns	අච්චාරු	pickle
ජෑම්	jam		

THE LAND AND THE PEOPLE: FARM AND HOME

CYCLE 79

WHAT DO YOU CALL THIS THING HERE?

M-1

ඒකට කියන්නේ කුල්ල කියලා.	For that you say winnowing basket.
ඒකට කියන්නේ ඇඳ කියලා.	For that you say charpoy.
ඒකට කියන්නේ මෝල්ගහ කියලා.	For that you say pestle.

M-2

මෙතන තියෙන එකට මොකද්ද කියන්නේ?	What do you call this thing here?
ඔතන තියෙන එකට මොකද්ද කියන්නේ?	What do you call that thing over there.

C-1

Students should use the dwelling plans in the textbook to locate and name domestic articles.

A. මෙතන තියෙන එකට මොකද්ද කියන්නේ?

B. ඒකට කියන්නේ ලබු ගෙඩිය කියලා.

NOTES ON STRUCTURE: verbal adjective and verbal noun; location words.

1. තියෙන එක , 'the thing being or located', is a verbal noun derived from තියෙනවා , 'be'. It is made up of the present verbal adjective plus එක . Discussion appears in Sinhala Structures, section 2.19.

2. මෙතන , 'this place', and ඔතන , 'that place', belong to a location set which is discussed in Sinhala Structures, section 3.24.

KEY TO DWELLING PLAN AND AXONOMETRIC [() = plural]

a. Architectural elements and permanent fixtures.

1.	පිල (පිල්)	stoop
2.	කොට පිල (පිල්)	half wall
3.	කවුලුව (කවුලු), ජනේලේ (ජනෙල්)	window
4.	කැඩ්ච්ච කුරක්කන් ගල (ගල්)	broken rotary quern
5.	පීල්ල (පීලි)	gutter
6.	කෝන් කරුව (කරු)	corner post
7.	කරුව (කරු)	post
8.	තලාඳු /කුරුපාව(කුරුපා)	cross beam; king post
9.	දැවේ (දැව)	top plate
10.	යට ලීය (ලී)	ridge pole
11.	කෝන් පරාලේ (පරාල)	hip rafter
12.	ලිප (ලිප්)	hearth
13.	ලුණු කරුව (කරු)	salt stand
14.	මිරිස් ගල (ගල්)	saddle quern
15.	මිරිස් ගල (ගල්)	saddle quern
16.	වී කොටන්න ගල (ගල්)	stone to pound paddy
17.	කුරක්කන් ගල (ගල්)	rotary quern
18.	දුම් මැස්ස (මැසි)	smoke shelf
19.	ලැල්ල (ලැලි)	storage shelf
20.	ලාම්පු ලැල්ල (ලැලි)	lamp shelf
21.	ලනුව (ලනු)	line
22.	වැට (වැටවල්)	fence

b. Baskets and mats

1.	පෙට්ටිය (පෙට්ටි)	large type of rush basket
2.	ඇවිල්ල (ඇවිලි)	smaller type of rush basket
3.	වට්ටිය (වට්ටි)	large flat rush basket
4.	තට්ටුව (තට්ටු)	smaller flat rush basket
5.	වට පෙට්ටිය (පෙට්ටි)	type of storage basket
6.	මල්ල (මලු)	woven bag
7.	පැදුර (පැදුරු)	mat
8.	කුල්ල (කුලු)	winnowing basket

c. Wood and wooden articles

1.	පෙට්ටිය (පෙට්ටි)	box
2.	වං ගෙඩිය (ගෙඩි)	mortar
3.	මෝල්ගහ (මෝල්ගස්)	pestle
4.	මෝල්ගහ (මෝල්ගස්)	pestle
5.	බංකුව (බංකු)	bench
6.	කොලොඹුව (කොලොඹු)	stool
7.	මේසේ (මේස)	table
8.	ඇඳ (ඇඳන්)	bed, charpoy
9.	ලී	lumber

d. Articles made from shells, gourds and leaves

1.	පුවක් කොලේ (කොල)	arecanut leaf
2.	ගොටුව (ගොටු)	basket made from arecanut leaf
3.	කොලොත් කොලේ (කොල)	wrapping leaf
4.	ලබු ගෙඩිය (ගෙඩි)	vessel made from gourd
5.	පොල් කට්ට (කටු)	half coconut shell
6.	පොල් කටු හැන්ද (හැඳි)	spoon made from coconut shell
7.	දරණුව (දරණු)	pot cradle

e. Unglazed earthenware

1.	අප්පල්ලේ (අප්පල්ල)	pot used for cooking vegetables
2.	මුට්ටිය (මුට්ටි)	pot used for cooking rice
3.	කොරහ(කොරස්)	all purpose large pot
4.	තැඹිලිය (තැඹිලි)	pot for separating stones from rice

f. Metal articles

1.	සෙම්බුව (සෙම්බු)	small brass vessel
2.	බුලත් තට්ටුව (තට්ටු)	betel tray
3.	රොටි කබල (කබල්)	griddle
4.	මුට්ටිය (මුට්ටි)	pot used for cooking rice
5.	තැඹිලිය) (තැඹිලි)	pot for separating stones from rice
6.	කළගෙඩිය (ගෙඩි)	water vessel
7.	කේතලේ (කේතල්)	kettle
8.	ලාම්පුව (ලාම්පු)	lamp
9.	තේ පෝච්චිය (පෝච්චි)	teapot
10.	පෙට්ටිය	box

g. Foodstuffs and medicines

1.	කුරක්කත්	millet
2.	වී, හාල්	rice
3.	ඉරිඟු	maize
4.	මිරිස්	chillies
5.	පුවක් ගෙඩි	arecanuts
6.	කිතුල් පැණි	*kitul* honey
7.	අඹ ඇටේ (ඇට)	mango seed
8.	බෙහෙත්	medicine

h. Clothing

1.	සරොම (සරොම්)	sarong
2.	කමිසය (කමිස)	shirt
3.	පටිය (පටි)	belt
4.	චීත්ත	chintz cloth
5.	බොඩිය (බොඩි)	bra
6.	හැට්ටේ (හැට්ට)	blouse
7.	රෙද්ද (රෙදි)	cloth

i. Miscelleneous

1.	බට ලීය (ලී)	hollow stick used as bellows
2.	දර	firewood
3.	කෝප්පේ (කෝප්ප)	cup
4.	පිඟාන (පිඟන්)	plate
5.	ටින් එක (ටින්)	tin can
6.	බෝතලේ (බෝතල)	bottle
7.	සූට්කේස් එක (සූට්කේස්)	suitcase
8.	ගෝනිය (ගෝනි)	gunny sack
9.	කුඩේ (කුඩ)	umbrella
10.	මල්ල (මලු)	bag
11.	ගිනි පෙට්ටිය (පෙට්ටි)	box of matches
12.	කතුර (කතුරු)	scissors
13.	ඉඳිකටුව (ඉඳිකටු)	needle
14.	නූල (නූල්)	thread
15.	කොට්ටේ (කොට්ට)	pillow



AXONOMETRIC

© ROBERT D. MacDOUGALL 1977



PLAN

© ROBERT D. MacDOUGALL 1977

THE LAND AND THE PEOPLE: FARM AND HOME

CYCLE 80

WHAT IS IT MADE OF?

M-1

කුල්ල හදලා තියෙන්නේ වේවැල්වලින්.	The winnowing basket is made from cane.
පෙට්ටි ලීවලින් හදලා තියෙනවා.	Boxes are made from wood.
මුට්ටි මැටිවලින් හදලා තියෙනවා.	(Rice) pots are made from clay.

M-2

කුලු හදලා තියෙන්නේ මොනවාවලින් ද?	What are winnowing baskets made of?
මුට්ටි හදලා තියෙන්නේ මොනවාවල්න් ද?	What are (rice) pots made of?

C-1

Students should continue discussing the domestic articles in the dwelling plans.

A. (වං ගෙඩි) හදලා තියෙන්නේ මොනවාවලින් ද?

B. (වං ගෙඩි) හදලා තියෙන්නේ (ලීවලින්).

NOTE ON STRUCTURE: review

If students find it necessary, they should review instrumental case forms and perfect forms of the verb in class or as homework.

THE LAND AND THE PEOPLE: FARM AND HOME

CYCLE 81

WHAT DO YOU USE A WINNOWING BASKET FOR?

M-1

ඒක පාවිච්චි කරන්නේ වී පොළන්න.	It is used for winnowing paddy.
ඒක කුරක්කන් අඹරන්න පාවිච්චි කරනවා.	It is used for grinding millet.
ඒක බත් උයන්න පාවිච්චි කරනවා.	It is used for cooking rice.
ඒක වතුර තියාගන්න පාවිච්චි කරනවා.	It is used for storing water.

M-2

වී වපුරන්න අපි ලොකු වේවැල්වලින් හදපු පෙට්ටියක් පාවිච්චි කරනවා. ඒකට කියන්නේ වප් පෙට්ටිය.	For sowing paddy we use a big basket made from cane. You call that a sowing basket.
වී එකතු කරන්න අපි පාවිච්චි කරන්නේ ලොකුම පන් කොලවලින් හදපු පෙට්ටි.	For storing paddy we use the biggest baskets made from rush.
වී එකතු කරන්න සමහර මිනිස්සු වී අටු පාවිච්චි කරනවා.	Some people use rice bins for storing paddy.
වතුර තියාගන්න ඒගොල්ල කළගෙඩිය පාවිච්චි කරනවා.	For keeping water those people use the water vessel.
කුරක්කන් අඹරන්න ඒගොල්ල පාවිච්චි කරන්නේ කුරක්කන් ගලක්.	For grinding millet those people use a rotary quern.

M-3

මුට්ටිය පාවිච්චි කරන්නේ මොකට ද?	What do you use the (rice) pot for?
කුල්ලක් පාවිච්චි කරන්නේ මොකට ද?	What do you use a winnowing basket for?

M-4

හාන්න පාවිච්චි කරන්නේ මොකද්ද?	What do you use for plowing?
කුරක්කන් අඹරන්න පාවිච්චි කරන්නේ මොකද්ද?	What do you use for grinding millet?

C-1

Students should ask and answer questions pertaining to household or farm articles using the formulas given above.

A. (හාන්න) පාවිච්චි කරන්නේ මොකද්ද?

B. (හාන්න) (අපි)(නගුලක්)පාවිච්චි කරනවා.



WHAT ARE THESE THINGS USED FOR?

THE LAND AND THE PEOPLE: FARM AND HOME

CYCLE 82

WHAT ARE THE VARIOUS THINGS USED TO STORE PADDY?

M-1

කුඹුරු හාන්න නගුලුයි ට්‍රැක්ටරුයි පාවිච්චි කරනවා.	Plows and tractors are used to plow fields.
වතුර තියාගන්න බාල්දියි කළගෙඩියි පාවිච්චි කරනවා.	Buckets and water vessels are used to keep water.
වී එකතු කරන්න වී අටුයි පෙට්ටියි පාවිච්චි කරනවා.	Rice bins and baskets are used to store paddy.
බත් උයන්න ඇලුමිනියම්වලින් හදපු මුට්ටියි මැටිවලින් හදපු මුට්ටියි පාවිච්චි කරනවා.	Aluminum pots and earthenware pots are used to cook rice.

M-2

වී එකතු කරන්න පාවිච්චි කරන ඒවා මොනවා ද?	What are the various things used to store paddy?
කුඹුරු හාන්න?	plow fields?
අඳුම් මහන්න?	sew clothes?
වතුර උතුරන්න?	boil water?
බබාලා නාවන්න?	bathe babies?
දත් මදින්න?	brush teeth?
බත් උයන්න?	cook rice?
තේ හදන්න?	make tea?
ගොයම් කපන්න?	cut paddy?
හාල් මනින්න?	measure rice?
බුලත් විටක් ලෑස්ති කරන්න.	prepare a betel chew?
කිරි බත් හදන්න?	make milk rice?

C-1

Using the formulas given above, discuss the tools used to carry out various household and farm tasks.

A. (බත් උයන්න) පාවිච්චි කරන ඒවා මොනවා ද?

B. (බත් උයන්න) මුට්ටි පාවිච්චි කරනවා.

THE LAND AND THE PEOPLE: FARM AND HOME

CYCLE 83

MAKING SUBSTITUTIONS

M-1

හාල් අඩු නම්....	If the rice is low....
සල්ලි හිඟ නම්....	If money is scarce....
සල්ලි මදි නම්....	If money is insufficient....
සල්ලි ඇති නම්....	If money is sufficient....
මිනිස්සු කැමති නම්....	If people like....

M-2

සමහර අය පාන් වෙනුවට බත් කනවා.	Some people eat rice instead of bread.
සමහර අය බත් වෙනුවට කුරක්කන් කනවා.	Some people eat millet instead of rice.
ඒගොල්ල බත් වෙනුවට ඉරිඟු කනවා.	They eat maize instead of rice.
ඒගොල්ල සීනි වෙනුවට හකුරු පාවිච්චි කරනවා.	They use hakuru instead of sugar.
මැටිවලින් හදපු මුට්ටි වෙනුවට, ඒගොල්ල ඇලුමිනියම්වලින් හදපු ඒවා පාවිච්චි කරනවා.	Instead of earthenware pots, they use aluminum ones.
ලාම්පු වෙනුවට ඒගොල්ල ලන්තෑරුම් පාවිච්චි කරනවා.	Instead of lamps, they use lanterns.

M-3

ඒගොල්ල බත් කන්නේ දවසට එක සැරයයි.	They eat rice once a day.
ඒගොල්ල බත් කන්නේ දවසට දෙ සැරයයි.	They eat rice twice a day.
ඒගොල්ල දවසට එක සැරයක්වත් බත් කනවා.	They eat rice at least once a day.
ඒගොල්ල හැමදාම උම්බලකඩ කනවා.	They eat Maldive fish every day.

M-4

ලංකාවේ කවුරුත් බත් කනවා ද?	Does everybody in Sri Lanka eat rice?
කවුරුත් උම්බලකඩ කනවා ද?	Does everybody eat Maldive fish?

M-5

මිනිස්සු බත් කන්නේ නැත්තං, ඒවා වෙනුවට මොනවා ද කන්නේ?	If people don't eat rice, what do they eat instead of it?
මිනිස්සු ලන්තැරුම් පාවිච්චි කරන්නේ නැත්තං, ඒවා වෙනුවට මොනවා ද පාවිච්චි කරන්නේ?	If people don't use lanterns, what do they use instead of them?

C-1

Students should use the formulas, vocabulary and general information presented in the M-phases to ask questions of the instructor about differences in dietary habits and in the uses of domestic articles and agricultural tools.

A. ලංකාවේ කවුරුත් බත් කනවා ද?

B. සමහර අය බත් වෙනුවට පාන් කනවා.

THE LAND AND THE PEOPLE: FARM AND HOME

CYCLE 84

MAKING OBSERVATIONS AND GETTING EXPLANATIONS

M-1

සමහර අයට ගෙදරවල්වල වී අටු තියෙනවා ලු.	Apparently some people have rice bins in their houses.
අනිත් අයට වී අටු නැති ලු.	It seems that other people don't have rice bins.
සමහර අයට වී අටු තිතේතේ මොකද, අනිත් අයට නැත්තේ මොකද, කියාදෙන්න පුලුවන් ද?	Can you explain to me why some people have rice bins and other people don't?
සමහර අය වී අටුවල වී එකතු කරනවා ලු.	Some people keep their rice in rice bins, it seems.
අනිත් අය ඒවා ආණ්ඩුවට විකුණනවා ලු.	It seems that other people sell it to the government.
සමහර අය වී අටුවල වී එකතු කරන්නේ මොකද, අනිත් අය ආණ්ඩුවට විකුණන්නේ මොකද, කියාදෙන්න පුලුවන් ද?	Can you explain to me why some people keep the rice in bins and other people sell it to the government?
සමහර අය වී සමුපකාරයට විකුණනවා.	Some people sell the rice to the cooperative.
අනිත් අය මුදලාලි කෙනෙකුට විකුණනවා.	Other people sell it to a merchant.
සමහර අය වී සමුපකාරයට විකුණන්නේ මොකද, අනිත් අය මුදලාලි කෙනෙකුට විකුණන්නේ මොකද, කියාදෙන්න පුලුවන් ද?	Can you explain to me why some people sell the rice to the cooperative and other people sell it to a merchant?

සමහර අය වී අතින් කොටනවා ලු.	Some people pound rice by hand, it seems.
සමහර අය වී මෝලට අරන් යනවා ලු.	Some people take the rice to the mill, it seems.
සමහර අය වී අතින් කොටන්නේ මොකද, අනිත් අය වී මෝලට අරන් යන්නේ මොකද, කියාදෙන්න පුලුවන් ද?	Can you explain to me why some people pound rice by hand and other people take it to the mill?

NOTE TO THE STUDENT AFTER M-1

The vocabulary and information in M-1 touch indirectly on matters of rural credit. Students who have an interest in this topic may wish to explore other aspects of it and elicit the necessary vocabulary from the instructor. Others may wish to confine themselves to the vocabulary and information which has appeared in the preceding cycles.

The purpose of this cycle is to illustrate one way of posing questions which require the listener to make certain inferences. First, the observations of the speaker are laid out in as much detail as the situation requires. Then, the observations are reframed as a question.

CYCLE 85

WHERE IS RICE SOWN?

M-1

වී වපුරන්නේ කුඹුරුවල.	They sow rice in paddy lands.
වී ගොවිතැන් කරන්නේ කුඹුරුවල.	They cultivate rice in paddy lands.
කුරක්කනුයි ඉරිඟුයි වවන්නේ හේන් කියලා ඉඩම්වල.	They grow kurakkan millet and corn in lands called chenas.
හේන්වලත් වවන්නේ මිරිසුයි, අබයි මෑකරලුයි.	They also grow chillies, mustard and cowpeas in chenas.
කොස් වවන්නේ ගෙවතුවල.	They grow jak in kitchen gardens.
තේ වවන්නේ උඩරට තේ වතුවල.	They grow tea in the Upcountry on tea estates.

M-2

ලංකාවේ ගම්වල, වී වපුරන්නේ කොතන ද?	In the villages of Sri Lanka, where is rice sown?
කොයි ඉඩම්වල ද?	On what lands?
කොයි තැන්වල ද?	In what places?
කොයි පලාත්වල ද?	In what areas (of the country)?

C-1

The instructor should draw a simple map of a village area showing the various cultivation areas. (The Survey Department also has small-scale maps of villages which could be used for this purpose.) Then the instructor should describe where crops of various kinds are usually grown in village areas. When a few major crops have been described in this manner, students should refer to the list of foodstuffs on pages 247 and 248 and ask about the cultivation of other crops which interest them.

A. ලංකාවේ ගම්වල කුරක්කන් වවන්නේ කොතන ද?

B. කුරක්කන් වවන්නේ හේන්වල.

282



PREPARING THE TERRACES

PADDY CULTIVATION

PART A

The material on the following pages is preliminary to a number of texts on the cultivation of paddy. These drills should be practised, individually and chorally, until students themselves can repeat them correctly and without hesitation. The texts should be memorized.

1.	හොඳ දවසක් බලන්න.	Look into a good day.
	නැකැත් දවසක් බලන්න.	Look into an auspicious day.
	හොඳ නැකැත් දවසක් බලන්න.	Look into a good, auspicious day.
	හොඳ දවසක් බලලා	Having looked into a good day,
	නැකැත් දවසක් බලලා	Having looked into an auspicious day,
	හොඳ නැකැත් දවසක් බලලා	Having looked into a good, auspicious day,
2.	වතුර කුඹුරට එවන්න.	Send the water into the field.
	වතුර කුඹුරුවලට එවන්න.	Send the water into the fields.
	උඩහ කුඹුරුවලට වතුර එවන්න.	Send the water into the upper fields.
	පහල කුඹුරුවලට වතුර එවන්න.	Send the water into the lower fields.
3.	නැකැත් දවසක් බලලා කුඹුරුවලට වතුර එවන්න.	Look into an auspicious day and send the water into the fields.
4.	නියරවල් බඳින්න.	Fix up the bunds.
	නියරවල් හොඳට බඳින්න.	Fix up the bunds well.

PADDY CULTIVATION

5.	එවන්න ඉස්සරවෙලා	Before sending
	වතුර එවන්න ඉස්සරවෙලා	Before sending the water
	කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා	Before sending the water into the field.
	කුඹුරුවලට වතුර එවන්න ඉස්සරවෙලා	Before sending the water into the fields.
	උඩහ කුඹුරුවලට වතුර එවන්න ඉස්සරවෙලා	Before sending the water into the upper fields.
	පහළ කුඹුරුවලට වතුර එවන්න ඉස්සරවෙලා	Before sending the water into the lower fields.
	නැකැත් දවසක් බලන්න ඉස්සරවෙලා	Before looking into an auspicious day.
	නියරවල් බඳින්න ඉස්සරවෙලා	Before fixing up the bunds.
	නියරවල් හොඳට බඳින්න ඉස්සරවෙලා	Before fixing up the bunds well.
6.	කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා නියරවල් බඳින්න.	Before sending the water into the field, fix up the bunds.
	කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා නියරවල් හොඳට බඳින්න.	Before sending the water into the field, fix up the bunds well.
	කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා හොඳ දවසක් බලන්න.	Before sending the water into the field, look into a good day.
	කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා නැකැත් දවසක් බලන්න.	Before sending the water into the field, look into an auspicious day.
	කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා හොඳ නැකැත් දවසක් බලන්න.	Before sending the water into the field, look into a good, auspicious day.

PADDY CULTIVATION

7.	ඊට පස්සේ කුඹුරට වතුර අරින්න.	After that, let the water into the field.
	ඊට පස්සේ කුඹුරුවලට වතුර අරින්න.	After that, let the water into the fields.
	ඊට පස්සේ නියරවල් බඳින්න.	After that, fix up the bunds.
	ඊට පස්සේ හොඳ දවසක් බලන්න.	After that, look into a good day.
	ඊට පස්සේ නැකැත් දවසක් බලන්න.	After that, look into an auspicious day.
8.	මේ වතුර එන්නේ ඔයකින්.	This water comes from an *oya*.
	මේ වතුර එන්නේ ඔයෙන්.	This water comes from the *oya*.
	මේ වතුර එන්නේ ගඟකින්.	This water comes from a river.
	මේ වතුර එන්නේ ගඟෙන්.	This water comes from the river.
	මේ වතුර එන්නේ මහවැලි ගඟෙන්.	This water comes from the Mahaveli Ganga.
	මේ වතුර එන්නේ වැවකින්.	This water comes from a tank.
	මේ වතුර එන්නේ වැවෙන්.	This water comes from the tank.
	මේ වතුර එන්නේ වැවකින් හරි ගඟකින් හරි.	This water comes from a tank or a river.
	මේ වතුර එන්නේ ගඟකින් හරි ඔයකින් හරි.	This water comes from a river or an *oya*.
	මේ වතුර එන්නේ ඔයකින් හරි වැවකින් හරි.	This water comes from an *oya* or a tank.
	මේ වතුර එන්නේ ගඟකින් හරි ඔයකින් හරි වැවකින් හරි.	This water comes from a river, an *oya*, or a tank.

PADDY CULTIVATION

9.	වතුර සුමානයක් කුඹුරේ තිබුනාට පස්සේ	After the water has been in the field a week,
	වතුර සුමාන දෙකක් කුඹුරේ තිබුනාට පස්සේ.	After the water has been in the field two weeks,
	වතුර සුමාන දෙකක් විතර කුඹුරේ තිබුනාට පස්සේ	After the water has been in the field for about two weeks,
10.	හාන්න පටන්ගන්න.	Begin to plow.
	හාන්න පටන්ගන්නවා.	They begin to plow.

287

PADDY CULTIVATION

TEXT I

GETTING THE FIELD READY FOR PLOWING

කුඹුරුවලට වතුර එවන්න ඉස්සරවෙලා නියරවල් හොඳට බඳිනවා.	Before sending the water into the fields, they fix up the bunds well.
ඊට පස්සේ කුඹුරුවලට වතුර එවනවා.	After that, they send the water into the fields.
මේ වතුර එන්නේ ඔයකින් හරි වැවකින් හරි ගඟකින් හරි.	This water comes from an oya, from a tank, or from a river.
වතුර සුමාන දෙකක් විතර කුඹුරුවල තිබුනාට පස්සේ හාන්න පටන්ගන්නවා.	When the water has been in the fields for about two weeks, they begin to plow.

NOTE TO THE STUDENT AND TO THE INSTRUCTOR:

This text (Text I) and the one which follows (Text II) should be practiced in class until students can repeat them with a fair degree of fluency and accuracy. Then books should be closed, and the instructor should provide an impromptu version of the information which has appeared. When the instructor has finished, students should give their own versions.

PADDY CULTIVATION

TEXT II

GETTING THE FIELD READY FOR PLOWING

හොඳ නැකැත් දවසක් බලලා	Having looked into a good, auspicious day,
කුඹුරට වතුර එවන්න.	Send the water into the field.
කුඹුරට වතුර එවන්න ඉස්සරවෙලා නියරවල් හොඳට බඳින්න.	Before sending the water into the field, fix up the bunds well.
මේ වතුර එන්නේ ඔයකින් හරි ගඟකින් හරි වැවකින් හරි.	This water comes from an oya, from a river or from a tank.
වතුර සුමාන දෙකක් විතර කුඹුරේ තිබුනාට පස්සේ හාන්න පටන්ගන්න.	When the water has been in the field for about two weeks, begin to plow.

VOCABULARY EXPANSION: QUESTIONS AND ANSWERS ABOUT THE TEXTS

The following questions and answers about the texts involve structures which are familiar and some new vocabulary. They should be practiced in class and then used to expand the discussion on paddy cultivation.

ඉස්සරින්	first
ඉස්සරින් මොනවා ද කරන්නේ?	What do you do first?
ඊ ළඟට	next
ඊ ළඟට මොනවා ද කරන්නේ?	What do you do next?

PART B

PADDY CULTIVATION

1.	නගුලකින් හානවා.	The plow with a plow.
	ට්‍රැක්ටර් එකකින් හානවා.	They plow with a tractor.
	මීහරක් බැඳපු නගුලකින් හානවා.	They plow with a buffalo drawn plow.
	හරකුන්ගෙන් මඩවනවා.	They muddy with buffaloes.
	උදැල්ලකින් කොටනවා.	They dig with a mamoty.
2.	ලොකු කුඹුරක් නම් ට්‍රැක්ටර් එකකින් හානවා.	If it is a big field, they plow with a tractor.
	නැත්නම් නගුලකින් හානවා.	Or, they plow with a plow.
	පොඩි කුඹුරක් නම් උදැල්ලකින් කොටනවා.	If it is a small field, they dig with a mamoty.
	කුඹුරු ලොකු නම් ට්‍රැක්ටර්වලින් හානවා.	If the fields are big, they plow with tractors.
	කුඹුරු ලොකු නම් නගුල්වලින් හානවා.	If the fields are big, they plow with plows.
3.	හාලා	After having plowed,
	නියරවල් බැඳලා	After having fixed the bunds,
	පෝරුගාලා	After having leveled,
	කුඹුරු පෝරුගාලා	After having leveled the fields,
	පෝරුලැල්ලකින් කුඹුරු පෝරුගාලා	After having leveled the fields, with a leveling board,
	කුඹුරු සමතලාකරලා	After having smoothed the fields,
	පෝර දාලා	After having put on fertilizer,

FIRST PLOWING

PADDY CULTIVATION

4.	කුඹුරු හානවා.	They plow the fields.
	කුඹුරු පෝරුගානවා.	They level the fields.
	පෝරුලෑලිවලින් කුඹුරු පෝරුගානවා.	They level the fields with leveling boards.
	කොළ පෝර දමනවා.	They put on green manures.
	රසායනික පෝර දමනවා.	They put on chemical fertilizer.
	දහයියා දමනවා.	They put on rice huskings.
5.	දැන් වී ඉහින්න කුඹුර ලෑස්තියි.	Now the field is ready for broadcasting paddy.
	දැන් වී වපුරන්න කුඹුර ලෑස්තියි.	Now the field is ready for sowing.
	දැන් පෝරුගාන්න කුඹුර ලෑස්තියි.	Now the field is ready for leveling.
	දැන් හාන්න කුඹුර ලෑස්තියි.	Now the field is ready for plowing.

PADDY CULTIVATION

TEXT III

PLOWING AND GRADING THE FIELD FOR SOWING - 1

කුඹුරු ලොකු නම් ට්‍රැක්ටර්වලින් හානවා.	If the fields are big, they plow with tractors.
නැත්නම් නඟුල්වලින් හානවා.	Otherwise, they plow with plows.
කුඹුරු කුඩා නම් උදලුවලින් කොටනවා.	If the fields are small, they dig with mamoties.
හාලා ඉවරවෙලා, පෝරුගානවා.	Having finished the plowing, they level.
පෝරු ලැල්ලකින් පෝරුගානවා.	They level with a leveling board.
සමහර අය ඒක වෙනුවට ගොයි ලැල්ල පාවිච්චි කරනවා.	Some people use the hand-held leveler instead.
ඊලඟට පෝර දමනවා.	Next, they put on fertilizer.
වැඩියම දමන්නේ දහයියායි, කොළ පෝරයි.	Mostly, they put on rice huskings and green manure.
සමහර මිනිස්සු හාන්න ඉස්සරවෙලා පෝර දමනවා.	Some people put on fertilizer before plowing.
දැන් වී ඉහින්න කුඹුර ලැස්තියි.	Now the field is ready for broadcasting the vii.

NOTE TO THE STUDENT AND TO THE INSTRUCTOR:

The material in this text and in all those which follow should be treated in the following way. First, the sentences should be practiced in class until students are sure of their meanings and can repeat them with a fair degree of fluency and accuracy. Then the texts should be read through slowly and carefully by the instructor so that students can get a sense of the sequence of the actions. Then students should interview the instructor, taking him or her through a particular cultivation process stage by stage, i.e., '(When you plow) what do you do first? What do you do next?' and so on. When the information has been gathered in this manner, each student should be able to give a complete version.

PADDY CULTIVATION

TEXT IV

PLOWING AND GRADING THE FIELD FOR SOWING - 2

කුඹුර ලොකු එකක් නම් ට්‍රැක්ටර් එකෙන් හානවා.	If the field is a big one, they plow with a tractor.
නැත්නම් නගුල්වලින් හානවා.	Otherwise, they plow with plows.
සමහර මිනිස්සු උදලුවලින් කොටනවා.	Some people dig with mamoties.
හාලා ඉවරවෙලා, ගල් එහෙම එකතුකරන්න පෝරුගානවා.	Having finished the plowing, they level to collect the rocks and such in the field.
පෝරු ලෑල්ලක් පාවිච්චි කරනවා.	They use a leveling board.
පෝරු ගාලා,	Having leveled,
පෝර දමනවා.	They put on fertilizer.
වැඩියම දමන්නේ කොළ පෝරයි, දහයියායි.	Mostly, they put on green manure and rice huskings.
සමහර මිනිස්සු රසායනික පෝර දමනවා.	Some people put on chemical fertilizer.
දැන් වී ඉහින්න කුඹුර ලෑස්තියි.	Now the field is ready for broadcasting the vii.

TRANSPLANTING SEEDLINGS

PADDY CULTIVATION
TEXT V
TENDING THE CROP - 1

වී වපුරන්න ඉස්සරවෙලා	Before broadcasting the paddy,
ඒවා පෙඟෙන්න දාලා	Having put them to soak,
ටික දවසක් තියෙන්න අරින්න.	Let (them) be a few days.
වී ඇට වැවෙනවා.	The paddy seeds will sprout.
දැන් මේ වී කුඹුරුවල ඉහින්න.	Now, sow this seed itself in the field.
සමහර පලාත්වල මේ ගොයම් පැලවෙනකොට	In some areas, when this rice grows,
උදුරලා හිටවනවා.	(They) uproot and transplant.
ගොයම් පැල කාලෙට	At the time of the small rice plants (i.e. when the rice plants are small)
හුඟක් වතුර තියෙන්න ඕනෑ.	There should be a lot of water.
ගොයම් අඩි දෙකක් විතර උස්වෙනකොට	When the rice plants get to a height of about two feet,
වල් උදුරන්න.	Take out the weeds.
නැත්නම් වල්නාශක බෙහෙත් ඉහින්න.	Or spray weedicide.
ගොයම්වල කෘමීන් ඉන්නවා නම්	If there are insects in the paddy,
කෘමිනාශක බෙහෙත් ඉහින්න ඕනෑ.	You need to spray insecticide.

PADDY CULTIVATION

TEXT VI

HARVESTING THE CROP

ගොයම් පැහුනාට පස්සේ	When the paddy gets ripe,
කපන්න ඕනෑ.	You need to cut it.
මේක කරන්නේ මිනිස්සු ටික දෙනෙක් එකතුකරගෙන.	You do this, having collected a few people.
දෑකැති අරන්	Having taken sickles,
කුඹුරේ එක පැත්තක ඉඳලා අනික් පැත්තට කපාගෙන යනවා.	Go from one side of the field to the other cutting.
කපලා ගොයම් එකතුකරලා මිටි බඳින්න.	After cutting, collect the paddy and tie it into bundles.
මේ මිටි බැඳපු ගොයම් කමතට ගෙනියන්න.	Take these bundles of tied paddy to the threshing floor.

(above and opposite) CUTTING THE RIPENED PADDY

PADDY CULTIVATION

TEXT VII

THRESHING

ඉස්සරින්, ගොයම් කමතට අරන් යන්න.	First, take the paddy to the threshing floor.
ඊ ලඟට, කමතේ මැද ගොඩ ගහන්න.	Next, stack the paddy in the center of the threshing floor.

ඊ ළඟට ගොඩ කඩලා.	Next, break the stack (having broken the stack)
කොළ කමතේ තුනී කරන්න.	And spread the stalks on the threshing floor.
දැන්, මීහරක් වටේට දක්කලා , කොළ මඩින්න.	Now, drive the buffaloes round, and trample the stalks.
මීහරක් කොළ පාගනකොට,	When the buffaloes are threshing (trampling) the stalks,
උකුණ ගහක් අරන්,	Having taken a threshing tool,
ඒවා හොල්ලන්න.	Shake them up.
වීවලින් පිදුරු වෙන්කරන්නේ මෙහෙමයි.	This is how you separate the straw from the unhusked rice.
ඊ ළඟට, වී හුලං කරන්න.	Next, winnow the unhusked rice.
වී හුලං කරලා, ගෝනිවලට දමන්න.	Having winnowed the unhusked rice, put it into gunny sacks.
ගෝනිවලට දමලා, ගෙදර ගෙනියන්න.	Having put it into gunny sacks, take it to the house.
කමතේ වැඩ කරන කොට, වී කියලා වචනේ කියන්න එපා.	When you are working at the threshing floor, don't say the word 'unhusked rice.'
ඒක වෙනුවට බැත කියලා කියන්න.	Say baeta instead.

NOTE ON STRUCTURE: vocabulary

The vocabulary pertaining to the cultivation of paddy constitutes an extensive technical lexicon, and only a portion of it has been presented here. In addition many of the terms pertaining to tasks that everyone everywhere performs vary from region to region. Moreover, paddy cultivation is conducted in a variety of ecological niches, under various systems of land tenure and with various types of labor organization. These variations necessarily expand the list of words necessary to deal with this topic completely and accurately. When Europeans first came to Sri Lanka and began to study paddy cultivation practices, they noted that this lexicon was further expanded by a 'secret' language used at the time of harvest. However extensive this specialized vocabulary may have been at one time, it is now confined to a few words such as බැත above.

BAGGING UNHUSKED RICE AT THE THRESHING FLOOR

PADDY CULTIVATION
SUMMARY VOCABULARY

Words marked with * are supplementary to those which appear in the preceding texts. () = plural or past.

1. Cultivation tools

පෝරු ලෑල්ල (ලෑලි)	harrowing board (leveling board)	දෑකැත්ත (දෑකැති)	sickle
උදැල්ල (උදලු)	mamoty	උකුණ ගහ (ගස්)	threshing tool
නගුල (නගුල්)	plow	ට්‍රැක්ටර් එක (ට්‍රැක්ටර්)	tractor

2. Cultivation processes

කොටනවා (කෙටුවා)	dig	හොල්ලනවා (හෙල්ලුවා)	shake
වවනවා (වැවුවා)	grow (cultivate)	සමතලා කරනවා (කෙරුවා)	smooth
වැවෙනවා (වැවුනා)	grow (sprout)	වපුරනවා (වැපුරුවා) ඉහිනවා (ඉස්සා)	sow
පෝරු ගානවා (ගෑවා)	harrow, level	තුනී කරනවා (කෙරුවා)	spread
මඩවනවා (මැඩෙව්වා)	muddy	ඉහිනවා (ඉස්සා)	spray
හිටවනවා (හිටෙව්වා)	plant	ගොඩ ගහනවා (ගැහැව්වා)	stack
හානවා (හෑවා)	plow	මඩිනවා (මැඩ්ඩා) පාගනවා (පෑගුවා)	thresh
පැහෙනවා (පැහුනා)	ripen	උදුරනවා (ඉදිරුවා)	uproot
වෙන්කරනවා (කෙරුවා)	separate	හුලං කරනවා (කෙරුවා) * පොළනවා (පෙළුවා)	winnow

3. Words for paddy at various stages of cultivation and processing.

* ගොයම් පැලේ (පැල)	young paddy	වී	(pl.)	unhusked rice
* පැහිච්ච ගොයම් (pl.)	ripened plant	* හාල්	(pl.)	husked rice
* වී කරල (කරල්)	paddy ear	* බත්	(pl.)	cooked rice

Note: In addition to these words there are about eight named stages of growth distinguished by cultivators. The precise terms vary somewhat from region to region.

A TANK IN THE DRY ZONE

PADDY CULTIVATION
SUMMARY VOCABULARY

4. Topical features

ඔය (ඔයවල්)	brook	වැව (වැව්)	tank
නියර (නියරවල්)	bund	* ලියැද්ද (ලියැදි)	terrace
කුඹුර (කුඹුරු)	field	කමත (කමත්)	threshing floor
ගඟ (ගං)	river		

5. Miscellaneous

මිටිය (මිටි)	bundle	කෘමිනාශක බෙහෙත්	insecticide
පෝර	fertilizer	දහයියා	rice huskings
රසායනික පෝර	fertilizer, chemical	පිදුරු	straw
කොළ පෝර	fertilizer, green	වල්නාශක බෙහෙත්	weedicide
කෘමියා (කෘමීන්)	insect	වල්	weeds

PADDY CULTIVATION

SUMMARY EXERCISE -- FINDING OUT ABOUT SOMETHING NEW

On the opposite page there is a picture of an activity associated with harvesting which has not been previously described in the lessons. Students should use the Sinhala they have learned to interview the instructor about the picture. What are these two people doing? What do they have in their hands? What is that machine on the left hand side? What do they use it for? Do all cultivators in Sri Lanka have such machines? If they don't, what do they use instead?

TRAVELING BY RAIL AND AIR

CYCLE 86

AT WHAT TIME DOES THE PLANE GOING TO MADRAS LEAVE?


AIR CEYLON
LONDON
ROME
KARACHI
COLOMBO
KUALA LUMPUR
SINGAPORE
SAPPHIRE JET SERVICE

M-1

මදුරාසියට යන අහස්යත්‍රාව පිටත් වෙන්නේ දවිල් තුනයි තිහට.	The plane going to Madras leaves at 3:30 in the afternoon.
කොළඹට යන අහස්යත්‍රාව පිටත් වෙන්නේ එකොළහයි තිස් පහට.	The plane going to Colombo leaves at 11:35.

M-2

මදුරාසියට යන අහස්යත්‍රාව කොළඹින් පිටත් වෙන්නේ කීයට ද?	At what time does the plane going to Madras leave Colombo?
යාපනේට යන අහස්යත්‍රාව කොළඹින් පිටත් වෙන්නේ කීයට ද?	At what time does the plane going to Jaffna leave Colombo?

C-1

Students should use the formulas given above to discuss the information given on the air timetable below.

A. මදුරාසියට යන අහස්යත්‍රාව පිටත් වෙන්නේ කීයට ද?

B. දවල් තුනයි තිහට.

TRAVELING BY RAIL AND AIR

INTERNATIONAL, REGIONAL AND DOMESTIC AIR SERVICES



U.K. — EUROPE — MIDDLE EAST — FAR EAST — CEYLON — MALAYSIA — AUSTRALIA

AIR CEYLON (AE) BOAC—BRITISH OVERSEAS AIRWAYS CORPORATION (BA) QANTAS AIRWAYS (QF)—
VC–BAC Super VC-10 (except AE 118/116 & BA 797–BAC VC-10); B7–Boeing 707

▣○ ⑦	▣○ ③	▣○ ④	▣○ ①		▣–▣ 30 kg.; ○ 20 kg. provided as shown		▣○ ②	▣○ ③	▣○ ④	▣○ ⑦
BA 780 VC	AE 118 VC	BA 796 VC	QF 738 B7		Effective April 1st		QF 731 B7	BA 789 VC	BA 797 VC	AE 117 VC
×	×	×	×				×	×	×	×
20 15	19 45	14 45	17 30	dep	LONDON, Heathrow	arr	09 35	19 35	19 35	20 00
